

වාර්ෂික වාර්තාව

2016

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය



ලිපිනය

විද්‍යා මාවත,

කොළඹ 07

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

0112136222 / 2670002 / 117

පටුන

1		හැඳින්වීම	**1**
	1.1	ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව	**1**
	1.2	ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා	**2**
2		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්	**3**
	2.1	දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ	**3**
	2.2	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්	**3**
	2.3	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය	**4**
	2.4	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීම්.	**4**
	2.4.1	කාර්යය මණ්ඩලය බඳවා ගැනීම්	**4**
	2.4.2	දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක	**6**
	2.5	2016 වර්ෂයේ ඇති වූ ආපදා තත්වයන් පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රකාශය	**6**
	2.5.1	ආපදාවල බලපෑම් විශ්ලේෂණය - 2016	**6**
	i	සමස්ත බලපෑම - 2016	**6**
	ii	නිවාස හානි - 2016	**7**
	iii	එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස - 2016	**8**
	iv	මරණ / අතුරුදන්වීම් සහ තුවාල	**8**
	v	ආපදා තත්වයන්හි බලපෑම දිස්ත්‍රික්ක අනුව - 2016	**9**
	vi	ආපදාවල බලපෑමේ සාරාංශය - 2016	**10**
3		ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්	**10**
	3.1	ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම	**10**
	3.2	ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම	**10**
	3.3	ආයතනික ආපදා පෙර සූදානම් සැලැස්ම (IDMP)	**11**
	3.4	අන්තර්කාලීන කළමනාකරණ කමිටුව	**11**
	3.5	විගණන සහ කළමනාකරණ කමිටුව	**11**
	3.6	ජාතික සුරක්ෂිත දිනය - 2016	**12**
	3.7	ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව	**12**
	3.8	හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව	**13**
	3.9	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය	**13**
	3.10	**Desinventor** දත්ත ගබඩාව	**13**
4		ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය	**14**

4.1		දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීම	14
4.2		දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය	18
4.3		ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය	18
4.4		**Desinventor** දත්ත ගබඩාව	19
4.5		ආපදා අවම කිරීමේ සංවර්ධනයන් ප්‍රධාන ප්‍රවාහය තුළට අනුගත කිරීම	19
5		පෙර සූදානම් හා සැලසුම් අංශය	19
5.1		හැඳින්වීම	19
5.2		දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම	22
5.3		ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමේ ප්‍රජා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම	23
5.4		ජාතික / දිස්ත්‍රික් / ප්‍රාදේශීය මට්ටමේ පෙරහුරු වැඩසටහන්	24
5.5		ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමේ පෙරහුරු වැඩසටහන්	24
5.6		විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සූදානම් කටයුතු	25
5.7		රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම	26
5.8		මෝසම් පෙර සූදානම් සැලසුම්	26
5.9		රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම	26
5.10		පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්	27
5.11		2016 වර්ෂයේදී සිදුකරන ලද අනෙකුත් පෙර සූදානම් ක්‍රියාකාරකම්	27
	5.11.1	බදුල්ල දිස්ත්‍රික් ආපදා අවදානම් සිතියම් හා පස් අවුරුදු උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම	27
	5.11.2	නිපොන්මාරු වැඩසටහන - 2016	27
6		දැනුවත් කිරීමේ අංශය	28
6.1		ජාතික මට්ටමේ වැඩසටහන්	29
6.2		දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන්	30
7		හදිසි මෙහෙයුම් අංශය	32
7.1		පසු ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය	34
7.2		පූර්ව දැනුම්දීම්	37
8		2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය	41
9		2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	63
10		2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව වෙනුවෙන් වූ පිළිතුරු වාර්තාව	79

වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාල සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාවේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතෙහි 13වන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමේ සහ ක්‍රමෝපායික මහපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සහ ඒ සඳහා මහපෙන්වීම ලබාදීම සිදුකරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්යරාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත්විය.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වනුයේ ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන හා එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් පවරා ඇති පරිදි ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාව 2005 වසරේදී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අගමැතිතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයන් භාරව සිටින අමාත්‍යවරුන්, පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමකි. (සටහන 1.1)



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළං
- ගංවතුර
- නියඟය
- කාර්මික ආපදාවන්
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- මුහුදු උවදුරු
- ගිනි
- වසංගත
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ ඛාදනය
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි ගිගුරුම් සහිත කුණාටු

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නායකත්වය යටතේ අංශ පහකින් සමන්විතව රටේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම වේ. ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත දැක්වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
4. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
5. මානව සම්පත් හා මූල්‍ය අංශය

මෙම ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රටතුළ ක්‍රියාත්මක කෙරේ.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

I. දැක්ම

ශ්‍රී ලංකාවේ සුරක්ෂිත ප්‍රජාවක් ස්ථාපිත කිරීම තුළින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම.

II. මෙහෙවර

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ආපදා ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

III. අභිමතාර්ථ

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයක් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති කාර්යයන්.

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මක් සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.
- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.
- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා ප්‍රතිචාර දැක්වීමට පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් සිදුකිරීම සහ ඒවා ප්‍රචාරය කිරීම.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෝදිසි සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.

- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අඩු කිරීම සඳහා සංවර්ධන ක්‍රියාවලියට අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- නිසි කලට තම වගකීම් ඉටුකරන බවට වගබලා ගැනීම සඳහා ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

2.1 සටහනෙහි දක්වා ඇති පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විවිධ වැඩසටහන් සැළකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන **2.1:** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවිධාන ව්‍යුහය

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්.

2.4.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව බඳවා ගැනීම් පටිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කර ඇති අතර වසර අවසාන වන විට ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික්ක මට්ටමේ තිබූ පුරප්පාඩුවලින් **8.7%**ක් බඳවා ගනු ලැබීය. ඇතැම් තනතුරුවලට අදාළව ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් මූලික සුදුසුකම් සම්බන්ධව ඇති ගැටළුකාරී තත්වයන්

හේතුකොටගෙන තනතුරු පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. ඉහත ගැටළු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවදානයට යොමු කර ඇත. පහත **2.1** වගුවෙන් **2016** වසරේ පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාවත් **2.2** වගුවෙන් අනුමත කරන ලද සම්පූර්ණ සේවක සංඛ්‍යාවත්, පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාවත් **2016-12-31** වන විට තිබූ පුරප්පාඩු සංඛ්‍යාවත් දක්වා ඇත.

තනතුර	සංඛ්‍යාව
ගිණුම් නිලධාරී	**01**
කළමනාකරණ සහකාර	**03**
රියදුරු	**02**
කාර්යාල සහායක	**04**

වගුව **2.1: 2016** වසර තුළදී පුරවන ලද පුරප්පාඩු

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	**1**	**1**	**0**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	**1**	**1**	**0**
අධ්‍යක්ෂ	**6**	**3**	**3**
අභ්‍යන්තර විගණක	**1**	**1**	**0**
නියෝජ්‍ය අධ්‍යක්ෂ	**18**	**0**	**18**
සහකාර අධ්‍යක්ෂ	**15**	**13**	**2**
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	**25**	**18**	**7**
ගිණුම් නිලධාරී	**1**	**1**	**0**
පරිපාලන නිලධාරී	**1**	**1**	**0**
පුද්ගලික සහකාර	**1**	**0**	**1**
විමර්ශන නිලධාරී	**1**	**0**	**1**
දුර දැනීම/භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	**1**	**0**	**1**
දත්ත පද්ධති විශ්ලේෂක	**1**	**0**	**1**
පුස්තකාලයාධිපති	**1**	**0**	**1**
සංවර්ධන සහකාර	**1**	**1**	**0**
භාෂා පරිවර්තක	**2**	**0**	**2**
තොරතුරු තාක්ෂණ සහකාර	**6**	**0**	**6**
චලන හා නිශ්චල කැමරා ශිල්පී	**1**	**0**	**1**
සන්නිවේදන කාර්මික ශිල්පී	**3**	**0**	**3**
ගුවන් විදුලි ක්‍රියාකරු	**1**	**0**	**1**
කළමනාකරණ සහකාර /ආපදා කළමනාකරණ සහකාර	**182**	**145**	**37**
රියදුරු	**39**	**35**	**4**
කාර්යාල සහායක	**35**	**10**	**25**
එකතුව	**344**	**230**	**114**

වගුව **2.2: 2016-12-31** වන විට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික්ක විසිපහ තුළ පිහිටුවා ඇත. සෑම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයකම සහකාර අධ්‍යක්ෂවරයෙක් රාජකාරී කරන අතර (දිස්ත්‍රික්) සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරයෙක්ගෙන් සමන්විත වේ. යම්කිසි දිස්ත්‍රික්කයක් ආපදාවට ලක්වීමට ඇති හැකියාවේ අඩු වැඩිකම මත දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වේ. සහකාර අධ්‍යක්ෂවරු (දිස්ත්‍රික්) විසිපස් දෙනෙකුගෙන් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරු සිය දෙනෙකුගෙන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සමන්විත වේ.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ පුත්තලම යන දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලට හමුදාවේ සහ ගුවන් හමුදාවේ 132ක් අනුයුක්ත කර ඇත. කළුතර දිස්ත්‍රික්කය හැර අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා තිබෙන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ වේ. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය පහත 2.2 රූප සටහනෙහි දක්වා ඇත.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

2.5 2016 වර්ෂයේ ඇතිවූ ආපදා තත්වයන් පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

2.5.1 ආපදාවල බලපෑම විශ්ලේෂණය - 2016

i. සමස්ත බලපෑම- 2016

ගංවතුර, නායයෑම්, දැඩි සුළං සහ අකුණු නිසා බලපෑමට ලක්වූ මුළු ජනගහනය ආසන්න වශයෙන් 1,525,196ක් පමණ වේ. පසුගිය 2015 වසර සමඟ සන්සන්දනාත්මකව බැලීමේදී මෙහි වැඩිවීමක්

දක්නට ලැබේ. මරණයට පත්වූ සහ තුවාල ලැබූ සංඛ්‍යාව පිළිවෙලින් 140ක් සහ 70ක් වේ. තවද 2015 සමඟ සන්සන්දනය කිරීමේදී හානියට පත්වූ සහ විනාශයට පත්වූ නිවාස සංඛ්‍යාව සුළු ප්‍රමාණයකින් වැඩි වී ඇත.

ආපදාව	වසර		
	2014	2015	2016
මරණ / අතුරුදහන්වීම්	154	123	262
තුවාල	80	69	70
ආපදාවට ලක් වූ සංඛ්‍යාව	2,702,545	535,744	1,525,196
නිවාස (පූර්ණ හානි)	5,312	685	791
නිවාස (අර්ධ හානි)	19,495	6,438	6,934

වගුව 2.3: සමස්ත බලපෑම





ii. නිවාස හානි

2016 මැයි මාසය තුළ හානියට පත් වූ හා විනාශ වූ වැඩිම නිවාස ගණන වාර්තා වී ඇත. එය නිවාස 5776 කි. නායයෑම් හා ගංවතුර හේතුවෙන් වැඩිම හානිය වාර්තා වී ඇත. එම හානියට පත්වී ඇති වැඩිම නිවාස වාර්තා වන්නේ කෑගල්ල දිස්ත්‍රික්කයෙනි. එනම්, නායයෑම් හේතුවෙන් නිවාස 1900කට හානි වී ඇත.

කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්කවලින් ද සැලකිය යුතු වැඩිම හානියක් වාර්තා වී ඇත.





iii. එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස - 2016



නිවාස 791ක් පමණ විනාශ වූ අතර නිවාස 6934කට වැඩි ප්‍රමාණයක් හානියට පත්විය. වැඩිම හානිය සිදු වී ඇත්තේ ගංවතුර හේතුවෙනි. නායයෑම් හේතුවෙන් සිදු වී ඇති නිවාස හානිය 2016 වසරේ දී සැළකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරයි.

ආපදාව	2015		2016	
	පූර්ණ හානි	අර්ධ හානි	පූර්ණ හානි	අර්ධ හානි
නායයෑම්/කණ්ඩි කඩා වැටීම්	44	207	274	2367
ගංවතුර	431	5112	385	2549
අකුණු	1	31	6	25
දැඩි සුළං/කුණාටු	99	925	59	1838

වගුව 2.4: එක් එක් ආපදාවල බලපෑමෙන් විනාශ වූ / හානි වූ නිවාස

iv. මරණ, අතුරුදහන්වීම් සහ තුවාල



මැයි මාසය තුළ වැඩිම මරණ හා අතුරුදන් වීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. එයට හේතුව වී ඇත්තේ නායයෑම් හා ගංවතුර ආපදාවන්ය.

නායයෑම් නිසා වැඩිම මරණ හා අතුරුදන් වීම් සංඛ්‍යාව කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර ගම්පහ, කොළඹ, පුත්තලම, කුරුණෑගල යන දිස්ත්‍රික්කවලින් ගංවතුර ආපදා හේතුවෙන් වැඩිම අතුරුදන් වීම් වාර්තා වී ඇත.

වැඩිම තුවාල සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ මැයි මාසය තුළ වන අතර එයද නායයෑම් හා ගංවතුර ආපදා හේතුවෙන් සිදු වී ඇත.



2016 වසරේ අතුරුදහන්වූ සහ මරණයට පත්වූ සංඛ්‍යාව 140ක් වන අතර එයින් 77%ක් පමණ නායයෑම් නිසා සිදුවී තිබේ. දෙවැනි වැඩිම මරණ සංඛ්‍යාව ඇති වී තිබෙන්නේ ගංවතුර මඟිනි. අකුණු ගැසීම්, සුළි සුළං හේතුවෙන් සිදුවී ඇති මරණ සංඛ්‍යාව 13%ක් පමණ වන අතර මෙය සාපේක්ෂව අඩු වීමකි.

v. ආපදා තත්ත්වයන්හි බලපෑම දිස්ත්‍රික්ක අනුව - 2016



2016 මැයි මාසය තුළ බලපෑ ගංවතුර තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් වූ ජනගහනයෙන් ඉහළම සංඛ්‍යාව වාර්තා වන්නේ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලිනි. එමෙන්ම පොළොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවලට ද බලපෑම් ඇතිවී ඇත.

ප්‍රධාන වශයෙන් 2016 වර්ෂයේදී ගංවතුර සහ නියඟය හේතුවෙන් දිස්ත්‍රික්ක රැසකට තද බලපෑම් සිදුවී ඇති අතර කැලෑගිනි, නායයෑම්, දැඩි සුළං තත්ත්වයන්ද සැලකිය යුතුවේ.

ආපදාව	2015	2016	වෙනස
නායයෑම් / කණ්ඩි කඩාවැටීම්	9	193	184
ගංවතුර	16	26	10
අකුණු	23	9	-14
දැඩි සුළං/කුණාටු	0	4	4
දියේ ගිලීම්	42	18	-24
එකතුව	90	250	160

වගුව 2.5: 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ ආපදා තත්වයේ බලපෑම

a. පීඩාවට පත්වූ ජන සංඛ්‍යාව - 2016

ආපදාව	2015	2016	වෙනස
නායයෑම් / කණ්ඩි කඩාවැටීම්	1,469	42,311	40,842
නියඟය	258,096	1,025,839	767,743
දියේ ගිලීම්	42	14	-28
ගංවතුර	270,840	448,833	177,993
අකුණු	188	154	-□4
දැඩි සුළං / කුණාටු	3,987	7,076	3,089
එකතුව	534,622	1,526,243	989,635

වගුව 2.6: පීඩාවට පත් ජන සංඛ්‍යාව

පීඩාවට පත්වූ ජනගහනයෙන් 67% ක් පමණ නියඟය හේතුවෙන් පීඩාවට පත්ව ඇති අතර 29%ක් පමණ ගංවතුර හේතුවෙන් පීඩාවට පත්ව ඇත. නියඟය හේතුවෙන් වැඩිම පීඩාවට පත් ජනගහනය පොළොන්නරුව හා මොණරාගල දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇති අතර ගංවතුර හේතුවෙන් වැඩිම පීඩාවට පත් ජනගහනය වාර්තා වන්නේ කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවලිනි.

අනෙකුත් ව්‍යසන නිසා ජනතාවට සිදුවී ඇති හානිය සාපේක්ෂ වශයෙන් නොසළකා හැරිය හැකිය. ගංවතුර, නායයෑම්, නියඟය සහ දැඩි සුළං මගින් ජනතාවට වූ පීඩාව 2015ට සාපේක්ෂව විශාල වශයෙන් වැඩි වී ඇත. නමුත්, අකුණුසැර හා දියේ ගිලීම් නිසා පීඩාවට පත් වූ ජනගහනය අඩු වී ඇත.



vi. ආපදාවල බලපෑමේ සාරාංශය- 2016

- 2016 වසර තුළ වැඩි වශයෙන් පීඩාවට පත්වූ ජනතාව සිටින දිස්ත්‍රික්ක ලෙස කොළඹ, ගම්පහ සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.
- ජනතාවට සැළකිය යුතු බලපෑමක් ඇතිවූ අනෙකුත් දිස්ත්‍රික්ක ලෙස කෑගල්ල, කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.
- සමස්තයක් ලෙස 2016 වසරේදී ගංවතුර හේතුවෙන් දිස්ත්‍රික්ක 22කට බලපෑම් සිදු වී ඇති අතර නියඟය හේතුවෙන් දිස්ත්‍රික්ක 23කට බලපෑම් සිදු වී ඇත.

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම.

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කාර්යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසන් කර ඇති අතර එම සංශෝධිත පනත් කෙටුම්පත නීතිපති අනුමැතිය සඳහා යොමුකර ඇත.

3.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (ජා.හ.අ.මෙ.සැ.)

ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව 2005 අංක 13 දරන ව්‍යසන ජා.හ.අ.මෙ.සැ. මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාලගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. ජා.හ.අ.මෙ.සැ. පරිශීලනය කිරීමේ පහසුව සඳහා

ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම 1-වෙළුම සහ 2-වෙළුම ලෙස වෙළුම් දෙකකින් භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලදී. කිසියම් ආයතනයක සක්‍යතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය ජා.හ.අ.මෙ.සැ. 1-වෙළුම මඟින්ද, ආයතනික වගකීම් හා කාර්ය භාරය, ජා.හ.අ.මෙ.සැ. 2-වෙළුම මඟින්ද, විස්තර කර ඇත.

භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජා.හ.අ.මෙ.සැ. සඳහා, ඉදිරියේදී ආපදා කළමනාකරණය ජාතික සභාවෙහි අනුමැතිය ලබා ගන්නා තෙක් ජා.හ.අ.මෙ.සැ. 1-වෙළුම හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරන කටයුතු සඳහා අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ එකඟතාවය ලබා දී ඇත.

3.3 ආයතනික ආපදා පෙර සූදානම් සැලැස්ම (IDMP)

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආයතනික පෙර සූදානම් සැලැස්ම සකස් කිරීමේ මාර්ගෝපදේශ සකස්කර ඇත. එම මාර්ගෝපදේශය ආයතන සඳහා ක්‍රියාවට නැංවීමෙන් පසුව මතුවන ගැටළු හා දුර්වලතා හැඳින ගැනීමටත් ඒ අනුව මාර්ගෝපදේශය ප්‍රතිශෝධනය කිරීමටත් සැලසුම්කර ඇත.

3.4 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණමය කටයුතු සම්බන්ධව තීරණ ගැනීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2016 වර්ෂය තුළදී රැස්වීම්වාර 10ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

1) ලේකම් , ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සභාපති
2) මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - නියෝජිත-සාමාජික
3) ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය - නියෝජිත - සාමාජික
4) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය - නියෝජිත- සාමාජික
5) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - සාමාජික
6) ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සාමාජික
7) අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

3.5 විගණන සහ කළමනාකරණ කමිටුව

2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය පහත දැක්වේ.

ඒ.වී. ජනාදර මහතා (සභාපති)	-	අධ්‍යක්ෂ, භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය
ජී.එල්.එස්. සේනාධීර මහතා (සාමාජික)	-	අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා (සාමාජික)	-	ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
කේ.ඒ. සුභද්‍රා වල්පොල මහත්මිය (සාමාජික)	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
ඒ.බී.ආර්. අමරකෝන් මහත්මිය (නිරීක්ෂක)	-	විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව
කේ.ඒ. නිශාන්ත මහතා (සාමාජික)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍ය (රා.ඉ.) ,ආ.ක.ම.
ජේ.එච්.පී. ජයලත් මහතා (සාමාජික)	-	අභ්‍යන්තර විගණක, ආ.ක.ම.

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කරන විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව කරුණු මෙහිදී සාකච්ඡාවට භාජනය කරයි. එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කරගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳවද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලයි. පසුව මෙම කරුණු පිළිබඳව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් මධ්‍යස්ථානයේ පැවැත්වෙන කාර්යය මණ්ඩල රැස්වීම්වලදී මෙම කරුණුවලට අදාළ ප්‍රගතිය පිළිබඳව නැවත සාකච්ඡාවට බඳුන්කරයි. 2016 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කර ඇත.

3.6 ජාතික සුරක්ෂිත දිනය - 2016

2016 වර්ෂයේ ජාතික සුරක්ෂිත දිනය වෙනුවෙන් දිස්ත්‍රික් 25 තුළ මහජනතාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් 2016 ඔක්තෝම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක කළ අතර දිස්ත්‍රික් 25 තුළ ආපදා බහුල ප්‍රජාවන් හට ප්‍රමුඛත්වය දෙමින් ආපදා කළමනාකරණය පිළිබඳ විශේෂඥ දැනුම ඇති තාක්ෂණික ආයතනවල සහභාගීත්වයෙන් මෙම දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඊට අමතරව දිස්ත්‍රික් 25 තුළ ආපදාවලින් මියගිය ජනතාව සිහිපත් කිරීම සඳහා සර්ව ආගමික වැඩසටහන්ද සියලු දිස්ත්‍රික්වල මහජනතාවගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සර්ව ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

3.7 ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව (NDMCC) පිහිටුවා ඇත. මෙම කමිටුවේ සභාපතිත්වය ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් උසුලන අතර අමාත්‍යාංශ නියෝජිතයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, ත්‍රිවිධ හමුදා, පොලිස් බලකාය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින්ගේ ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම් පවත්වනු ලබයි. ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක (NDMCC)යේ පරමාර්ථය

වන්නේ ආපදාවන්ගේ බලපෑම් අඩුකිරීම සහ ආපදා ප්‍රත්‍යාස්ථ සමාජයක් සඳහා ජාතික උත්සාහයක් ගැනීමටයි. එමෙන්ම,

- තොරතුරු බෙදාහැරීම සහ හුවමාරු කරගැනීම සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී ආයතනයක් ඇතිකිරීම.
- ආපදා අවදානම් අඩු කිරීමේ ක්‍රමවේද සහ උපාය මාර්ග පිළිබඳ උගත් පාඩම් සම්බන්ධ පහසුකම් සැපයීම.
- ආපදා අවදානම් කළමනාකරණ කටයුතු සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා සියලුම ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාකරුවන් අතර සම්බන්ධීකරණයක් තබා ගැනීම.

<u>2007 වර්ෂයේ ආයතන 6ක් නියෝජනය කරමින් සමාජිකයන් 14 දෙනෙකුගෙන් ආරම්භ කරන ලද මෙම කමිටුව, වර්තමානය වන විට ආයතන 80ක නියෝජිතයින්ගෙන් සමන්විත වේ.</u>

3.8 හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව (හ.අ.ප්‍ර.ක)

අත්‍යාවශ්‍ය සේවාවන්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දක්වන පාර්ශව කණ්ඩායම් ආපදා අවස්ථාවකදී අදාළ ආයතන සමඟ සම්බන්ධ වී සම්පත් යෙදවිය හැකි හා හදිසි ප්‍රතිචාර කටයුතු කිරීම සෘජුවම සම්බන්ධ පාර්ශවකාර ආයතනවලින් හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව සමන්විත වේ. 2016 වර්ෂය තුළ ජාතික මට්ටමින් සිදුවූ විශාල ආපදා අවස්ථා දෙකකදී අදාළ සහය හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව මඟින් ලබා දීමට ක්‍රියා කරන ලදි. ඒ අනුව 2016 කැගල්ල දිස්ත්‍රික්කයේ සිදුවූ විශාල නායයෑම්වලදී අදාළ සහයෝගය ලබාදීමට අවශ්‍ය කටයුතු ඉටු කරන ලද අතර හා විපතට පත්වූවන්ට සහනාධාර ලබාදීමේ කටයුතු දින ගණනාවක් පුරාවට ඉටු කරන ලදි.

3.9 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය ***www.dmc.gov.lk*** යථාවත් කිරීම හා නඩත්තු කිරීම මෙම අංශයේ කාර්යභාරය වන අතර 2016 වසරේදී ආයතනයේ සිදුවූ ප්‍රධානම සිදුවීම් සියල්ල වෙබ් අඩවියට යොමුකොට ඇති අතර සියලු ආපදාවන්ට සම්බන්ධ තත්ත්ව වාර්තා දෛනිකව වෙබ් අඩවිය වෙත යොමු කරනු ලැබේ.

3.10 Desinventor දත්ත ගබඩාව

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව ***www.desinventor.lk*** ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හා ආපදාවන් යටතේ කාලවකවානුවට අනුරූපීව මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපල පිළිබඳ තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි මෙහෙයුම් අංශයෙන් දෛනිකව නිකුත් කරනු ලබන තත්ත්ව වාර්තාවලින් ලබාගන්නා තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. 1974 – 2016 දක්වා ආපදා සම්බන්ධ මූලික තොරතුරු ඇතුළත් කොට ඇත. 2012- 2016 වසරවලදී සිද්ධීන් හා දත්ත ප්‍රමාණයන් පහත වගුවේ ඇතුළත් කොට ඇත.

වසර	ආපදා සිද්ධීන් (වර්ග)	දත්ත ප්‍රමාණය
2012	**16**	**512**
2013	**16**	**456**

2014	**13**	**456**
2015	***19***	**727**
2016	**12**	**686**

වගුව **3.1:** Desinventor දත්ත

04. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

2004 වසරේ ඇතිවූ බිහිසුණු සුනාමි ව්‍යසනයෙන් පසු ප්‍රතිචාර තත්ත්වයෙන් මිදී පූර්ව ආපදා කළමනාකරණයට මුල්තැන දෙමින් ස්ථාපිත කරන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා අවම කිරීම්, පර්යේෂණ සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය ආපදා අවදානම් තක්සේරුව, ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම, ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම තුළින් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් හා තිරසාර සංවර්ධනයක් යන ඉලක්ක සපුරාගැනීමට ක්‍රියාකිරීම වේ.

4.1 දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවම කිරීම

2015 වසර තුළදී සිදුවූ ආපදාවන්ගේ සංඛ්‍යාත්මකව සිදුවූ හානි පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීමේදී වඩාත් වැඩි අවදානමකට ලක්වන්නේ යටිතල පහසුකම් බවද ජීවිත අහිමි වීම පහළ මට්ටමක පැවතියද ආපදා හේතුවෙන් යටිතල පහසුකම්වලට සිදුවන හානිය දිනෙන් දින ඉහළ යන බවද හෙලිවේ. **(වගුව4.1)**

Desinventor දත්ත

ආපදා (සිද්ධීන්)	සිද්ධීන් ගණන (2015)	මරණ	නිවාස හානි
ගංවතුර	**285**	**15**	**5543**
නියඟය	**45**	**0**	පීඩාවට පත්වූවන් සංඛ්‍යාව - **258,096**
තදසුළං	**98**	**0**	**999**
නායයෑම්	**35**	**7**	**161**

වගුව **4.1: 2015** වසර තුළදී සිදුවූ ආපදාවන්ගේ සංඛ්‍යාත්මක සිදුවූ හානි පිළිබඳ තොරතුරු

මෙම කරුණු සැලකිල්ලට ගෙන ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සැලකිල්ලට ගැනීමෙන් පසු ආපදා අවම කිරීම් අංශය වෙත රු.මිලියන **500**ක් **2016** වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරයෙන් අනුමත කොට ඇත. **(වගුව 4.2)**

වසර	වෙන්කරන ලද මුදල (රු.මිලියන)
2011	**114**
2012	**122**
2013	**274**
2014	**500**
2015	**500**
2016	**500**

වගුව **4.2:** එක් එක් වර්ෂවල ආපදා අවම කිරීමේ අංශය වෙත මහා භාණ්ඩාගාරයෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන

2016 වසරේ සිදුවූ එක් එක් ආපදා සැලකිල්ලට ගැනීමේදී එම ආපදාවන්ගෙන් සිදුවන හානිවීම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන මෙම අංශය වෙත වෙන්කරන ලද මුදල පහත වගුව **4.3** මඟින් දක්වා ඇති පරිදි ආපදා අවම කිරීම් ව්‍යාපෘති සඳහා වෙන්කර ගන්නා ලදි.

ආපදාව	දිස්ත්‍රික්කය	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මිලියන)				
		2012	2013	2014	2015	2016
ගංවතුර	කළුතර	-	3	7	10	24
	ගාල්ල	1	10	8	6.5	9.5
	මාතර	-	1	-	0.685	-
	හම්බන්තොට	2	96	121	14.6	-
	පුත්තලම	-	2	17	17.6	35.174
	රත්නපුර	30	3	1	2.6	52.811
	කුරුණෑගල	-	13	9	-	127.561
	නුවරඑළිය	-	3	4	1.9	12.978
	මාතලේ	-	10	1	10.1	42
	කිළිනොච්චි	6	1	23	-	7.8
	මුලතිව්	-	7	-	-	23.5
	කෑගල්ල	-	13	1	8.8	16.3
	අනුරාධපුර	4	-	1	8	16.7
	කොළඹ	-	-	11	-	-
	ගම්පහ	-	-	8	60.2	-
	ත්‍රිකුණාමලය	-	-	17	5	2.2
	පොළොන්නරුව	-	-	14	34.3	33.4
	බදුල්ල	-	-	10	-	8.1
	මඩකලපුව	-	-	4	4.4	5.6
	මන්නාරම	11	-	26	-	-
	මහනුවර	7	-	23	50	-
	මොණරාගල	-	-	10	-	3
	වව්නියා	-	-	6	6	17.7
	යාපනය	14	-	-	-	19.9
	අම්පාර	-	-	-	6.6	-
එකතුව		75	162	322	247	458
නියඟය	හම්බන්තොට	2	25	41	20.8	-
	පුත්තලම	-	3	3	-	-
	මහනුවර	-	4	-	-	-
	මොණරාගල	-	2	9	4.4	8.5
	වව්නියා	19	7	10	4	3.5
	කුරුණෑගල	-	-	4	78	-
	ත්‍රිකුණාමලය	-	-	1	2	-
	පොළොන්නරුව	-	-	7	-	-
	අම්පාර	-	-	5	-	-
	මුලතිව්	-	6	-	6.2	-
	කිළිනොච්චි	3	-	-	4.7	-
	අනුරාධපුර	-	-	-	4.2	-
	බදුල්ල	-	-	-	0.9	-

	යාපනය	-	-	-	30	-
එකතුව		23	47	80	155	12
සත්ව පහරදීම්	මාතර	-	-	6	-	-
	හම්බන්තොට	-	-	-	0.6	-
එකතුව		0	0	6	0.6	0
අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම	මහනුවර	0.8	1	-	-	7
	බදුල්ල	1	1	6	-	3.9
	නුවරඑළිය	93	6	0.2	-	-
	මාතලේ	-	37	-	-	-
	කෑගල්ල	-	-	6	3.8	-
	රත්නපුර	-	-	2	3.4	17.688
	ගාල්ල	-	-	-	1.5	-
	හම්බන්තොට	-	-	-	3	-
එකතුව		94.8	45	14.2	11.7	28.5

වගුව **4.3:** එක් එක් ආපදාවන්ගෙන් සිදුවන හානි ප්‍රමාණය සැලකිල්ලට ගෙන අවම කිරීම් අංශය විසින් දිස්ත්‍රික් වෙත ලබාදෙන ලද මුදල්

2016 වසරේ දෙසැම්බර් මස **31** දින වන විට මෙම ව්‍යාපෘතිවල සමස්ත භෞතික ප්‍රගතිය **100%**ක් වන අතර, ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට ගෙවීම් කටයුතු සිදු කිරීමේදී වැය වූ මුළු මුදල රු.මි. **421,584**කි. එබැවින් මෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය **84%**ක් වේ. ව්‍යාපෘති නිම කොට ගෙවීම් බිල්පත් හා වැඩ අවසන් වාර්තා මේ වනවිට ලැබෙමින් පවතී.



ගල්මැටියාව මහවැව වාන් ඇල ඉදිකිරීම - ත්‍රිකුණාමලය



උතුරු මිරිස්සන් කොටුව නාව කොටුව සිට කුලම වැව දක්වා ජල බස්නා කාණු පද්ධතිය පිළිසකර කිරීම - පුත්තලම

ගලහිටිය ඕකන්ද හරහා උඩදෙනිය මාර්ගයේ මහ ඇල පාලම සැකසීම - රත්නපුර ගංවතුර



පෙර



පසු

ආපදා අවම කිරීමේ කෙටිකාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන **50**ක පමණ ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබාදී ඇති අතර එම ප්‍රතිපාදන, අන්තරාදායක ලෙස පවතින අස්ථාවර ගල් ඉවත් කිරීම, නිවාසවලට හෝ යටිතල පහසුකම්වලට හානි සිදුවන සේ මාර්ග අවහිර වන සේ පෙරලී ඇති ගල් ඉවත් කිරීම, මාර්ග අවහිර වන සේ ඉදිරි වැටී ඇති ගස් හෝ පස් ඉවත් කිරීම හා ගමනාගමනය අවහිර කරන කුඩා පාලම් ප්‍රතිසංස්කරණය, හදිසි ආපදා අවස්ථාවලදී එම ආපදාවලින් සිදුවිය හැකි හානිය ඉවත් කිරීම සඳහා යන්ත්‍ර කුලියට ගැනීම හෝ ඉන්ධන වියදම් දැරීම, වැව් අමුණු වේලි හානියට පත්වීමේ අවදානම් අවස්ථාවලදී ඒවා ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීම, ආපදාවන්ට ලක්වූවන් ආරක්ෂිත ස්ථානවලට ප්‍රවාහනය කිරීම, ආපදා බලපෑම් අඩුකිරීම සඳහා අවශ්‍ය උපකරණ (උදළු, කැති ආදිය) මිලදී ගැනීම, ළිං පිරිසිදු කිරීමට වතුර පොම්ප කුලියට ගැනීම, හදිසි ආපදා හේතුකොටගෙන අබලන් වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි හදිසි ආපදා අවම කිරීමේ කටයුතු සඳහා භාවිතා කරනු ලැබේ. මේ වනවිට රු.මිලියන **50**ක පමණ ප්‍රතිපාදන මධ්‍යස්ථානය වෙත ලැබී ඇති අතර රු.මිලියන **15.5**ක ප්‍රතිපාදන මේ වනවිට පහත වගුව මඟින් දක්වා ඇති පරිදි හදිසි ආපදා අවම කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආයෝජනය කොට ඇත. මීට අමතරව රු.මි.**5**ක් පමණ බෝට්ටු මිලදී ගැනීම සඳහා වැය වී ඇත.

දිස්ත්‍රික්කය	ලබාදී ඇති ප්‍රතිපාදන (රු.)
ගම්පහ	**54,310.00**
කුරුණෑගල	**551,300.00**
කොළඹ	**60,000.00**
කෑගල්ල	**1,222,672.30**
රත්නපුර	**2,020,876.50**
පුත්තලම	**603,000.00**
මහනුවර	**1,806,648.10**
කළුතර	**100,875.00**
ගාල්ල	**327,500.00**
මාතර	**50,000.00**
මාතලේ	**529,950.00**
මුලතිව්	**100,000.00**
නුවරඑළිය	**941,600.00**
කිළිනොච්චි	**870,335.70**
මන්නාරම	**500,000.00**
හම්බන්තොට	**500,000.00**
වව්නියා	**264,838.50**
එකතුව	**10,532,406.10**

වගුව **4.5:** හදිසි ආපදා අවම කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ආයෝජනය කිරීම



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - වවුනියා



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - ගාල්ල



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - මාතලේ



හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම - මාතර

4.2 දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය

2016 වර්ෂයේ දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 42ක් වෙන්කොට ඇති අතර, මෙම මුදලින් රු.මිලියන 37ක ප්‍රතිපාදන ප්‍රමාණයක් දිස්ත්‍රික් ලේකම් මාතලේ වෙත ලබාදී ඇත. දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය තුළ අදියර 08ක් සාර්ථකව නිම කර ඇති අතර, එමඟින් ප්‍රධාන ස්ථාන වන දඹුල්ල නගරය, බස් නැවතුම්පල, ආර්ථික මධ්‍යස්ථානය, රෝහල ආදී ස්ථානවලට බලපෑ ගංවතුර තත්ත්වය සම්පූර්ණයෙන් පාලනය විය. නමුත් 2015 වර්ෂයේ දෙසැම්බර් මස ඇති වූ වර්ෂාවෙන් ගම්උදාව, ගල්වැටියාව හා පැල්වෙහෙර යන ප්‍රදේශවලට ගංවතුර තත්ත්වයක් ඇති විය. එබැවින් පූර්ණ වශයෙන් ආපදා තත්ත්වය අවම කිරීම සඳහා නගරයේ ඉහළ ජල පෝෂිත ප්‍රදේශවල සිට එන විශාල ජල ධාරිතාව රැගෙන යන ප්‍රධාන ඇල මාර්ගය වන තම්මැන්නා ඇලේ හඳුනාගත් ස්ථාන කිහිපයක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ආපදා හානි සිදුනොවීම, සහනාධාර සඳහා ප්‍රතිපාදන වැය කිරීමට සිදු නොවීම, ජනතාවගේ ආර්ථික, සමාජීය, මානසික තත්ත්වයන් නිසි පරිදි පවත්වා ගැනීමට හැකිවීම හා සංචාරක ආකර්ෂණයට ඉවහල් වන පරිසරයක් නිර්මාණය වීම යන ප්‍රබල කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය රටේ දළ දේශීය නිෂ්පාදනය නැංවීමට මෙන්ම සම්පත් සුරැකීමටද හේතුවී ඇත.

4.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිල වෙබ් අඩවිය www.dmc.gov.lk යථාවත් කිරීම හා නඩත්තු කිරීම මෙම අංශයේ කාර්යභාරය වන අතර 2016 වසරේදී ආයතනයේ සිදුවූ ප්‍රධානම සිදුවීම් සියල්ල වෙබ් අඩවියට යොමුකොට ඇති අතර සියලු ආපදාවන්ට සම්බන්ධ තත්ත්ව වාර්තා දෛනිකව වෙබ් අඩවිය වෙත යොමු කරනු ලැබේ. මීට අමතරව www.drr.dmc.gov.lk යන අන්තර්ජාල සම්බන්ධතාව

යටතේ ව්‍යාපෘති පිලිබඳ සියලු තොරතුරු අන්තර්ජාලය වෙත ලබාදී ඇති අතර, මෙම වසර තුළ පුවත් 12ක ප්‍රමාණයක් නිල වෙබ් අඩවියට ඇතුළත් කොට ඇත.

4.4 Desinventor දත්ත ගබඩාව

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventor.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ හා ආපදාවන් යටතේ කාලවකවානුවට අනුරූපීව මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපල පිළිබඳ තොරතුරු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි මෙහෙයුම් අංශයෙන් නිකුත් කරනු ලබන තත්ත්ව වාර්තාවලින් මෙන්ම වන රක්ෂණ, සෞඛ්‍ය වැනි අංශවලින් ලබාගන්නා තොරතුරුද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත.

1974 – 2016 දක්වා ආපදා සම්බන්ධ මූලික තොරතුරු ඇතුළත් කොට ඇත. 2012, 2013, 2014, 2015, 2016 වසරවලදී සිද්ධීන් හා දත්ත ප්‍රමාණයන් පහත වගුවේ ඇතුළත් කොට ඇත.

වසර	සිද්ධීන් (ආපදා)	දත්ත ප්‍රමාණය
2012	**16**	**512**
2013	**16**	**456**
2014	**13**	**456**
2015	**16**	**719**
2016	**12**	**617**

වගුව **4.6:** එක් එක් වර්ෂවල සිදුවූ ආපදා සිද්ධීන් හා දත්ත ප්‍රමාණයන්

4.5 ආපදා අවම කිරීමේ සංවර්ධනයන් ප්‍රධාන ප්‍රවාහය තුලට අනුගත කිරීම

ආපදා තත්ත්වයන් විවිධ විෂය ක්ෂේත්‍ර හා බැඳී පවතින අතර තිරසාර සංවර්ධනයක් සඳහා ආපදා අවම කිරීම අතිශය වැදගත් කරුණකි. මේ පිළිබඳ සැලකිල්ල යොමුකොට නිවාස ඉදිකිරීමේදී ආපදා අවදානම අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම, පළාත් පාලන ආයතනවල තාක්ෂණික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය හා එක්ව අදාළ පාර්ශවකාරී ආයතන හා සහයෝගීතාවයෙන් සිදුකරමින් පවතියි. මෙහිදී පළාත් පාලන ආයතන 300ක පමණ නිලධාරීන් 650ක ප්‍රමාණයක් ආපදාවන්ට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීම පිලිබඳව දැනුවත් කිරීමට ශ්‍රී ලංකා පළාත් පාලන හා පුහුණු ආයතනය සමඟ කටයුතු කොට ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශයන් සැලසීමටද කටයුතු කොට ඇත. මීට අමතරව එක්සත් ජාතීන්ගේ ජනාවාස වැඩසටහන යටතේ ක්‍රියාත්මක සුරක්ෂිත නගර සඳහා සැලසුම් සැකසීමේ ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන සැලසුම් සඳහා මාර්ගෝපදේශයක් සකසා ඇත.

5. පෙර සූදානම් හා සැලසුම් අංශය

5.1 හැඳින්වීම

ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මෙහි නිර්මාණ කටයුතු සම්බන්ධීකරණය කිරීම, ව්‍යසන කළමනාකරණ සැලැස්ම නිර්මාණය කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම හා පිළියෙල කිරීම, 2005

අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මඟින් නියම කරනු ලැබ ඇති පරිදි ව්‍යසන කළමනාකරණ සැලැස්ම නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය අංශයේ ආයතන සඳහා සහායවීම පිළිබඳ වගකීම උසුලනු ලබන පෙර සූදානම් සැලැසුම් අංශය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අංශවලින් එකකි. තවද, ව්‍යසන සඳහා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීමට සහ මුදාගැනීම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන් හට අවශ්‍ය සහාය ලබා දීම හා එම කටයුතු සම්බන්ධීකරණය කිරීමද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ. මෝසම් කාලගුණ තත්ත්වය ඇරඹීමට ප්‍රථම පෙර සුදානම් සැලසුම් අංශය විසින් ඕනෑම ව්‍යසන තත්ත්වයකට මුහුණදීම සඳහා ආයතනය සතු සූදානම සහතික කරලීම උදෙසා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ඇතිව පෙර සූදානම් සැලසුම් අභ්‍යාස ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවලට ප්‍රතිචාර වශයෙන් පෙර සූදානම් වැඩසටහන් සඳහා 2014, 2015 හා 2016 වර්ෂයන්හි පිළිවෙලින් රු. මිලියන 10, 12 හා 12.5 ලෙස ප්‍රතිපාදන ලබා දුනි. එසේ ලබා දුන් ප්‍රතිපාදන හා වැය වීම පිළිබඳව සන්සන්දනය කිරීම වගු අංක 5.1 හා රූප සටහන් අංක 5.1හි දැක්වේ.

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ ප්‍රතිපාදන	වියදම
2014	10.00	9.20
2015	12.00	9.94
2016	12.50	11.11

5.1 වගුව - ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන හා වැය වීම්



5.1 රූප සටහන: ආපදා පෙර සූදානම් සඳහා පසුගිය වසරවල වෙන් කළ ප්‍රතිපාදන හා වැය වීම්

2016 වර්ෂයේදී දිස්ත්‍රික් 25ක ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් කටයුතු නිර්මාණය කිරීම සහ ඒ පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා රු. මිලියන 12.5ක මුදලක් වෙන් කරන ලදී. රටෙහි ආර්ථික තත්වය සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු

ලැබ ඇත. දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන බෙදා හැරීම සිදු කරන ලද ආකාරය (5.2 රූප සටහන) සහ එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය (5.3 රූප සටහන) පහත දැක්වේ.



5.2 රූප සටහන: 2016 වර්ෂයේ පෙර සූදානම් වැඩසටහන් සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත මුදා හරින ලද ප්‍රතිපාදන



5.3 රූප සටහන - පෙර සූදානම් වැඩසටහන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ව්‍යසන කළමනාකරණ සක්‍රියතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2016 වර්ෂය තුළදී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත. තෝරාගත් පළාත් පාලන බල ප්‍රදේශ තුළ ප්‍රත්‍යාස්ථ නගර වැඩසටහන පැවැත්වීම සඳහා ද මෙම අංශය සහාය ලබා දෙයි. සුනාමි ජලගැලීම් සහ නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් තත්ත්ව විශ්ලේෂණය, ග්‍රාමීය මට්ටමේ ව්‍යසන කළමනාකරණ කමිටු ස්ථාපනය කිරීම වැනි ප්‍රජා මට්ටමේ ව්‍යසන ප්‍රතිචාර වැඩසටහන් පැවැත්වීම, ජලාශ වේලි බිඳී යාමට පූර්වෝපායක් ලෙස, ජලාශ වේලි පහළ බෑවුමේ

ජීවත්වන ජනතාව සඳහා හදිසි අවස්ථා තත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමට ප්‍රජා සහභාගීත්වය සහිත පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම සඳහාද මෙම අංශය විසින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

5.2 දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම

ව්‍යසනයක් සිදුවුවහොත් හෝ ව්‍යසනයක් සිදුවන අවස්ථාවකදී ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමේ යාන්ත්‍රණයක් සංස්ථාපනය කිරීම සඳහා සහාය වන කාර්යසාධන ලේඛනයක් ලෙස දිස්ත්‍රික් ආපදා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයක් තුළ සිදුවන ව්‍යසනයන් සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතනය ලෙස දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව හැඳින්විය හැකිය. මෙම කමිටුවේ, උප කමිටුවල සාමාජිකයන් සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මෙම සැලසුම තුළ ලැයිස්තුගත කර ඇත. පරිපාලන ප්‍රදේශය, පවතින උවදුරු, අවදානම් තත්වවල ප්‍රතිඵල සහ සිදු කරන ලද අවදානම් තත්ව තක්සේරු කිරීම, ප්‍රධාන ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ආකාරය, ප්‍රදේශය තුළ පවතින භෞතික සහ මානව සම්පත්, ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශ්වකාර ආයතනවල වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම් තුළ අන්තර්ගත වේ.

2016 දෙසැම්බර් මාසය වන විට දිස්ත්‍රික් ආපදා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් **25**ම සකස් කොට මුද්‍රණය කර ඇත. එමෙන්ම **2016** වර්ෂය සඳහා වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදනය යටතේ ප්‍රාදේශීය ආපදා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් පිළියෙල කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යන ලදී. ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ඇරඹීම සඳහා සහ ඒවා හඳුන්වාදීම සඳහා මූලික වැඩමුළු **10**ක් ද, අවසන් වැඩමුළු **35**ක් ද පවත්වන ලදී. ප්‍රාදේශීය ආපදා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම්වල අවසාන කෙටුම්පත් පාර්ශ්වකාර ආයතන වෙත පිරිනැමීම සඳහා එක් එක් දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ වැඩමුළු පවත්වන ලද අතර ඒවා පිළිබඳ තොරතුරු **5.2** වගුවේ දැක්වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	ආරම්භක වැඩමුළු		අවසාන වැඩමුළු	
		වැඩමුළු සංඛ්‍යාව	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	වැඩමුළු සංඛ්‍යාව	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
1	කළුතර				
2	ගම්පහ			**3**	මීරිගම, හලාවත, වත්තල
3	ගාල්ල				
4	මාතර			**4**	මාතර, දෙවුන්දර, අතුරලිය, වැලිගම
5	මහනුවර				
6	මාතලේ	**2**	මාතලේ, දඹුල්ල	**2**	දඹුල්ල, පල්ලේපොළ
7	පුත්තලම			**6**	කරුවලගස්වැව, වනාතවිල්ලුව, නාත්තන්ඩිය, දන්කොටුව,

					හලාවත, මාදම්පේ
8	රත්නපුර	**2**	කහවත්ත, ඉඹුල්පේ	**2**	ඇලපාත, කිරිඇල්ල
9	කුරුණෑගල			**3**	ගල්ගමුව, කුලියාපිටිය බටහිර, අලව්ව
10	අනුරාධපුරය	**2**	පළගස්වැව, පදවිය	**2**	කැකිරාව, ගල්නෑව
11	පොළොන්නරුව				
12	මන්නාරම				
13	ත්‍රිකුණාමලය			**3**	කන්තලේ, තම්බක්ගොමුව, සල්ලි
14	මඩකලපුව				
15	මොණරාගල			**2**	බුත්තල, තණමල්විල
16	යාපනය	**2**	තෙල්ලිප්පලායි, උඩුවිල්	**4**	ඩෙල්ෆ්, කෝපායි, උඩුවිල්, තෙල්ලිප්පලායි
17	වවුනියාව			**2**	වවුනියා - දකුණ, වවුනියා
18	හම්බන්තොට	**2**	වලස්මුල්ල, මීකේවෙල	**2**	වීරකැටිය, වලස්මුල්ල
	මුළු එකතුව	**10**		**35**	

වගුව **5.2:** හදිසි අවස්ථා ප්‍රතිචාර සැලැසුම්වල අවසන් කෙටුම්පත් පාර්ශවකාර ආයතන වෙත ලබාදීම සඳහා දිස්ත්‍රික්වල පවත්වන ලද වැඩමුළු



ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ වැඩසටහන - වවුනියාව



ප්‍රාදේශීය ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමේ අවසන් වැඩමුළුව - ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය **2016.05.04**

5.3 ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ ප්‍රජා පෙර සූදානම් හා හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් නිර්මාණය කිරීම

ගම්මානවල පවතින විවිධ උවදුරු සැලකිල්ලට ගනිමින් ප්‍රජා ආපදා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් සකස් කරන ලදී. ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රජා මට්ටමේ ආපදා සිතියම්ගත කිරීම ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන කටයුතු

වේ. තවද, ප්‍රජා මට්ටමේ උවදුරු සිතියම් පිළියෙල කිරීම, ආරක්ෂිත මාර්ග හා ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම, ප්‍රථමාධාර, අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් සඳහා කඳවුරු ස්ථාපනය කිරීම සහ කඳවුරු කළමනාකරණය කිරීම පිළිබඳවද ඔවුන්හට පුහුණුව ලබා දෙන ලදී. 2016 වර්ෂය තුළ සියලුම දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ප්‍රජා පෙර සූදානම් සහ හදිසි අවස්ථා ප්‍රතිචාර සැලසුම් 206ක් සකස් කරන ඇති අතර එහි භෞතික ප්‍රගතිය 95%කි.





ග්‍රාමීය ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම - වවුනියාව

5.4 ජාතික/ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය මට්ටමේ පෙරහුරු වැඩසටහන්

මෙම වැඩසටහන් යටතේ ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් තුළින් ආපදා කළමනාකරණය හා සෘජුව සම්බන්ධ නිලධාරීන් ප්‍රධාන කොටගෙන ආපදා පෙර අවස්ථාව, ආපදා අවස්ථාව හා ආපදා පසු අවස්ථාවලදී ඔවුන්ගේ කාර්යයභාරය හඳුනාගනිමින් සිදුකරන පෙරහුරු වැඩසටහනකි. මේ යටතේ දිස්ත්‍රික් මට්ටමේ පෙරහුරු 21ක් ද, ප්‍රාදේශීය මට්ටමේ පෙරහුරු වැඩසටහන් 52ක් ද පවත්වන ලදී.





ජාතික මට්ටමේ සුනාමි පෙරහුරු වැඩසටහන - ගාල්ල



ජාතික මට්ටමේ සුනාමි පෙරහුරු වැඩසටහන - ත්‍රිකුණාමලය

5.5 ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ පෙරහුරු වැඩසටහන්

2016 වර්ෂය තුළ සුනාමි, ගංවතුර හා නායයෑම් ආදි ආපදාවන්ට ලක්වීමේ වැඩි නැඹුරුතාවයක් සහිත දිස්ත්‍රික්ක තුළ හදිසි අවස්ථාවල ජනතාව ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම පිළිබඳ ග්‍රාමීය මට්ටමේ

පෙරහුරු වැඩසටහන් පැවත්වූ අතර එහිදී සුනාමි පෙරහුරු වැඩසටහන් 82ක්ද, නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් 54ක්ද, ගංවතුර පෙරහුරු වැඩසටහන් 65ක්ද වන පරිදි වැඩසටහන් 199ක් පවත්වන ලදී.

	දිස්ත්‍රික්කය	සුනාමි පෙරහුරු වැඩසටහන් ගණන	ගංවතුර පෙරහුරු වැඩසටහන් ගණන	නාය යෑම් පෙරහුරු වැඩසටහන් ගණන
1	කොළඹ	4	2	
2	ගම්පහ	4	4	
3	කළුතර	5	2	6
4	මාතර	5	4	3
5	ගාල්ල	7	3	3
6	හම්බන්තොට	6	2	3
7	රත්නපුර	2	3	10
8	කෑගල්ල			1
9	බදුල්ල			10
10	මොණරාගල		3	2
11	නුවරඑළිය			12
12	මහනුවර			7
13	මාතලේ			8
14	පුත්තලම	4	3	
15	කුරුණෑගල			
16	අනුරාධපුර		2	
17	පොළොන්නරුව		1	
18	අම්පාර	7	3	
19	මඩකළපුව		10	
20	ත්‍රිකුණාමලය	10	1	
21	වවුනියාව		2	
22	මන්නාරම	7	1	
23	කිළිනොච්චි	5	2	
24	යාපනය	10	2	
25	මුලතිව්	6	2	
		82	52	65

5.3 වගුව - දිස්ත්‍රික්කවල පවත්වන ලද පෙරහුරු වැඩසටහන් පිළිබඳ සාරාංශය





සුනාමි පෙරහුරු අවස්ථාවකදී ප්‍රජාව ආරක්ෂිත ස්ථානය කරා යොමුවන ආකාරය - මාතර

5.6 විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සුදානම් කටයුතු

සුළි සුළඟක් හෝ භූවලනයක් හෝ සිදුවන අවස්ථාවකදී ජලාශ වේලි ආශ්‍රිතව ආපදා ඇතිවීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින්, තෝරාගත් ප්‍රධාන ජලාශ වේලි පාමුල ජීවත්වන ප්‍රජාවන්ගේ පෙර සූදානම් හැකියාව ඉහළ නැංවීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. 2016 වර්ෂය තුළ මේ වන විට වේලි ආශ්‍රිත දැනුවත් කිරීම් හා පෙරහුරු වැඩසටහන් 37ක් පවත්වා ඇත. සෝදිසි හා මුදවා ගැනීම්, ප්‍රථමාධාර කඳවුරු කළමනාකරණය සහ ගම්මානවල ආරක්ෂාව යනාදී කටයුතු අනු කමිටු නිර්මාණය කිරීම පූර්ව අනතුරු

ඇඟවීම් ප්‍රචාරණ යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම, සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම සහ අවසාන වශයෙන් ආරක්ෂිත ස්ථාන කරා ජනතාව රැගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මඟින් ජලාශ වේලි පාමුල ජීවත්වන අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම වැඩසටහනට ඇතුළත් විය.

5.7 රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම

ශ්‍රී ලංකාව තුළ දියේ ගිලීම නිසා සිදු වී යයි වාර්තා වන මරණ සංඛ්‍යාව වැඩිවීමේ නැඹුරුතාවයන් පසුගිය වසර කිහිපය තුළ ඇති විය. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල සංඥා පුවරු පිහිටුවීම සහ එමඟින් අනතුරුදායක පොකුණු, ගංගා සහ වැව් තුළ දිය නෑම සිදු නොකරන ලෙස ජනතාව දැනුවත් කිරීම වේ. රත්නපුර, මොණරාගල, මාතර හා අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ කළුගඟ, කතරගම, පොල්හේන හා නුවරවැව-තිසා වැව අශ්‍රිතව සංඥා පුවරු ස්ථාපිත කරන ලදි. මේ වන විට සංඥා පුවරු 63ක් ස්ථාපිත කර ඇත.

එමෙන්ම අනුරාධපුර, පොළොන්නරුව හා කතරගම ආශ්‍රිත උත්සව කාලයන්හිදී සිදුවන දියේ ගිලීම් අවම කිරීම සඳහා විශේෂ වැඩසටහන් පවත්වන ලදී.

5.8 මෝසම් පෙර සූදානම් සැලසුම්

ඊසාන දිග, නිරිත දිග හා අන්තර් මෝසම් සුළං සමඟ ඇතිවන වර්ෂාව නිසා සිදුවන ආපදා තත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා එය බලපාන දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පෙර සූදානම් සැලසුම් සකස් කිරීම කරනු ලබයි. ජාතික වශයෙන් පෙර සූදානම් වැඩසටහන් 03ක් පවත්වන ලද අතර මෙයින් වැඩසටහන් 02ක් ආපදා කළමනාකරණය සඳහා ස්ථාපිත කර ඇති හදිසි මෙහෙයුම් කමිටු රැස්කර හදිසි අවස්ථාවකදි ප්‍රතිචාර දැක්වීම සඳහා ඔවුන් දැනුවත් කරන ලදි. ජාතික වශයෙන් පැවැත්වූ අනෙකුත් වැඩසටහන වන්නේ මාධ්‍ය දැනුවත් කිරීම වේ. ඊසාන දිග හා නිරිත දිග මෝසම් සුළං බලපාන දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණය සම්බන්ධ පාර්ශව ආයතන හදිසි අවස්ථාවලදි ප්‍රතිචාර දැක්වීම සඳහා මෙම වැඩසටහන් 25ක් පවත්වන ලදි. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වැඩසටහන් 82ක් පවත්වන ලදි.



2016 .06. 01 - කළුතර දිස්ත්‍රික්කයේ පැවැති මෝසම් ආපදා පෙර සූදානම් වැඩසටහන



2016 05.18 මෝසම් ආපදා පෙර සූදානම පිළිබඳව ජාතික මට්ටමෙන් පැවැති වැඩසටහන - ආ. ක. ම

5.9 රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම

රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ, රෝහල් සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව, රෝගීන්ගේ ආරක්ෂාව, හදිසි ආපදා අවස්ථාවකදි රෝහල් කරා එන

රෝගීන්ට ප්‍රතිකාර ලබා දීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් සකස් කිරීම වේ. මෙම වැඩසටහන තුළදි රෝහල තුළ හා අවට ප්‍රදේශවල ස්වභාවිකව ඇතිවන ආපදා හඳුනාගෙන එම තොරතුරු සිතියම් ගතකර ඒ අනුව එම ආපදා අවම කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම, දැනුවත් කිරීම හා පෙරහුරු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු ඇතුළත් සැලැස්මක් වේ. මෙම වැඩසටහන් යටතේ දිස්ත්‍රික් **18**ක වැඩසටහන් **40**ක් පවත්වන ලදි.

5.10 පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්

අධ්‍යාපන අමාත්‍යාංශය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ව ආපදා අවදානම් ඇති පාසල්වල පාසල් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් **25** තුළ මෙම වැඩසටහන් **130**ක් **2016** වසරේදී නිම කරන ලදි. මෙම වැඩසටහන් මඟින් පාසල් ළමුන් හා ගුරුවරුන් සමඟ එම පාසලේ ආපදා අවදානම් සිතියම් සකස් කිරීම, ආපදා පිළිබඳ දැනුවත් කිරීම සහ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මෙහි අරමුණ වේ.

5.11 2016 වර්ෂයේදී සිදු කරන ලද අනෙකුත් පෙර සූදානම් ක්‍රියාකාරකම්

5.11.1 බදුල්ල දිස්ත්‍රික් ආපදා අවදානම් සිතියම් හා පස් අවුරුදු උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම.

බදුල්ල දිස්ත්‍රික්කය ආපදා අධික දිස්ත්‍රික්කයක් වන අතර විශේෂයෙන් නායයෑම්, ගංවතුර, කැලෑගිනි හා වන අලි උවදුරු ප්‍රධාන වේ. මෙම ආපදා අතරින් නායයෑම් ආපදා ඉතා අධික දිස්ත්‍රික්කයක් ලෙස බදුල්ල දිස්ත්‍රික්කය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇත. මෙයට බොහෝ දුරට බලපා ඇත්තේ ස්වභාවික හේතුන්ට වඩා මිනිසා විසින් කරන අවිධිමත් ඉඩම් පරිහරන රටාව වේ.

බදුල්ල දිස්ත්‍රික්කයේ තිබෙන ආපදා ප්‍රදේශ හඳුනාගෙන ඒ අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම ප්‍රධාන අරමුණ වේ. මෙම සැලැස්ම සකස් කිරීම සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ සියලු ආයතන සම්බන්ධ වේ .මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් අනුග්‍රහය ලබාදෙන අතර මූලික වැඩකටයුතු **2015** වර්ෂයේදී ආරම්භ කරන ලද අතර **2016** දෙසැම්බර් මස වනවිට ග්‍රාමීය මට්ටමේ නායයෑම් ආපදා සිතියම් සකස්කර අවදානම් ප්‍රදේශ පිළිබඳ දැනුවත්කර ඇති අතර ඒ සම්බන්ධව ලබාගෙන ඇති භෞතික ප්‍රගතිය **70%**කි.

5.11.2 නිපොන්මාරු වැඩසටහන - 2016

ජපන් රජයේ අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සංවිධානය කරනු ලැබූ **Ship For World Youth Leaders** වැඩසටහන ශ්‍රී ලංකාව තුළදී ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව විසින් සංවිධානය කරන ලදි. ජපානයේ තරුණ තරුණියන් සහ ශ්‍රී ලංකාව ඇතුළු රටවල් **12**ක තරුණ තරුණියන් **250**කගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන සංස්කෘතික, සමාජීය වශයෙන් තරුණ තරුණියන් අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීම සහ නායකත්වය ගොඩනැගීමේ පරමාර්ථයෙන් සංවිධානය කරනු ලැබීය.

මෙම තරුණ තරුණියන් රැගත් නෞකාව **2016/02/14** සිට **2016/02/17** දින දක්වා ශ්‍රී ලංකාවේ රැඳී සිටි අතර එම රැඳී සිටි කාලය තුළ මෙම කණ්ඩායම් විවිධ අධ්‍යන චාරිකාවන්හි නිරත විය.

ඒ අනුව ජපානයේ තරුණ තරුණියන් සහ ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 12ක තරුණ තරුණියන් 50ක් 2016/02/15 වන දින පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේදී අධ්‍යන චාරිකාවක නිරත විය.

එහිදී ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමක්, ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය පිලිබඳ ගෝලීය වශයෙන් ඇති සම්බන්ධතාවය හා හදිසි මෙහෙයුම් සිදුකිරීම පිළිබඳවත් දේශන පවත්වන ලදි.



6. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු හා දැනුවත් කිරීමේ අංශය ආයතනයේ අභ්‍යන්තර කාර්යය මණ්ඩලයේ ධාරිතා වර්ධනය සඳහා වූ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන, ත්‍රිවිධ හමුදා, පොලීසිය, සිවිල් ආරක්ෂක අංශ, මෙන්ම රාජ්‍ය නොවන පාර්ශවකාර ආයතනවල නියෝජිතයින් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම ප්‍රධාන වගකීම වන්නේය.

මෙම පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සහ ග්‍රාම නිලධාරි මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබයි. ජාතික මට්ටමේ වැඩසටහන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරනු ලබයි.

2016 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 12.5 මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලදී. ඒ අනුව එම මූල්‍ය ප්‍රතිපාදන යොදා ගෙන රටේ මහජනතාව ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම, අදාළ කණ්ඩායම් පුහුණු කිරීම ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකි විය. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2016 ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක කරා ළඟා වීමට හැකි විය. 2016 වර්ෂයේ දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන සහ සැලසුම් කළ වැඩසටහන්වල භෞතික ප්‍රගතිය 99%ක් දක්වා වාර්තා කිරීමට හැකි විය. ජාතික මට්ටමේ වැඩසටහන් සහ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්වී ගිය ආකාරය පහත සඳහන් වේ.



සටහන 6.1: ජාතික මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්වී ඇති ආකාරය

2016 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මානව සම්පත් සංවර්ධනය සඳහා රු. මිලියන 2.5ක් ලැබුණු අතර එම මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව කැළණිය විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට නිලධාරීන් දහදෙනෙකුද සහකාර අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු සඳහා පශ්චාත් උපාධි අධ්‍යන පාඨමාලාව සඳහාද මූල්‍ය ප්‍රතිපාදන ලබාදී ඇත. ඊට අමතරව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර නිලධාරීන් සහ කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා භූගෝල සිද්ධි විධිවිධාන පද්ධති හා සිතියම් ගත කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන්, කාර්යාල ක්‍රමවේද, ලිපිගොණුකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව අදාල පුහුණුව ලබාදෙන ලදි.

6.1 ජාතික මට්ටමේ වැඩසටහන්

ආපදා කළමනාකරණයට අදාළව රත්නපුර දිස්ත්‍රික්කයේ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් ස්ථාපිත කිරීමේ පළමු අදියර රත්නපුර, ඇහැලියගොඩ, කුරුවිට, ඇලපාත, නිවිතිගල, කිරිඇල්ල, අයගම, සහ කලවාන යන ප්‍රා.ලේ.කොා. සාමාජිකයන් සඳහා 2016.08.29 දින සිට 2016.09.01 දින දක්වා බටංගල තරුණ සේවා පුහුණු මධ්‍යස්ථානයේදී ද, දෙවැනි අදියර බලංගොඩ, ඉඹුල්පේ, වැලිගෙපොල, පැල්මඩුල්ල, ඕපනායක, ඇඹිලිපිටිය, කොලොන්න, ගොඩකවෙල, සහ කහවත්ත යන ප්‍රා.ලේ.කොා. සාමාජිකයන්

සඳහා **2016.09.13** දින සිට **2016.09.16** දක්වා කල්තොට දිවිනැගුම පුහුණු මධ්‍යස්ථානයේදී නේවාසික වැඩමුළුවක් ලෙස පවත්වන ලදී.

රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් පිහිටුවීමේ පුහුණු වැඩසටහන් දෙකට සහභාගී වූ තරුණ තරුණියන්ගේ සහභාගීත්වයෙන් මෙම පුහුණු වැඩමුළුවේ අවසන් අදියර ලෙස ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ගංවතුර හා නායයෑම් පිළිබඳ පෙරහුරු **(Drill)** සහ පුහුණු වූ තරුණ තරුණියන් හට සහතිකපත් ප්‍රදානය හා සමාප්ති උළෙල ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ හා ගරු ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍ය ගරු දුනේෂ් ගන්කන්ද මැතිතුමාගේ සහ අමාත්‍යාංශ ලේකම් එස්.එස්.මියනවල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් **2016.09.30** වන දින පෙ.ව. **9.00**ට ඇඹිලිපිටිය යුධ ඉංජිනේරු පුහුණු පාසලේදී පවත්වන ලදී.

6.2 දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන්

දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ප්‍රධාන කාර්යාලය සම්බන්ධීකරණය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලදි. දිස්ත්‍රික් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පදනම වූයේ ඒ ඒ දිස්ත්‍රික්කයේ පවතින ආපදා අවදානම සහ ඒ ඒ දිස්ත්‍රික්කයට බලපාන ආපදා අනුව මහජනතාව දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. පහත සඳහන් වන්නේ ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇති ආකාරයයි.

අංකය	දිස්ත්‍රික්කය	ලබා දුන් මූල් ප්‍රතිපාදන	අංකය	දිස්ත්‍රික්කය	ලබා දුන් මූල් ප්‍රතිපාදන
1	අනුරාධපුර	**333,650.00**	**14**	කුරුණෑගල	**635,000.00**
2	අම්පාර	**340,110.00**	**15**	මන්නාරම	**333,985.00**
3	බදුල්ල	**584,000.00**	**16**	මාතලේ	**441,175.00**
4	මඩකළපුව	**320,000.00**	**17**	මාතර	**532,206.50**
5	කොළඹ	**482,228.50**	**18**	මොණරාගල	**347,280.00**
6	ගාල්ල	**492,505.00**	**19**	මුලතිව්	**373,970.00**
7	ගම්පහ	**402,375.00**	**20**	නුවරඑළිය	**390,000.00**
8	හම්බන්තොට	**480,020.00**	**21**	පොළොන්නරුව	**362,615.00**
9	යාපනය	**475,030.00**	**22**	පුත්තලම	**430,000.00**
10	කළුතර	**353,800.00**	**23**	රත්නපුර	**501,100.00**
11	මහනුවර	**369,300.00**	**24**	ත්‍රිකුණාමලය	**362,500.00**
12	කෑගල්ල	**500,000.00**	**25**	වව්නියා	**385,100.00**
13	කිළිනොච්චිය	**364,572.40**			

වගුව **6.1:** දිස්ත්‍රික් මට්ටමේ පුහුණු වැඩසටහන් සිදු කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික් වෙත ලබාදී ඇති ප්‍රතිපාදන

2016 වර්ෂයේ දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක **25** තුළ ක්‍රියාත්මක වූ අතර ඊට අමතරව ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් කොළඹ ප්‍රධාන කාර්යාලය විසින් සිදු කරන ලදි. ඒ අනුව **2016** වර්ෂයේ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන්වලට හා ජාතික මට්ටමේ වැඩසටහන්වලට සහභාගී වූ පිරිස පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පහත සඳහන් වේ.

අංක	දිස්ත්‍රික්ක	වැඩසටහන සඳහා සහභාගී වූ මුළු සංඛ්‍යාව
01	අම්පාර	**1748**
02	අනුරාධපුර	**1623**
03	බදුල්ල	**1437**
04	මඩකලපුව	**1000**
05	කොළඹ	**2247**

06	ගාල්ල	**3033**
07	ගම්පහ	**1450**
08	හම්බන්තොට	**3290**
09	යාපනය	**1836**
10	කළුතර	**2586**
11	මහනුවර	**1912**
12	කෑගල්ල	**2092**
13	කිළිනොච්චිය	**1060**
14	කුරුණෑගල	**2012**
15	මන්නාරම	**1320**
16	මාතලේ	**1455**
17	මාතර	**2156**
18	මොණරාගල	**1844**
19	මුලතිව්	**1366**
20	නුවරඑළිය	**1630**
21	පොළොන්නරුව	**1322**
22	පුත්තලම	**2537**
23	රත්නපුර	**1296**
24	ත්‍රිකුණාමලය	**1534**
25	වවුනියාව	**1517**
26	ජාතික මට්ටමේ වැඩසටහන්	**2010**

වගුව **6.2:** දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන්වලට හා ජාතික මිටටමේ වැඩසටහන්වලට සහභාගී වූ ප්‍රමාණයන්

2016 වර්ෂයේ ජාතික මට්ටමේ වැඩසටහන් අතර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් **198** දෙනෙක් නේවාසික පුහුණුව ලබා දී ආපදා කළමනාකරණ තරුණ ස්වේච්ඡා කණ්ඩායම් ලෙස සමාජ ගත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන ජාතික තරුණ සේවා සභාව, ජාතික යොවුන් සේනාංකය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදි.



නායකත්ව පුහුණු වැඩසටහන



කඳවුරු කළමනාකරණය පිළිබඳ පුහුණුව



ප්‍රථමධාර පිළිබඳ වැඩසටහන



ආපදා කලමනාකරණය පිළිබඳ ත්‍රිවිද හමුදා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන



ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රදර්ශන පැවැත්වීම



ආපදා කළමනාකරණය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන



ගිනි ආරක්ෂණ පුහුණු වැඩසටහන



සෙවීම් හා මුදවා ගැනීම් පුහුණු වැඩසටහන



පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන



ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන

7. හදිසි මෙහෙයුම් අංශය

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය **2006** වර්ෂයේදී පිහිටුවන ලද අතර එය සතියේ දින 7හිම පැය **24** පුරාවටම ක්‍රියාත්මක වේ. සිදුවීමට ඉඩ ඇති ස්වාභාවික ආපදා පිළිබඳව තාක්ෂණික ආයතන වෙතින් පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ තොරතුරු හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය වෙත ලැබෙන අතර අදාළ තොරතුරු ලැබිය යුතු පුද්ගලයාට තොරතුරු ලබාදීම සහ එම තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම මෙන්ම ඊට ප්‍රතිචාර දැක්වීම මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කෙරේ. රට පුරා සිදුවන ස්වාභාවික සහ මිනිසා විසින් සිදු කරනු ලබන ආපදා පිළිබඳව සියලු තොරතුරුද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංරක්ෂණය කොට පවත්වා ගෙන යනු ලබන අතර දෛනික තත්ව වාර්තාවක්ද පිළියෙල කරයි.

ස්වාභාවික හෝ මිනිසා විසින් ඇති කරනු ලබන ආපදා අවස්ථාවකදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන විසින් සන්නද්ධ හමුදා, පොලිසිය සහ අනිකුත් අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, සම්පත් යෙදවීම සහ හදිසි සහනාධාර සැපයීම සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ. මෙම මධ්‍යස්ථානය, කොළඹ **07**, විද්‍යා මාවතේ පිහිටි නව ගොඩනැගිල්ල තුළ වැඩි දියුණු කළ පහසුකම් යටතේ ක්‍රියාත්මක වේ.



පැය 24 x 7 හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය

➢ ගංවතුර මගින් පීඩාවට පත්වූ ජනතාව

ශ්‍රී ලංකාව **2016** මැයි මාසය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වත් සමඟ ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් කොළඹ, ගම්පහ, පුත්තලම, රත්නපුර, කෑගල්ල, කුරුණෑගල, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව, වවුනියා, මන්නාරම, යාපනය, මුලතිව්, කිළිනොච්චි සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන් පීඩාවට පත්විය. පැවති දැඩි වර්ෂාපතනය හේතුවෙන් කැළණි ගඟෙහි ජල මට්ටම ක්‍රමයෙන් වර්ධනය වූ අතර ඒ හේතුවෙන් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික් වැඩිම පීඩාවට පත්වූ දිස්ත්‍රික් ලෙස සඳහන් කළ හැකිය.

2016 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වුණු ජල ගැලීම් හේතු කොට ගෙන විපතට පත්වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව **110,596**ක් විය. දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක විසින් සහාය ඉල්ලා සිටි විට හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථාන විසින් පොලිසිය සහ සන්නද්ධ හමුදා සහාය කොට ගෙන මුදවා ගැනීම්, ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ගමන් කරවීම සහ හදිසි අවස්ථා සහනාධාර මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබිණි.



කැළණි ගඟ පිටාර ගැලීමෙන් පසු ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ගමන් කරවීම

➢ නායයෑම්

කාලගුණික තත්ත්වයේ වර්ධනයත් සමඟ නායයෑම් සහ නායයෑම් අවදානම් තත්ත්වයන් කෑගල්ල, මහනුවර, රත්නපුර, නුවරඑළිය, මාතලේ සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන් තුළ සිදුවූ අතර පහත සඳහන් බරපතල ආපදාවන් රැසක් මෙම ආපදා කාලවකවානුව තුළදී සිදුවිය.

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රදේශයේ ඩෙනිස්වත්ත කන්ද නායයෑම නිසා මරණ **04**ක් වාර්තා විය. අරණායක ප්‍රදේශයේ සිදු වූ නායයෑම හේතුවෙන් මරණ **48**ක්ද අතුරුදහන් පුද්ගලයින් සංඛ්‍යාව **113**ක්ද වේ. බුලත්කොහුපිටිය සිදු වූ නායයෑමෙන් මරණ **14**ක් වාර්තා විය. අතුරුදහන් වූ පුද්ගලයන්

02කි. නායයෑම සම්බන්ධයෙන් යුද්ධ හමුදා මූලස්ථානය සහ ආඥාපති - ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) දැනුවත් කර සෙවීමේ සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සඳහා හමුදා භට පිරිස් යොදවන ලදී.



අරණායක, දෙහිඕවිට, බුලත්කොහුපිටිය නායයෑම්- සෙවීමේ සහ මුදවාගැනීමේ මෙහෙයුම්

7.1 පසු ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය

- වැසි සහිත තත්වය ආරම්භ වීමත් සමඟම සියලුම මාධ්‍ය දැනුවත් කිරීමේ කටයුතු පැය **24** පුරාම අඛණ්ඩව සිදු කරන ලදි. තවද සියලුම පූර්ව දැනුම් දීමේ නිවේදනයන් ලද වහාම මාධ්‍ය වෙත අඛණ්ඩව නිකුත් කරන ලදි. ගංවතුර සහ නායයෑම් පිළිබඳ පූර්ව දැනුම් දීම් වෙනුවෙන් තාක්ෂණික දත්ත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ලැබෙන අතර එය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය හරහා බලපෑමකට ලක්විය හැකි ජනතාවට ලබා දෙනු ලබයි.

- කොළඹ, කොලොන්නාව, කඩුවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ඇතිවූ ගංවතුර තත්වයෙන් අවතැන්වූ හා පීඩාවට පත්ව සිටි ජනතාව ශ්‍රී ලංකා නාවික හමුදාව, පොලිස් නාවික කොට්ඨාශය මඟින් හා ගුවන් හමුදාව සම්බන්ධීකරණ කටයුතු සිදුකර ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීමටත්, නිවාස ඉහළ මහලවල ආරක්ෂිතව රැඳී සිටි ජනතාව වෙත අඛණ්ඩව ආහාර ලබාදීම නාවික හා ගුවන් හමුදා සහයෙන් සිදුකරන ලදී. යුද්ධ හමුදාව සහ පොලිසිය විසින් මිනිස් ජීවිත මුදවා ගැනීමේ සහ සහන සේවා කටයුතු පිළිබඳ පාබල මෙහෙයුම් සිදු කරන ලදී.

- අවතැන් වූවන් සඳහා පිසූ ආහාර, වියළි ආහාර, ඇඳුම් පැළඳුම්, තාවකාලික නිවාස (Tent) ලබා දෙන ලද අතර ඒවා ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් බෙදා දෙන ලදී.

- සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධීකරණය කොට අදාළ සෞඛ්‍ය කණ්ඩායම් ආරක්ෂිත ස්ථාන කරා යොමු කිරීම සිදු කරන ලදි. පරිසර අමාත්‍යාංශයේ සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය සමඟ සම්බන්ධව ප්ලාස්ටික් සහ පොලිතීන් එකතු කොට ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි.

- මෙයට අමතරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් කුලී පදනම මත ලබාගත් ධීවර බෝට්ටු සහ රාජ්‍ය නොවන සංවිධානයකින් ලබාගත් බෝට්ටු **47**ක් පමණ මැයි **18** සිට **22** දක්වා කාලය තුළ අවතැන් වූ පුද්ගලයන් බේරාගැනීම සඳහා යොදවන ලදි.

➢ ප්‍රබල / දැඩි සුළං

2016 වර්ෂයේ දැඩි සුළං සිද්ධි **83**ක් වාර්තා වූ අතර පවුල් **1,846**ක් ඉන් විපතට පත් වූහ. මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, මාර්ග එලි පෙහෙලි කිරීම, සන්නිවේදන සහ විදුලිබල සැපයීම්

ප්‍රතිස්ථාපනය කිරීම සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහාය ඇතිව විපතට පත්වූවන්හට සහන ලබාදීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හැකි විය. මෝසම් කාලය ඇරඹීමට පෙර තම නිවාස අසල ඇති අනතුරුදායක ගස් සහ අතු ඉවත් කර ගන්නා ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මහජනතාවට උපදෙස් ලබා දෙන ලදි.

- කැලෑ / අනෙකුත් ගිනිවලදී හදිසි අවස්ථා ප්‍රතිචාර කටයුතු

2016 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ නගර තුළ ගිනි ගැනීමේ සිද්ධි **29**ක් ද, කැලෑ ගිනි ගැනීම් සිද්ධි **29**ක් ද, වාර්තා වූ අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සතු කාර්යක්ෂම සන්නිවේදන ජාලය උපයෝගී කොට ගෙන කඩිනමින් පොලිසියේ, ගුවන් හමුදාවේ සහ යුධ හමුදාවේ සහාය ලබා ගනිමින් ගිනි නිවාරණ කටයුතු සිදු කරන ලදී. මිනිසුන්ට, දේපළවලට සහ පරිසරයට සිදුවිය හැකි විශාල පරිමාණයේ හානි මෙමඟින් වළක්වා ගැනීමට හැකි විය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ගම්වාසීන්ගේ සහාය ඇතිව මෙම කැලෑ ගිනි පාලනය කිරීම සඳහා යුධ සහ ගුවන් හමුදාව සහ පොලිස් නිලධාරීන් කඩිනමින් යෙදවීමට මෙමඟින් හැකි විය.

- පිපිරීම්

2016.06.05 වන දින ශාලාව යුධ හමුදා කඳවුරේ අවි ගබඩාව පිපිරීම හේතුවෙන් ඇති වූ ගිනි ගැනීම හා සබැඳිව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය **(OCDS)** සමඟ සම්බන්ධීකරණයෙන් ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ඉවත්කිරීම, යොදවා ඇති ගිලන් රථ හා ගිනි නිවීමේ රථ පිළිබඳව ප්‍රදේශය භාර හමුදා නිලධාරී සමඟ සම්බන්ධ වී අවශ්‍යතාවයන් පිළිබඳව විමසීම් කර අනෙකුත් අවශ්‍ය තොරතුරු මහජනතාව වෙත ලබාදී මාධ්‍යයන් වෙත නිකුත් කරන ලදි. ප්‍රජාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදුකර කි.මී **6**ක් දක්වා ජනතාව ඉවත් කිරීමට අවශ්‍ය දැනුම් දීම් හා විදුලිය විසන්ධි කිරීම් කටයුතු සම්බන්ධීකරණ සිදු කරන ලදි.

සීතාවක හා දොම්පේ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ ආරක්ෂිත ස්ථානවල රැඳී සිටින ජනතාවට අවශ්‍ය ආහාර හා ජලය ලබාදීම සඳහා කටයුතු කරන ලදි. සහන කඳවුරුවල සිටින ජනතාවට රාත්‍රී කාලයේදී අවශ්‍ය ද්‍රව්‍යයන් සපයා දෙන ලෙස ජාතික සහන සේවා මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ සිදු කරන ලදි.

- නියඟයෙන් පීඩාවට පත්වූ ජනතාව

2016 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ දිස්ත්‍රික් **23**ක නියඟ හේතු කොට ගෙන විපතට පත්වූ සම්පූර්ණ පවුල් **274,242**ක පුද්ගලයින් **1,025,839** සංඛ්‍යාවක් විය. මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක විසින් සහනාධාර මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබිණි. ට්‍රැක්ටර් බවුසර් මිලදී ගෙන පීඩාවට පත්වූ ජනතාවට ජලය ලබාදීම සඳහා කටයුතු යොදන ලදි.

<u>ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම</u>

ටොගල් රෝප් **88** (මීටර් **200**)ක්,සෙවීම් පහන් **103**ක්,බෝට්ටු **70**ක්, එන්ජින් **28**ක්, එන්ජින් **28**ක්, මෙගා ෆෝන් **01**ක්, උදලු **05**ක්, සවල් **05**ක්, ගම් බූට්ස් **30**ක්, වැහි කබා **2000**ක්, විදුලි පන්දම් **550**ක්, වයර් කටර් **550**ක්, දම්වැල් කියත් **72**ක්, මන්න **280**ක්, දම්වැල් කප්පි **55**ක්, පොරෝ තල **05**, බණ්ඩි

කියත් 05ක්, ඇස් ආවරණ 550ක්, අත්වැසුම් 30ක්, වැහි මාන 1000ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු යොදන ලදි.

හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම ප්‍රතිපාදන

මිලදී ගැනීම් -විස්තරය	මුළු ප්‍රතිපාදන 2016 (රු.) මි.
ටොගල් රෝප් 132 (මීටර් 200)	11.13
බෝට්ටු 70	10.78
PA Sys- 55	6.22
දම්වැල් කියත් 72	4.64
වැහි කබා 2000	2.68
වැහි මාන 1000	2.75
දම්වැල් කප්පි 55	0.275
ඇස් ආවරණ 550	0.23
මන්න 280	0.46
මෙගා ෆෝන් 01	0.15
උදලු 05	
සවල් 05	
ගම් බූට්ස් 30	
පොරෝ තල 05	
බණ්ඩි කියත් 05	
අත්වැසුම් 30	

වගුව 7.1: හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා උපකරණ මිලට ගැනීම





නාවික හමුදාව සඳහා සෙවුම් හා මුදවා ගැනීම් උපකරණ ලබා දෙමින්

ආපදාව	විපතට පත්		මරණ සංඛ්‍යාව	තුවාල සිදු වූ පුද්ගලයන් සංඛ්‍යාව	අතුරුදහන් වූ පුද්ගලයන් සංඛ්‍යාව	හානි වූ නිවාස සංඛ්‍යාව	
	පවුල් සංඛ්‍යාව	පුද්ගල සංඛ්‍යාව				පූර්ණ ලෙස	අර්ධ ලෙස
නියඟය	274,242	1,025,839	-	-	-	-	-
ගං වතුර	110,596	448,833	26	22	0	385	2549
දැඩි සුළං	1,839	7,076	4	3		59	1830
සත්ව පහරදීම්	-	-	1	12	-	-	-

දියේ ගිලීම්	7	14	13	-	5	-	-
අකුණු සැර	38	154	9	9		6	25
නායයෑම්	7,903	28,270	67	9	117	244	1776
කන්ඩ් කඩා වැටීම	3,616	14,041	9	5		30	591
එකතුව	398,241	1,524,227	129	60	122	724	6771

වගුව 7.2: ව්‍යසන මඟින් සිදුවූ අලාභ හානි පිළිබඳ සාරාංශය - (2016 ජනවාරි පළමු වැනි දින සිට දෙසැම්බර් 31 දක්වා)
මූලාශ්‍රය : Desinventor, 2016

7.2 පූර්ව දැනුම්දීම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි, දිස්ත්‍රික් ඒකකවල සහ ග්‍රාමීය මට්ටමේ ප්‍රජාවන් තුළ පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉහළම ප්‍රමුඛතාවය ලබා දී ඇත. පූර්ව දැනුම් දීමේ කුළුණු 77ක් වෙරළ තීරය පුරා විසිරී ඇති අතර කෙටි පණිවිඩ ක්‍රමවේදය හරහා ප්‍රජාවන් දැනුවත් කිරීමේ කටයුතු නවීකරණය කොට නව පද්ධතියක් හරහා ක්‍රියාත්මක කොට ඇත. මේ වන විට දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි පූර්ව දැනුම් දීමේ පද්ධතිය විකාශනය කොට ඇත. තවද VHF ක්‍රමවේදය හරහා බිම් මට්ටම දක්වා සන්නිවේදන කටයුතු විකාශනය කොට ඇත.

- අන්තර් රාජ්‍ය ජාලය (Inter Government Network)

ඩයලොග් ආයතනය Broad band අන්තර්ජාල පහසුකම ඔස්සේ මෙය පෙර තත්ත්වයට වඩා අඩු වියදම් ක්‍රමවේදයක් ලෙස ස්ථාපනය කිරීමට හැකිවිය. තාක්ෂණික ආයතන, මාධ්‍ය සහ පොලිසිය, ත්‍රිවිධ හමුදාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය සමඟ පූර්ණ ලෙස සම්බන්ධ වී ඇත. මෙම ආයතන 15 අතර බාධාවකින් තොරව සන්නිවේදනය සිදු කිරීම තහවුරු කිරීම සඳහා අංක 03ක් යටතේ මෙම පද්ධතිය ස්ථාපනය කර ඇත. තවද ඩයලොග් Broadband අන්තර්ජාල පහසුකම භාවිතයෙන් හදිසි ආපදා අවස්ථාවකදී සන්නිවේදන කටයුතු විධිමත්ව කරගෙන යෑමට අන්තර් රාජ්‍ය සන්නිවේදන පද්ධතිය කාර්යක්ෂමව පවත්වා ගන්නා ලදි.

- Email පද්ධතිය නවීකරණය කිරීම

තොරතුරු හුවමාරු කරගැනීමේ ක්‍රමවත් ක්‍රමවේදයක් වන Email පහසුකම වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස භාවිතයට ගත හැකිවන පරිදි ස්ථාපිත කිරීම.

- 117 web portal හදුන්වා දීම

හදිසි ආපදා තත්ත්වයන් හි ජනතාවට තම අවශ්‍යතාවයන් web application එකක් භාවිතා කර ඉතා ඉක්මණින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ලබාදීමට හැකිවන පරිදි නව web portal එකක් Virtusa Pvt (Ltd.) ආයතන මැදිහත් වීම යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දෙන ලදි. මෙමඟින් ජනතාවට තම අවශ්‍යතාවයන්, සහන සේවා අවශ්‍යතාවයන් මෙන්ම ආපදාවට ලක්වීම නිසා ඇතිවූ ආපදා තත්ත්වයන්ට අදාළ තොරතුරු ලබාදීමට හැකිවිය.

➢ ශ්‍රී ලංකා ව්‍යසන සම්පත් ජාලය

ශ්‍රී ලංකා ව්‍යසන සම්පත් ජාලය ප්‍රයෝජනයට ගනිමින් එක් එක් දිස්ත්‍රික්කයන්හි වර්තමානයේ පවතින විවිධ උපකරණ හා මානව සම්පත් හඳුනාගනිමින් එම උපකරණ හා මානව සම්පත් හදිසි අවස්ථාවලදි කුලී පදනම මත ලබාගැනීම සිදුකරනු ලබයි. හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගැනීමට එක් එක් දිස්ත්‍රික්කය තුළ පවතින මෙම සම්පත් පිළිබඳ දත්ත පදනම වසරකට වරක් හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් යාවත්කාලීන කරනු ලැබේ.

➢ ඇමතුම් මධ්‍යස්ථානය

වර්ෂ 2013 සිට ක්‍රියාත්මකවන ආපදා කළමනාකරණ ඇමතුම් මධ්‍යස්ථානය (ඇමතුම් අංකය 117) ආපදා අවස්ථාවලදී මහජනතාව සමඟ සන්නිවේදනය කිරීම සඳහා ස්ථාපිත කරන ලදී. ඇමතුම් ක්‍රියාකරුවන් 20 දෙනෙකු බඳවා ගනු ලැබූ අතර දැනට හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය පැය 24 පුරාම ක්‍රියාත්මක වේ. මේ දක්වා ඇමතුම් මධ්‍යස්ථානය වෙත පැමිණිලි ඇමතුම්, හදිසි ඇමතුම්, මග හැරීගිය ඇමතුම් සහ විසන්ධිවූ ඇමතුම් ආදී විවිධාකාරී වූ ඇමතුම් 105,498 අතුරෙන් මෙම වසරේ දෙසැම්බර් 31 දක්වා ඇමතුම් 18,278ක් සඳහා කඩිනම් ප්‍රතිචාර දක්වා ඇත.

➢ 117 දුරකථන මැදිරිය නවීකරණය කිරීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 117 දුරකථන ඇමතුම් මැදිරිය සඳහා නව මෘදුකාංගයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හරහා සිදුකිරීම.

ඇති වූ හදිසි ආපදා තත්වය හේතුවෙන් SLT මනුදම් සේවා වැඩසටහන යටතේ CDMA දුරකථන 98ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ප්‍රදානය කරන ලදුව, ඒ අතුරින් දුරකථන 82ක් පාර්ශවකාර ආයතන අතර බෙදා දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ වූ සන්නිවේදන ජාලය කාර්යක්ෂම කරන ලදී.





➢ හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව (හ.ප්‍ර.ක.)

අත්‍යාවශ්‍ය සේවාවන්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දක්වන පාර්ශව කණ්ඩායම් ආපදා අවස්ථාවකදී අදාළ ආයතන සමඟ සම්බන්ධ වී සම්පත් යෙදවිය හැකි හා හදිසි ප්‍රතිචාර කටයුතු කිරීම ඍජුවම සම්බන්ධ පාර්ශවකාර ආයතනවලින් හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව සමන්විත වේ. 2016 වර්ෂය තුළ ජාතික මට්ටමින් සිදුවූ විශාල ආපදා අවස්ථා දෙකකදී අදාළ සහය හදිසි අවස්ථා ප්‍රතිචාර කමිටුව මඟින් ලබා දීමට ක්‍රියා කරන ලදි. ඒ අනුව 2016 කෑගල්ල දිස්ත්‍රික්කයේ සිදුවූ විශාල

නායයෑම්වලදී අදාළ සහයෝගය ලබාදීම අවශ්‍ය කටයුතු ඉටු කරන ලද අතර හා විපතට පත්වූවන්ට සහනාධාර ලබාදීමේ කටයුතු දින ගණනාවක් පුරාවට ඉටු කරන ලදි.

- ඩෙංගු මර්ධන වැඩසටහන

2016 වර්ෂය තුළදී ද දිස්ත්‍රික්ක **25** තුළම ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක විසින් පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් දිවයින පුරාම ඩෙංගු මර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කරන ලදි. තවද තවදුරටත් ආපදා කළමනාකරණ ඒකකය විසින් ප්‍රදේශයේ සෞඛ්‍ය නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, ගුරුවරුන්, ශිෂ්‍යයින් සහ ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සහයෝගය ලබා ගනිමින් ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතියි.

- හදිසි අවස්ථාවන්හිදී මාධ්‍ය සම්බන්ධීකරණ

ආපදා අවස්ථාවන්හිදී පැය **24** පුරාම සියලුම මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය භාවිතා කරමින් පූර්ව දැනුම්දීම් සිදුකරමින් ජනතාව දැනුවත් කිරීමේ කටයුතු නිරන්තරව සිදු කරනු ලබයි.

- ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (ජා.හ.මෙ.සැ.)

ජා.හ.මෙ.සැ. මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාලගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. ජා.හ.මෙ.සැ. පරිශීලනය කිරීමේ පහසුව සඳහා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම **1**-වෙළුම සහ **2**-වෙළුම ලෙස වෙළුම් දෙකකින් භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලදී. කිසියම් ආයතනයක සක්‍රියතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය ජා.හ.මෙ.සැ. **1**-වෙළුම මඟින්ද, ආයතනික වගකීම් හා කාර්යයභාර්ය, ජා.හ.මෙ.සැ. **2**-වෙළුම මඟින්ද, විස්තර කර ඇත.

භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජා.හ.මෙ.සැ. සඳහා, ඉදිරියේදී ආපදා කළමනාකරණ ජාතික සභාවෙහි අනුමැතිය ලබා ගන්නා තෙක් ජා.හ.මෙ.සැ. **1**-වෙළුම හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරන කටයුතු සඳහා අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ එකඟතාවය ලබා දී ඇත.

2016 වර්ෂය තුලදී කරන ලද හදිසි මෙහෙයුම් අංශයට අදාල අනිකුත් කාර්යයන්

පාසල් සිසුන්, ආරක්ෂක අංශයන්හි නිලධාරීන්, පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන් ආදී කණ්ඩායම් **85**ක් සඳහා හදිසි මෙහෙයුම්, පූර්ව දැනුම්දීම්, ආපදා කළමනාකරණය ආදී විෂයයන් පිළිබඳව වීඩියෝ සම්මන්ත්‍රණ මැදිරිය සහ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය යොදා ගනිමින් කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් **200**කට නොවැඩි ප්‍රමාණයක් සිදු කරන ලදී.

අභියෝග

- තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණික උපකරණ සහ පුහුණු කිරීම

  හදිසි අවස්ථාවක බිම් මට්ටමේ ජනතාව වෙත තොරතුරු සැපයීම සඳහා ඉහත කාර්යක්ෂම සන්නිවේදන පද්ධතියක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සතුවිය යුතුය. ආපදා කළමනාකරණ

මධ්‍යස්ථානය සතුව දැනට පවත්නා සන්නිවේදන සම්ප්‍රේෂණ පද්ධතිය සමස්ත ආපදාවන්ට ලක්විය හැකි ජනතාව ආවරණය කිරීමට තරම් ප්‍රබල මට්ටමක නොපවතී.

- **කාලගුණ වෙනස්කම් හා ඒවායේ අහිතකර බලපෑම්**

  ආපදා අවම කිරීම පියවර සුදානම් කර තිබුණත් ආපදා හටගැනීම වැළැක්විය නොහැකිය. එබැවින් කාලගුණ විපර්යාසවලින් හටගැනෙන අභියෝගවලට මුහුණ දීම සඳහා හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රම බලගැන්වීම උදෙසා වැඩි ප්‍රමුඛතාවයක් දිය යුතුය.

  කාලගුණික වෙනස්කම් නිසා ඉකුත් වසර කිහිපය තුළ අසාමාන්‍ය කාලගුණික රටාවක් අත්දැකීමට ලැබුණි. එබැවින් කෙටි කාලයකදී අධික වර්ෂාපතනයක් ලැබුණු විට අනාවැකි පළ කළ නොහැකි අන්දමේ ආපදා සිදු වේ. අහිතකර කාලගුණික තත්වයකදී නිවාස, යටිතල පහසුකම්, වගාවන්, පශු සම්පත් ආදිය හානියට පත්වේ. එබැවින් පෙර සුදානම්, කාලගුණ විපර්යාසවලට අනුගත වීම ගැන වැඩි අවදානයක් යොමුකල යුතු අතර කාලගුණ විපර්යාසවල අහිතකර බලපෑම ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.

- බෙදා දී ඇති හා ස්ථාපිත කර ඇති ආපදා ප්‍රතිචාර දැක්වීමේ උපකරණ හා ප්‍රචාරණය කිරීමේ උපකරණ හා ප්‍රචාරණය කිරීමේ උපකරණ නඩත්තු කිරීමට අධික මුදලක් වැය වුවද ඒවා නිසි ආකාරයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගත යුතුය.

8. මූල්‍ය ප්‍රගතිය – 2016 දෙසැම්බර් 31

2016 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රු.මී. **978**ක ප්‍රතිපාදන ලබාදෙන ලදි. ඉන් රු.මී. **12.5**ක් ජාතික සභාවේ වියදම් සඳහා ද රු.මිලියන **195**ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුනරාවර්ථන වියදම් සඳහා ද, රු.මී. **770.5**ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන්කර ඇත. මෙම සමස්ත ප්‍රතිපාදන මුදලින් **2016** දෙසැම්බර් මස **31** දින වන විට රු. මී. **724.9**ක මුදලක් පහත දැක්වෙන පරිදි වැයකර ඇත.

වැය විෂය අංකය	වැඩසටහන / ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	මුළු ප්‍රතිපාදන 2016 (සංශෝධිත) (රු. මී.)	ලැබුණු ප්‍රතිපාදන 2016 (රු.මී.)	මුළු වියදම 2016 (රු. මී.)
106-2-3-1-1503	ආපදා කළමනාකරණ ජාතික සභාව (NDMC)	**12.5**	**1.5**	**1.4**
106-2-3-2-1503	පුනරාවර්ථන වියදම් (DMC)	**195**	**195**	**194.25**
	ප්‍රාග්ධන වියදම්			
106-2-3-2401	පුහුණු හා හැකියා වර්ධනය	**2.5**	**2.5**	**2.47**
106-2-3-3-2201	දිස්ත්‍රික්වල ආපදාවන්හි බලපෑම් අවම කිරීමට ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	**500**	**443.2**	**421.58**
106-2-3-4-2201	හදිසි ගංවතුර හා නියඟ අවස්ථාවන්ට මුහුණ දීමට උපකරණ මිලට ගැනීම.	**75**	**75**	**71.8**
106-2-3-5-2201-I	ආපදා පෙර සුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම - දැනුවත් කිරීම් අංශය	**12.5**	**12.5**	**11.96**
106-2-3-5-2201-II	ආපදා පෙර සුදානම් හා කළමනාකරණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම - පෙර සුදානම් අංශය	**12.5**	**12.5**	**11.35**
106-2-3-6-2201	ගංවතුර අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති	**100**	**-**	**-**
106-2-3-7-2201	ශ්‍රී ලංකාව සඳහා බහු විධි ආපදා අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම	**68**	**10.17**	**10.1**
	මුළු ප්‍රාග්ධන වියදම්	**770.5**	**555.87**	**529.26**
	මුළු වියදම් - (පුනරාවර්ථන හා ප්‍රාග්ධන)	**978**	**752.37**	**724.91**

වගුව **8.1: 2016.12.31** දිනට මූල්‍ය ප්‍රගතිය

2016 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන්	2016	2015 (නැවත සඳහන් කරන ලද)	2015 (විගණනය කරන ලද)
		රු. .ශත.	රු. ශත.	රු. ශත.
ආදායම	01	195,000,000.00	167,119,514.00	167,119,514.00
වෙනත් ආදායම්	02	187,216,586.25	198,850,659.63	195,351,155.31
		382,216,586.25	365,970,173.63	362,470,669.31
පරිපාලන වියදම්	03	(377,524,745.74)	(373,688,176.81)	373,722,384.06
වෙනත් වියදම්	04	(10,851,314.92)	(4,537,469.33)	4,511,174.17
මෙහෙයුම් වලින් අතිරික්තය / (ඌණතාවය)		(6,159,474.41)	(12,255,472.51)	(15,762,888.92)
මූල්‍ය වියදම්		-	-	-
බදු අයකිරීමට පෙර අතිරික්තය / (ඌණතාවය)		(6,159,474.41)	(12,255,472.51)	(15,762,888.92)
බදු අයකිරීම		-	-	-
වර්ෂය සඳහා මුළු අතිරික්තය/(ඌණතාවය)		(6,159,474.41)	(12,255,472.51)	(15,762,888.92)

1 සිට **17** දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වල ඇමුණූ ආකෘතිය මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ
මධ්‍යස්ථානය

2016 දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2016 රු. ශත.	2015 (නැවත සඳහන් කරන ලද) රු. ශත.	2015 (විගණනය කරන ලද) රු. ශත.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	05	1,146,812,194.17	1,285,538,301.94	1,285,538,301.94
ජංගම වත්කම්				
කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති	06	22,708,287.86	203,166,796.20	203,166,796.22
තොගයේ ආපදා ප්‍රතිචාර උපකරණ	07	51,449,284.34	33,706,203.05	33,706,203.05
ඉන්වෙන්ට්‍රි	08	4,380,582.08	2,574,007.56	2,574,007.56
පෙරගෙවුම් හා අත්තිකාරම්	09	9,306,995.63	2,906,314.37	2,906,314.37
තැන්පතු හා වෙනත් ලැබියයුතු දෑ	10	1,653,509.55	1,723,808.72	1,723,808.72
මුදල් සහ මුදල් හා සමාන දෑ	11	30,353,922.06	23,520,286.72	23,520,286.72
මුළු ජංගම වත්කම්		**119,852,581.52**	**267,597,416.62**	**267,597,416.64**
මුළු වත්කම්		**1,266,664,775.69**	**1,553,135,718.56**	**1,553,135,718.58**
අරමුදල්, සංචිත හා වගකීම්				
ශුද්ධ වත්කම්/හිමිකම්				
සමුච්චිත අරමුදල්		(51,438,043.14)	(41,805,359.48)	45,278,568.73)
සංචිත				
භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන දීමනා		812,532,905.28	833,185,769.81	833,185,769.81
වත්කම් ප්‍රාග්ධන දීමනා - භාණ්ඩාගාරය		10,740,000.00	7,505,000.00	7,505,000.00
ICET වත්කම් ප්‍රාග්ධන දීමනා		1,075,226,667.42	1,244,186,078.53	1,244,186,078.53
ප්‍රාග්ධන දීමනා මත ආයෝජනය	12	(617,916,270.94)	(525,322,864.53)	525,322,864.53)
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		**1,229,145,258.62**	**1,517,748,624.33**	**1,514,275,415.08**

(තවදුරටත්) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ජංගම නොවන වගකීම්				
වෙනත් සංවිධානව වලින් දීමනා	13	8,454,707.50	11,506,391.11	14,979,600.38
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	14	23,408,696.82	21,174,185.63	21,174,185.63
ජංගම වගකීම්				
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	15	5,450,101.19	2,500,505.93	2,500,505.93
වෙනත් ප්‍රතිපාදන	16	206,011.56	206,011.56	206,011.56
මුළු ජංගම වගකීම්		**5,656,112.75**	**2,706,517.49**	**2,706,517.49**
මුළු වගකීම්		**37,519,517.07**	**35,387,094.23**	**38,860,303.50**
මුළු අරමුදල් හා වගකීම්		**1,266,664,775.69**	**1,553,135,718.56**	**1,553,135,718.58**

1 සිට 17 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වල ඇමුණූ ආකෘතිය මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන **2016** දෙසැම්බර් **31** දිනට කටයුතු හා වර්ෂය අවසානය සඳහා අතිරික්තය/(ඌණතාවය) පිළිබඳව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බව අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන රජයේ නීති හා රෙගුලාසි සමග අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වගකියනු ලැබේ.

නිශාන්ත අබේසිංහ
සහකාර අධ්‍යක්ෂක -(මූල්‍ය)
ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය
දිනය

ජී.එල්.එස්.සේනාධීර
අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කලමණාකරණ මධ්‍යස්ථානය
දිනය

2016 දෙසැම්බර් **31** දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2016	**2015 (නැවත සටහන් කරන ලද)**	**2015 (විගණනය කරන ලද)**
	රු. ශත.	රු. ශත.	රු. ශත.
බදුවලට පෙර අතිරික්තය / (ඌණතාව)	(6,159,474.41)	(12,255,472.51)	(15,762,888.92)
ගැලපීම්			
ක්ෂය	179,126,454.64	187,020,281.57	187,020,281.57
වත්කම් ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය	(173,699,411.11)	(181,500,222.57)	(181,500,222.57)
පාරිතෝෂික ගෙවීම	(589,034.50)	(236,901.25)	-
මෝටර් වාහන ගැලපුම් ක්‍රමක්ෂය	-	2,897,025.16	2,847,928.63
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන	2,823,545.69	8,936,348.13	8,699,446.88
පසුගිය වසරේ සංඝන්දනාත්මක තොරතුරු නැවත සඳහන් කිරීමේ බලපෑම	(3,473,209.27)	-	-
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/(ඌණතාවය)	**(1,971,128.96)**	**4,861,058.53**	**1,304,545.59**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්			
වෙනත් ලැබියයුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම	70,299.17	(288,645.10)	(288,645.10)
තොග (වැඩිවීම)/අඩුවීම	(1,806,574.52)	313,937.90	313,937.90
තොග වල ආපදා ප්‍රතිචාර උපකරණ වල (වැඩිවීම)/අඩුවීම	(17,743,081.29)	(20,512,794.57)	(20,512,794.57)
පෙරගෙවීම් හා අත්තිකාරම් වල (වැඩිවීම)/ අඩුවීම	(6,400,681.26)	6,363,020.86	6,363,020.86
වෙනත් ගෙවියයුතු දෑ වල වැඩිවීම/(අඩුවීම)	2,949,595.26	(846,198.88)	(846,198.88)
වෙනත් ප්‍රතිපාදන වල වැඩිවීම/(අඩුවීම)	-	-	-
ප්‍රාග්ධන WIP වැඩ ව්‍යාපෘති වල (වැඩිවීම)/අඩුවීම	180,458,508.36	(125,903,932.97)	(125,903,932.97)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**155,556,936.74**	**(136,013,554.23)**	**(139,570,067.17)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
දේපළ, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම	(32,425,346.87)	(11,787,926.53)	(11,787,926.53)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(32,425,346.87)**	**(11,787,926.53)**	**(11,787,926.53)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
ප්‍රග්ධන දීමනා ලැබීම	504,670,000.00	684,500,000.00	684,500,000.00
ප්‍රාග්ධන දීමනා ගෙවීම්	(617,916,270.92)	(525,322,864.53)	525,322,864.53)
රාජ්‍ය නොවන සංවිධාන/ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වලින් ශුද්ධ දීමනා	(3,051,683.61)	6,389,177.99	9,945,691.37
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ	**(116,297,954.53)**	**165,566,313.46**	**169,122,826.84**

ශුද්ධ මුදල් ප්‍රවාහය			
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස්කම්	6,833,635.34	17,764,832.70	17,764,832.70
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	23,520,286.72	5,755,454.02	5,755,454.02
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)	**30,353,922.06**	**23,520,286.72**	**23,520,286.72**
බැංකුවේ ඇති මුදල්	**30,353,922.06**	**23,464,131.47**	**23,464,131.47**
අතැති මුදල්	**-**	**56,155.25**	**56,155.25**
	30,353,922.06	**23,520,286.72**	**23,520,286.72**

1 සිට 17 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වල ඇමුණූ ආකෘතිය මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංස්ථාපිත තොරතුරු

1.1 පදිංචිය සහ නීතිමය ආකෘතිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ආපදා කළමනාකරණය සඳහා වන ජාතික කවුන්සලයට සහාය වීම සඳහා **2005** අංක **13** දරන පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. අමාත්‍යාංශයේ නම **2015** ජනවාරි මස මහජන සාමය, ආපදා කළමනාකරණ හා ක්‍රිස්තියානු කටයුතු අමාත්‍යාංශය ලෙස වෙනස්විය. නැවතත්, එම වර්ෂයේදීම අමාත්‍යාංශයේ නම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ලෙස වෙනස්විය.

1.2 සංස්ථාගතකරන ලද රට

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය **2005** අංක **13** දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇත.

1.3 ප්‍රධාන මෙහෙයුම් මූලස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය කොළඹ **07**, විද්‍යා මාවතේ පිහිටා ඇත. සම්බන්ධීකාරක ඒකක **25** ක් සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම පිහිටා ඇත.

1.4 මූලික ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙවර වන්නේ ස්වභාවික, තාක්ෂණික හා මිනිසා විසින් කරන ලද ආපදා ක්‍රමානුකූල කළමනාකරණය කිරීම හරහා ප්‍රජාවන් හා ජාතිය අතර බෙහෙවින් සුරක්ෂිත සංස්කෘතියක් නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම වේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැක්ම වන්නේ ,"ශ්‍රී ලංකාවේ වඩාත් සුරක්ෂිත ප්‍රජාවන් හා තිරසාර සංවර්ධනය" වේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 සංසන්දනාත්මක ප්‍රකාශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියල කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, හිමිකම්/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයෙන් හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. තවද, එය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකස්කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

2.1.2 සකස්කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කරන මෙම ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය හෝ තක්සේරුකරණය මත සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන වලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් කර නැත. යෝග්‍ය අවස්ථාවල භාවිතා කර ඇති විශේෂ ප්‍රතිපත්ති, ඉදිරි සටහන් වල විස්තර කර ඇත.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.3 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක සංඛ්‍යා අවශ්‍ය අවස්ථාවලදී වර්තමාන වර්ෂය සමග තහවුරු කිරීමට නැවත සකස්කර හා නැවත වර්ගීකරණ කර ඇත.

2.1.4 මූල්‍ය වර්ෂය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වර්ෂය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කැලැන්ඩර් වර්ෂය වේ.

2.2 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය අඩුකර පිරිවැයෙන් හෝ තක්සේරුකරණයෙන් ප්‍රකාශිත වේ. ක්ෂය සඳහා ප්‍රතිපාදන සියලු දේපළ, පිරියත හා උපකරණ වල පිරිවැය හෝ තක්සේරුකරණය මත ගණනය කර ඇත.

	අනුපාතය (%)
ගොඩනැගිල්ල සහ ව්‍යුහය	2.5
සුනාමි හා පූර්ව අනතුරු ඇගවීමේ කුළුණ	5
කාර්යාල උපකරණ	10
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10
පරිගණක හා උපාංග	10
මෝටර් රථ	20
විදුලි සංදේශ උපකරණ	5-20
ගිණුම්කරණ මෘදුකාංග	20

2013 ට පෙර ක්ෂය මගින් භාවිතා වන මිලදී ගත්/ඉදිකල වත්කම් ඉදිරිපත් කර ඇත. මිලදී ගත්/ඉදිකල වර්ෂයේ ක්ෂයවීම් අයකර නොගන්නා හෙයින් ද වත්කම බැහැර කරන වර්ෂයේදී එය සම්පූර්ණයෙන් ක්ෂය කරන හෙයින් ද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එහි ක්ෂය කිරීමේ ක්‍රමය වෙනස්කර ඇත.

2.3 විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයන්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කළ සෑම වර්ෂයක් වෙනුවෙන්ම ලිත් වර්ෂයේ

අවසන් මාසය සඳහා වූ වැටුපෙන් අඩක් ගණනය කර ගිණුම් හරහා ප්‍රතිපාදන සකස් කර ඇත. මෙම ප්‍රතිපාදන බාහිර වශයෙන් මූල්‍යකරණය කිරීමක් හෝ ආයුගණක ලෙස ඇගයීමක් සිදු කර නොමැත.

2.4 වෙනත් ලැබිය යුතු දෑ

වෙනත් ලැබිය යුතු දෑ අපේක්ෂිත සාක්ෂාත් කරගතහැකි වටිනාකමක් මත ගෙන යයි. වසර අවසානයේදී සියලුම ලැබිය යුතු ප්‍රමාණයන් සමාලෝචනය කොට ඒ මත පදනම්ව සැකසහිත ලැබිය යුතු දෑ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරනු ලැබේ. බොල් ණය ඒවා හඳුනාගත් වර්ෂය තුල කපා හරිනු ලැබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉදිරියට...)

2.5 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් හා මුදල් සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් වලින් සමන්විත වේ.

2.6 වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයෙන් පසු ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලන අතර මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය අවස්ථාවලදී ගැලපීම් හා අනාවරණ සිදුකරයි.

2. වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේදී සියලු දන්නා වගකීම් ගිණුම්ගත කර ඇත.

2.8 නිශ්චිත දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාර අරමුදල් දායකත්වයට සේවකයන් සුදුසුකම් ලබති. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා ආයතනය මුළු ඉපයීම්වලින් පිළිවලින් 12% ක් හා 3% ක් දායක කරයි.

2.9 ආදායම

2.9.1 පුනරාවර්තන ස්වභාවයේ දීමනා

ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 - රජයේ දායකය හා රජයේ සහය අනාවරණය සඳහා ගිණුම්කරණය හි 29, 30 හා 31 වගන්තීන්ට ප්‍රකාරව, පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අස්ථිත්වයට ලැබුණු දීමනා හා අස්ථිත්වය විසින් ජනනය කරගත් ආදායම ද සෘජුවම වෙනත් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනාගෙන ඇත.

2.9.2 ප්‍රාග්ධන ස්වභාවයේ දීමනා

ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 - රජයේ දීමනා හා රජයේ සහය අනාවරණය සඳහා ගිණුම්කරණය හි 29 හා 30 වගන්තීන්ට ප්‍රකාරව, ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අස්ථිත්වයට ලැබුණු දීමනා අදාල වියදම් වාර්තා කිරීමේදී අඩු කර ඇත.

2.1.0 වියදම් හඳුනාගැනීම

වසර සඳහා වියදම් අනුව ආදායම ගණන් බැලීමේදී අස්ථිවය ක්‍රියාත්මක වීමේදී ඇති වන පුනරාවර්තන ස්වභාවයේ ඇති සියලු වියදම් ආදායමෙන් අඩු කර ඇත.

2.1.1 තොග

තොග තථ්‍ය පිරිවැය මත ඇස්තමේන්තු කරන අතර පළමුව ඇතුලුවන හා පළමුව පිටවන පදනම මත නිකුත් කරයි. තොගවල අවසාන ශේෂ අවාසානයේ මිලට ගත් මිල මත තක්සේරු කරයි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	2016	2016	2015 (නැවත සඳහන්)	2015 (විගණනය කරන ලද)
		රු. ශත.	රු. ශත.	රු. ශත.
සටහන 01 - අදායම්				
පුනරාවර්තන වියදම් සඳහා දායකය		195,000,000.00	167,119,514.00	167,119,514.00
		195,000,000.00	**167,119,514.00**	**167,119,514.00**

ලංකා ගිණුම් ප්‍රමිති 20 - රජයේ දීමනා හා රජයේ සහය අනාවරණය සඳහා ගිණුම්කරණය ට ප්‍රකාරව, පුනරාවර්තන වියදම් සඳහා පොදු භාණ්ඩාගාරයෙන් අස්ථිත්වයට ලැබුණු දීමනා හඳුනාගෙන ඇත. ප්‍රමිතියට අනුව රජයේ දායකය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ලැබෙන තුරු දීමනා හඳුනානොගත යුතුය. එම නිසා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පුනරාවර්තන දීමනා වල රිසිට් පත පමණක් 2016 දෙසැම්බර් 31 දිනට ආදායම ලෙස හඳුනාගෙන ඇත. නමුත් ආදායමට අනුව වියදම් සිදුවූ පදනම මත ගණන් බලා තිබේ.

සටහන **02** - වෙනත් ආදායම්	රු. ශත.	රු. ශත.	රු. ශත.
Oxfam සහාය	140,000.00	-	-
UNDP සහාය	-	271,382.00	271,382.00
ADPC සහාය	1,140,000.00	1,140,000.00	-
ආරක්ෂිත දිනය පරිත්‍යාග සඳහා UNDP සහාය		990,000.00	990,000.00
කොළඹ කොටස් වෙළඳපොළෙහි සහාය	186,292.50	-	-
රතු කුරුස සංවිධානයේ සහාය	39,975.00	-	-
ජාතික ආපදා කළමනාකරණ කවුන්සිලය	40,878.40	-	-
ටෙන්ඩර් තැන්පතු - ආපසු මුදල් ලබා ගත නොහැකි	57,500.00	85,500.00	85,500.00
විවිධ ආදායම්	93,117.73	145,106.12	145,106.12
ප්‍රාග්ධන දීමනා මත ක්‍රමක්ෂය - **(සටහන 2:1)**	173,699,411.11	184,348,151.20	181,500,222.57
WHO සහාය	119,348.84	627,585.00	627,585.00
UNHABITAT සහාය	23,331.20	7,704,531.09	7,704,531.09
ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය	1,969,339.28	1,530,820.00	-
ADPC Safety Day ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානයේ සහාය	95,799.00	-	-
වැඩමුළුව සඳහා සාර්ක් සංවිධානයේ සහාය	10,000.00	-	-
ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහාය	1,500,000.00	1,000,000.00	1,000,000.00
රක්ෂණ හිමිකම පැම	31,050.00	27,550.00	27,550.00
අවශ්‍යතා තක්සේරු වැඩසටහන සඳහා සාර්ක් සංවිධානයේ සහාය	-	151,349.90	151,349.90
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතිය සඳහා චීනයේ සීමාසහිත කැමක් ඉංජිනේරු සමාගමේ සහාය	1,000,000.00	-	-
IDMP සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය	396,400.00	396,400.00	-
RSSDP සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය	840,069.80	36,045.00	-
SFDRR සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය	321,122.43	321,122.43	-
DOSEG සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහාය	1,477,164.96	75,117.00	-
2016 මැයි මස ගංවතුර ප්‍රතිචාරය සඳහා සහාය	4,035,786.00	-	-
	187,216,586.25	**198,850,659.63**	**195,351,155.31**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් -2016

සටහන 02 - වෙනත් ආදායම්

අනු සටහන - 02:01 වත්කම් ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය

ප්‍රදානය කරන ලද වත්කම්	**2016.01.01** දිනට මුළු පිරිවැය	වර්ෂයේ එකතුකිරීම්/ආයෝජන	පෙර වසර ගැලපීම්	**2016.12.31** දිනට මුළු පිරිවැය
	රු. ශත.	රු. ශත.	රු. .ශත.	රු. ශත.
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුලුණු	426,286,941.28			426,286,941.28
කාර්යාල උපකරණ	5,916,010.90			5,916,010.90
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	558,600.00			558,600.00
මෝටර් රථ	259,413,229.98			259,413,229.98
විදුලිසංදේශ උපකරණ	1,547,757,171.74			1,547,757,171.74
පරිගණක හා උපාංග	66,762,750.01			66,762,750.01
මෝටර් රථ – වෙනත් භාණ්ඩාගාර	23,700,000.00	7,975,000.00		31,675,000.00
	2,330,394,703.91	7,975,000.00	-	2,338,369,703.91

ක්‍රමක්ෂය	**2016.01.01** දිනට සමුච්චිත ශේෂය	වර්ෂය සඳහා ක්‍රමක්ෂය	පෙර වසර ගැලපීම්	**2016 .12.31**දිනට සමුච්චිත ශේෂය
ICET මෝටර් රථ	259,152,195.79	261,034.19		259,413,229.98
ICET සුනාමි හා පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	111,899,343.64	21,314,347.06		133,213,690.70
ICET පරිගණක හා උපාංග	30,257,549.27	6,676,275.00		36,933,824.27
ICET කාර්යාල උපකරණ	5,182,170.90	183,460.00		5,365,630.90
ICET විදුලිසංදේශ උපකරණ	645,842,104.57	140,468,434.86		786,310,539.43
ICET ගෘහභාණ්ඩ හා සවිකිරීම්	335,160.00	55,860.00		391,020.00
මෝටර්රථ වෙනත් භාණ්ඩාගාර	16,195,000.00	4,740,000.00		20,935,000.00
	1,068,863,524.17	173,699,411.11	-	1,242,562,935.28

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එහි **2015** සම්බන්ධයෙන් වත්කම්වල ප්‍රාග්ධන දායකයන් ක්‍රමක්ෂය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති **20** - රජයේ දායකය හා රජයේ සහය අනාවරණය සඳහා ගිණුම්කරණය ට අනුකූලව වෙනස් කර ඇත. ඉහත ප්‍රතිපත්ති වෙනස්කිරීම සඳහා ගණකාධිකරණ පිළියම ලංකා ගිණුම්කරණ ප්‍රමිති- **8**, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්කම් හා වැරදි හි සඳහන් අතීත යෙදුම මගින් සිදු කරන ලදී.

සටහන 03 - පරිපාලන වියදම්	2016 රු. ශත.	2015 රු. ශත.	2015 (විගණනය කරන ලද) රු. ශත.
ක්ෂය			
පරිගණක	8,844,456.09	8,818,191.09	8,818,191.09
කාර්යාල උපකරණ	1,943,378.05	1,942,488.05	1,942,488.05
ගිණුම්කරණ මෘදුකාංග	80,625.00	107,500.00	107,500.00
වාහන	5,001,034.19	13,436,202.25	13,436,202.25
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	642,634.18	640,294.25	640,294.25
සුනාමි හා පූර්ව අනතුරු ඇගවීමේ කුළුණු	21,366,091.07	21,366,091.07	21,366,091.07
දුරකථන උපකරණ	141,248,236.06	140,709,514.86	140,709,514.86
නඩත්තු කිරීමේ වියදම්			
වාහන නඩත්තු කිරීම	13,206,475.52	11,364,219.73	11,364,219.73
පිරියත යන්ත්‍ර හා වෙනත් උපකරණ නඩත්තු කිරීම	11,374,572.84	10,216,494.63	10,216,494.63
පෞද්ගලික වියදම්			
වැටුප් හා වේතන වියදම් ගිණුම	49,234,858.08	44,706,750.18	44,706,750.18
රියදුරු නිලඇඳුම් දීමනා	-	136,000.00	136,000.00
අතිකාල වියදම්	6,409,466.84	4,319,858.54	4,319,858.54
DMC සේවක අර්ථ සාධක අරමුදල දායකත්වය **(12%)**	13,014,858.30	11,705,037.08	11,705,037.08
වෙනත් දීමනා	54,752,161.09	51,951,060.00	51,951,060.00
DMC සේවක භාරකාර අරමුදල දායකත්වය **(3%)**	3,147,491.82	2,876,463.18	2,876,463.18
විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීම සඳහා ප්‍රතිපාදන	2,823,545.69	8,936,348.13	8,936,348.13
සේවා			
AMC ගෙවීම්	120,000.00	28,000.00	28,000.00
වෙනත් වියදම්	400,804.16	552,262.96	552,262.96
විදුලිය සහ ජලය	11,933,442.79	10,710,750.94	10,710,750.94
ආරක්ෂක සේවය	834,010.78	1,529,040.54	1,529,040.54
ගමනාගමන අයකිරීම්	13,300.00	-	-
සනීපාරක්ෂක සේවා	1,091,709.58	1,088,166.73	1,088,166.73
විමසීම් ගාස්තු	-	37,725.00	37,725.00
කුලී හා දේශීය බදු	682,672.00	624,723.58	624,723.58
IMC ගෙවීම්	452,191.46	187,649.50	187,649.50
සම්මුඛ පරීක්ෂණ සම්බන්ධ වියදම්	21,738.00	1,725.00	1,725.00
කැපැල් හා විදුලි සංදේශ	9,061,101.41	8,263,874.48	8,263,874.48
දැන්වීම්	580,771.00	187,696.50	187,696.50
පරිවර්තක ගාස්තු	17,160.00	273,548.00	273,548.00
ප්‍රගති සමාලෝචන රැස්වීම් වියදම්	-	202,694.00	202,694.00
සැපයුම්			
ආහාරපාන වියදම්	562,700.74	240,078.55	240,078.55
මුද්‍රණ, ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	3,168,975.85	3,182,018.36	3,182,018.36
පුවත්පත් හා වෙනත්	38,460.00	72,970.00	72,970.00
ඉන්ධන වියදම්	8,779,330.89	7,729,214.17	7,729,214.17
සංචාරක හා යැපුම් වියදම්			
සංචාරක හා යැපුම් වියදම් - දේශීය	3,773,245.11	2,874,994.21	2,874,994.21
සංචාරක හා යැපුම් වියදම් - විදේශීය	2,903,247.15	2,702,738.50	2,702,738.50
	377,524,745.74	373,688,176.81	373,722,384.06

2016 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	**2016**	**2015** (නැවත සඳහන් කරන ලද)	**2015** (විගණනය කරන ලද)
	රු. ශත.	රු. ශත.	රු. ශත.
සටහන **04** වෙනත් වියදම්			
Oxfam සහාය	140,000.00	-	-
UNDP සහාය	-	19,382.00	19,382.00
ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානයේ සහාය	-	1,140,000.00	1,140,000.00
කොළඹ කොටස් වෙළඳපොළෙහි සහාය	176,097.50	-	-
රතු කුරුස සංවිධානයේ සහාය	39,975.00	-	-
NDMC වියදම්	1,406,250.00	336,348.00	336,348.00
වෙනත්	617,957.42	-	-
ජාතික සෞඛ්‍ය සංවිධානය වෙතින් වියදම්	145,644.00	627,585.00	601,289.84
ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම වෙතින් වියදම්	438,519.28	1,418,320.00	1,418,320.00
වැඩමුළුව සඳහා සාර්ක් සංවිධානයෙන් වියදම්	-	10,000.00	10,000.00
SAARC අවශ්‍යතා තක්සේරු වැඩසටහනෙන් වියදම්	-	151,349.90	151,349.90
ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානයේ - ආරක්ෂිත දිනය වෙතින් වියදම්	-	5,800.00	5,800.00
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතිය සඳහා චීනයේ සීමාසහිත කැම්ක් ඉංජිනේරු සමාගමෙන් වියදම්	1,000,000.00	-	-
IDMP වෙතින් වියදම්	-	396,400.00	396,400.00
RSSDP වෙතින් වියදම්	804,024.80	36,045.00	36,045.00
SFDRR වෙතින් වියදම්	-	321,122.43	321,122.43
DOSEG වෙතින් වියදම්	2,047,060.92	75,117.00	75,117.00
2016 මැයි මස ගංවතුර ප්‍රතිචාර වියදම්	4,035,786.00	-	-
	10,851,314.92	4,537,469.33	4,511,174.17

2016 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සටහන 05 - දේපළ, පිරියත හා උපකරණ

ස්ථාවර වත්කම්		2016 01.01 දිනට මුළු පිරිවැය	වර්ෂයේ එකතුකිරීම් හා ස්ථාන මාරුකිරීම්	2016.12.31 දිනට මුළු පිරිවැය	2016.01.01 දිනට ලිඛිත වටිනාකම
		රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
සුනාමී හා පූර්ව අනතුරු ඇගවීමේ කුළුණු	5%	427,321,821.33	-	427,321,821.33	315,008,525.66
කාර්යාල උපකරණ	10%	23,590,191.39	19,998,832.62	43,589,024.01	5,423,019.81
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	10%	6,577,440.01	5,257,567.75	11,835,007.76	2,896,412.62
පරිගණක හා උපාංග	10%	88,447,410.85	7,168,946.50	95,616,357.35	41,673,398.50
මෝටර් රථ	20%	297,462,051.98	7,975,000.00	305,437,051.98	7,766,034.18
විදුලි සංදේශ උපකරණ	5-20%	1,558,531,595.74	-	1,558,531,595.74	912,448,411.17
ගිණුම්කරණ මෘදුකාංග	20%	530,000.00	-	530,000.00	322,500.00
		2,402,460,511.30	40,400,346.87	2,442,860,858.17	1,285,538,301.94

ක්ෂය		2016.01.01 දිනට සමුච්චිත ශේෂය	වසරේ ප්‍රතිපාදන/ගැලපුම්	2016.12.31 දිනට සමුච්චිත ක්ෂය	2016.12.31 දිනට ලිඛිත වටිනාකම
		රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
සුනාමී හා පූර්ව අනතුරු ඇගවීමේ කුළුණු	5%	112,313,295.67	21,366,091.07	133,679,386.74	293,642,434.59
කාර්යාල උපකරණ	10%	18,167,171.58	1,943,378.05	20,110,549.63	23,478,474.38
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	10%	3,681,027.39	642,634.18	4,323,661.57	7,511,346.19
පරිගණක	10%	46,774,012.35	8,844,456.09	55,618,468.44	39,997,888.91
රථවාහන	20%	289,696,017.80	5,001,034.19	294,697,051.99	10,739,999.99
විදුලි සංදේශ උපකරණ	5-20%	646,083,184.57	141,248,236.06	787,331,420.63	771,200,175.11
ගිණුම්කරණ මෘදුකාංග	20%	207,500.00	80,625.00	288,125.00	241,875.00
		1,116,922,209.36	179,126,454.64	1,296,048,664.00	1,146,812,194.17

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2016

සටහන **06** - කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති

ඇස්තමේන්තුගත වැඩ සඳහා සම්පූර්ණව හෝ කොටස් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට යවන අරමුදල් ලෙස හඳුනාගෙන ඇති ප්‍රාග්ධන නොනිමි වැඩ ව්‍යාපෘතිය **2016** දෙසැම්බර් **31** ගිවිසුම අනුව කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති වේ. එම ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුළු ගෙවීම් කාරක ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස සලකන අතර විස්තර පහත පරිදි වේ,

අනු අංකය.	ව්‍යාපෘතිය	ස්වභාවය	දිස්ත්‍රික්කය	වෙන්කිරීම	මුළු ගෙවීම්
				රු. ශත.	රු. ශත.
1.	කුට්ටියාවත්ත සිට මාබෙන් ඇල්ල දක්වා පාර පිරවීම	ගංවතුර	ගාල්ල	9,500,000.00	9,305,287.86
2.	දඬුගම ඔය ප්‍රතිසංස්කරණය කිරීම	ගංවතුර	කුරුණෑගල	13,403,000.00	13,403,000.00
	එකතුව			**22,903,000.00**	**22,708.287.86**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2016

සටහන 07 - තොගයේ ආපදා ප්‍රතිචාරාත්මක උපකරණ		2016		2015	2015 (විගණනය කරන ලද)
අයිතමය	ප්‍රමාණය	මුළු වටිනාකම	ප්‍රමාණය	මුළු වටිනාකම	මුළු වටිනාකම
		රු. ශත.		රු. ශත.	රු. ශත.
දම්වැල් කියත	95	7,114,935.00	50	3,857,250.00	3,857,250.00
ජීවිතාරක්ෂක කබා	43	113,950.00	189	500,850.00	500,850.00
බෝට්ටු එන්ජිම	-	-	11	3,388,000.00	3,388,000.00
බෝට්ටු (බඳ)	70	12,397,000.00	11	2,007,500.00	2,007,500.00
ආ.ක.ම .හඳුනාගැනීමේ කබා	2646	1,309,770.00	2997	1,483,515.00	1,483,515.00
අතින් ක්‍රියා කරන සයිරන්	2	48,840.00	241	5,885,220.00	5,885,220.00
වර්ෂාමාන	1000	2,750,000.00	-	-	-
මන්නකැනි	10	6,328.00	10	6,328.05	6,328.05
සෙවීමේ සහ බේරාගැනීමේ කඹ	132	11,134,200.00	-	-	-
සෙවීම සඳහා යොදාගන්නා විදුලි පහන්	92	160,960.00	67	105,860.00	105,860.00
කට්ටුමරන්	1	134,000.00	50	6,637,500.00	6,637,500.00
වැය ශීර්ෂ 7 යටතේ මිලදී ගත් ගම් බූට්	405	521,478.00	3000	3,862,800.00	3,862,800.00
ජනකය	1	38,080.00	1	38,080.00	38,080.00
ආ.ක.ම .හඳුනාගැනීමේ කබා - UNDP	2000	990,000.00	2000	990,000.00	990,000.00
බේරාගැනීමේ බෑගය	1500	2,475,000.00	2410	3,976,500.00	3,976,500.00
චතුර ටැංකිය 1000 l	46	373,244.00	100	811,400.00	811,400.00
රබර් අත්වැසුම	2150	376,250.00	-	-	-
මුහුණු ආවරණය	2350	317,250.00	-	-	-
STC පොරවල්	5	3,070.05	-	-	-
වානේ සවල් STC	5	2,686.30	-	-	-
ලංලෝ උදලු STC	5	4,250.00	-	-	-
කලු ගම් බූට් STC	30	59,700.00	-	-	-
මෙගා ෆෝන් STC	1	10,700.00	-	-	-
හම් අත්වැසුම් STC	30	9,549.30	-	-	-
මවේට් 12"	280	464,800.00	-	-	-
අයි ගුග්ල්	550	232,375.00	-	-	-
පීඒ සිස්ටම් - DMC A2120 H	55	7,154,618.90	-	-	-
වැහි කබා	2000	3,082,000.00	-	-	-
අත් කියත්	5	8,850.00	-	-	
චතුර පොම්ප BGVSP 2' SP	5	155,400.00	5	155,400.00	155,400.00
මුළු වටිනාකම		**51,449,284.55**		**33,706,203.05**	**33,706,203.05**

වර්ෂය ආරම්භයේදී ආපදා ප්‍රතිචාර උපකරණ තොගය රු. **33, 706,203.05** වූ අතර වර්ෂය තුල ආපදා ප්‍රතිචාර උපකරණ තොගයක් බෙදාහරින ලද නිසා එය රු. **27, 576,153/=** ක් වටිනා ආපදා ප්‍රතිචාර උපකරණ තොග ව්‍යදම් සඳහා මාරු කරන ලදී. තවද **2016** වර්ෂය තුලදී රු.මිලි **43** ක් වටිනා ආපදා කළමනාකරණ උපකරණ මිලදීගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 2016

	2016	2015	2015 (විගණනය කරන ලද)
	රු. ශත.	රු. ශත.	රු. ශත.
සටහන **08** - තොග			
ලිපි ද්‍රව්‍ය	269,774.88	271,004.66	271,004.66
පරිගණක ටෝනර් සහ කාට්රිජ්	1,611,933.00	685,630.00	685,630.00
පත්‍රිකා	36,250.00	58,000.00	58,000.00
පොත් පිංච	966,420.00	966,420.00	966,420.00
රථවාහන අලුත්වැඩියාව හා නඩත්තුව	1,496,204.20	504,452.90	504,452.90
වෙනත්	0.00	88,500.00	88,500.00
මුළු එකතුව	**4,380,582.08**	**2,574,007.56**	**2,574,007.56**
සටහන **09** - පෙරගෙවුම් හා අත්තිකාරම්	රු. ශත.	රු. ශත.	රු. ශත.
අත්තිකාරම් - උත්සවය	175,750.02	303,500.02	303,500.02
අත්තිකාරම් - මුද්දර	19,788.85	18,910.70	18,910.70
පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු සඳහා පෙරගෙවුම්	7,910,812.50	75,000.02	75,000.00
අත්තිකාරම් - මුදල් ප්‍රධාන කාර්යාලය	67,324.35	298,743.95	298,743.95
සූදානම හා සැලසුම් කිරීම - ප්‍රධාන කාර්යාලය	-	8,750.00	8,750.00
පුහුණු කරන ප්‍රධාන කාර්යාලය	-	0.49	0.49
අත්තිකාරම් - සේවා හා නඩත්තු ප්‍රධාන කාර්යාලය	-	2,060.00	2,060.00
අත්තිකාරම් - මුදල් දිස්ත්‍රික්ක	588,463.84	-	-
අත්තිකාරම් - දිස්ත්‍රික්ක වල සූදානම හා සැලසුම් කිරීම	200,165.53	1,315,569.80	1,315,569.80
අත්තිකාරම් - දිස්ත්‍රික්ක වල පුහුණුව හා දැනුවත් කිරීම	98,943.20	431,529.57	431,529.57
අත්තිකාරම් - ඉන්ධන දිස්ත්‍රික්ක	222,763.34	223,898.34	223,898.34
අත්තිකාරම් - සේවා හා නඩත්තු දිස්ත්‍රික්ක	22,984.00	22,984.00	22,984.00
අත්තිකාරම් - කොළඹ කොටස් වෙළඳපොල දිස්ත්‍රික්ක	-	205,367.50	205,367.50
	9,306,995.63	**2,906,314.39**	**2,906,314.37**
සටහන **10** තැන්පතු හා වෙනත් ලැබිය යුතු දෑ	රු. .ශත.	රු. ශත.	රු. ශත.
ඩොන්ගල් මත තැන්පතු	3,000.00	3,000.00	3,000.00
තැන්පතු - ලංකා විදුලිබල මණ්ඩලය	1,108,500.00	1,108,500.00	1,108,500.00
තැන්පතු - ජාතික ජල සැපයුම් හා ජල පවාහන මණ්ඩලය	51,500.00	51,500.00	51,500.00
වෙනත් ලැබිය යුතු දෑ	490,509.55	560,808.72	560,808.72
	1,653,509.55	**1,723,808.72**	**1,723,808.72**
සටහන **11** - මුදල් හා මුදල් සමාන දෑ	රු. ශත.	රු. ශත.	රු. ශත.
ලංකා බැංකුව - 2744646	30,353,922.06	23,464,131.47	23,464,131.47
සුළු මුදල්	-	56,155.25	56,155.25
	30,353,922.06	**23,520,286.72**	**23,520,286.72**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2016

සටහන 12 - ප්‍රාග්ධන දීමනා මත ආයෝජනය	2016 රු. ශත.	2015 රු. ශත.	2015 විගණනය කරන ලද රු. ශත.
ප්‍රාග්ධන වියදම්			
ධාරිතා වර්ධනය - මානව සම්පත් සංවර්ධනය	2,472,535.44	2,115,113.04	2,115,113.04
කුරුණෑගල, මාතර, හම්බන්තොට, කළුතර, මාතලේ, මුලතිව් හා බදුල්ල මධ්‍යම පරිමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	558,548,530.26	367,101,455.22	367,101,455.22
හදිසි අවස්ථාවකදී සුරක්ෂිතව ඉවත් කිරීම	-	19,309,427.21	19,309,427.21
ගංවතුර හදිසි අවස්ථාව සඳහා උපකරණ මිලදී ගැනීම (ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය)	27,774,077.00	52,265,991.99	52,265,991.99
රාජ්‍ය ආයතන වලට සුදානම් වීමේ සැලසුම් සකස් කිරීමට සහාය වීම	11,349,750.88	10,895,758.24	10,895,758.24
පානදුර, කළුතර ප්‍රා.ලේ. කොට්ඨාශවල ගංවතුර අවම කිරීම	-	35,000,000.00	35,000,000.00
දඹුල්ල .ලේ. කොට්ඨාශවල ගංවතුර අවම කිරීම	-	5,000,000.00	5,000,000.00
යාපනය දිස්ත්‍රික්ක වල ගංවතුර අවම කිරීම	-	23,000,000.00	23,000,000.00
දැනුවත් කිරීමේ වැඩසටහන්	11,964,515.10	8,663,038.57	8,663,038.57
පූර්ව අනතුරු ඇගවීමේ පද්ධතියේ ධාරිතා වර්ධනය - එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන	-	284,149.44	284,149.44
පූර්ව අනතුරු ඇගවීමේ පද්ධතියේ ධාරිතා වර්ධනය - එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන අදියර II	-	1,687,930.82	1,687,930.82
ශ්‍රී ලංකාව සඳහා බහු ආපදා අනතුරු පැනිකඩ	5,806,862.26	-	-
ප්‍රාග්ධන දීමනා මත ශුද්ධ ආයෝජනය	**617,916,270.94**	**525,322,864.53**	**525,322,864.53**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

	2016	2015 (නැවත සඳහන් කරන ලද)	2015 (විගණනය කරන ලද)
	රු. ශත.	රු. ශත.	රු. ශත.
සටහන **13** - වෙනත් සංවිධාන වලින් දීමනා			
UNDP එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	966,420.00	966,420.00	966,420.00
ADPC ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය	265,242.30	265,242.30	1405,242.30
CSE කොළඹ කොටස් වෙළඳපොළ	234,493.31	420,785.81	420,785..81
තොරතුරු තාක්ෂණ සම්බන්ධ අයිතම වායු සමීකරණ මිලදී ගැනීම	37,795.22	37,770.22	37,770.22
ලෝක සෞඛ්‍ය සංවිධානය	37,547.41	26,295.16	-
දැයට කිරුළ සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	120,672.92	120,672.92	120,672.92
එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන අදියර II	86,144.48	109,475.68	109,475.68
NEOP ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	4,953.22	193,972.50	1,724,792.50
ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය ආරක්ෂිත දිනය	32,724.85	128,523.85	90,203.85
වැඩමුළුව සඳහා සාර්ක් සංවිධානය	1,755,917.10	1,765,917.10	1,264,594.00
මීරියබැද්ද නිවාස ව්‍යාපෘතිය සඳහා චීනයේ සීමාසහිත කැම්ක් ඉංජිනේරු සමාගම	1,000,000.00	2,000,000.00	2,000,000.00
IDMP සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	1,103,600.00	1,103,600.00	1,500,000.00
RSSDP සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	159,930.20	963,955.00	1,000,000.00
SFDRR සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	981,418.49	978,877.57	1,300,000.00
DOSEG සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	667,848.00	1,424,883.00	1,500,000.00
DRR LGSට ඇතුළත් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	1,000,000.00	1,000,000.00	1,000,000.00
	8,454,707.50	**11,506,391.11**	**14,979,600.38**

සටහන **14** - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

	2016	2015	2015 (විගණනය කරන ලද)
	රු. ශත.	රු. ශත.	රු. ශත.
2016 ජනවාරි **1** දිනට ශේෂය	**21,174,185.63**	12,474,738.75	12,474,738.75
වර්ෂය සඳහා ප්‍රතිපාදන	2,823,545.69	8,936,348.13	8,936,348.13
ගෙවීම්	589,034.50	236,901.25	236,901.25
2016 දෙසැම්බර් **31** දිනට ශේෂය	**23,408,696.82**	**21,174,185.63**	**21,174,185.63**

1983 අංක **12** දරණ පාරිතෝෂක ගෙවීම් පනත යටතේ විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගිණුම් වල සිදුකර ඇති අතර මූල්‍ය වර්ෂයේ අවසන් මස ගත් වැටුපෙන් අඩක අගය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කළ වසර ගණනට අනුව කණනය කරනු ලැබේ. මෙම අයිතමය විලම්බන වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත. ප්‍රතිපාදනයට බාහිර මූල්‍යකරණයක් හෝ ආයුගණක ලෙස ගණනය කිරීමක් කර නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති **19** අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සේවක ප්‍රතිලාභ ප්‍රමිතිය ට ප්‍රකාරව **57** පරිච්ඡේදය හා ඇ උපග්‍රන්ථය අස්ථිත්වයේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා ප්‍රතිපාදනයක් වෙන්කිරීමට මාර්ගෝපදේශය ලබා දී ඇත. ඒ අනුව, අස්ථිත්වවලට සේවාදායකයින් **100**කට වඩා කාර්යමණ්ඩලයක් සිටියි නම්, ඉ උපග්‍රන්ථයේ සපයා ඇති උපදෙස් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ. ඇ **(2)** උපග්‍රන්ථය තුළ භාණ්ඩ අලෙවිය හෝ සේවා සැපයීම සම්බන්ධ රාජ්‍ය සංස්ථා ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්– 2016

	2016	2015	2015 (විගණනය කරන ලද)
	රු. ශත	රු. ශත.	රු. ශත
සටහන **15** - වෙනත් ගෙවිය යුතු දෑ			
ගබඩා භාරකරුවන්ගේ ආරක්ෂිත තැන්පතු	-	3,600.00	3,600.00
ටෙන්ඩර් තැන්පතු –ආපසු ලබාගත හැකි	123,800.00	145,000.00	145,000.00
ගෙවිය යුතු වැටුප් හා වේතන	23,020.00	72,736.47	72,736.47
ගෙවිය යුතු අතිකාල	489,335.75	348,022.11	348,022.11
ගෙවිය යුතු ගමනාකමන වියදම්	195,415.00	180,498.40	180,498.40
ගෙවියයුතු ඉන්ධන වියදම්	415,060.00	-	-
ගෙවිය යුතු රථවාහන නඩත්තු	280,684.00	-	-
ගෙවිය යුතු කුලී හා දේශීය බදු	55,500.00	31,500.00	31,500.00
තැපැල් හා සන්නිවේදන	2,736,238.91	676,353.09	676,353.09
ගෙවිය යුතු විදුලි හා ජලය	905,366.37	837,292.48	837,292.48
ගෙවිය යුතු වෙනත් සේවා	225,681.16	205,503.38	205,503.38
	5,450,101.19	**2,500,505.93**	**2,500,505.93**

සටහන **16** - වෙනත් ප්‍රතිපාදන	**Rs.**රු. **Cts.**ශත.	**Rs.**රු. **Cts.**ශත.	**Rs.**රු. **Cts.**ශත.
තොග අලාභය සඳහා ප්‍රතිපාදන	206,011.56	206,011.56	206,011.56
	206,011.56	**206,011.56**	**206,011.56**

2017 ජූනි **7** වැනි දින වේයන්ගොඩ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ගබඩාවෙන් රු. **206, 011.56** වටිනා ආපදා ප්‍රතිචාර උපකරණ අහිමිවිය. නැතිවූ භාණ්ඩ භාරයේ සිටි නිලධාරියාට එරෙහිව විනය පියවර ගෙන ඇත. පරීක්ෂණයෙන් සොයාගත් කරුණු මත, නිලධාරියාගේ සේවා කොන්ත්‍රාත්තුව අවලංගු කර ඇත. නඩු විභාගය **2016** දෙසැම්බර් මස පැවැත්වේ.

සටහන **17** –සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම සමඟ තහවුරු කිරීමට අවශ්‍ය පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සකස්කර ඇත. එය **2016** සඳහා සංසන්දනාත්මක ශේෂයන්ගේ ආදායම, වියදම සහ වගකීම් ප්‍රමාණ සඳහා සුදානම් කරන ලද මූල්‍ය ප්‍රකාශන නැවත සටහන් කිරීම නිසා සටහන **02, 04** සහ **13** හි මුළු වටිනාකම රු. 3,473,209.27ට බලපා ඇත. මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් හට වැඩිදුර තොරතුරු ලබා ගැනීමට **2016** මූල්‍ය ප්‍රකාශන වල අතිරේක තීරුවක් ලෙස **2015** විගණනය කරන ලද ශේෂ තීරුව සපයා ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } ඩීඑමජී/ඒ/ඩීඑමසී/01/16/13 මෙහි අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2017 නොවැම්බර් 14 දින

අධ්‍යක්ෂ ජනරාල්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අංක 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව බව දක්වා තිබුණද මධ්‍යස්ථානය විසින් ඊට පටහැනිව මිල දී ගත් වර්ෂයේදී ක්ෂය නොකිරීමටත්, අපහරණය කරනු ලබන වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය කිරීමටත් ප්‍රතිපත්තියක් හදුනාගෙන තිබුණි. කෙසේවුවද 2013 වර්ෂයට පෙර මධ්‍යස්ථානය විසින් වත්කම් මිලදී ගත් වර්ෂයේ සිට ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2010 මැයි 10 දින සේවය අවසන් කර ලද නිලධාරියෙකුගෙන් හා 2014 ජනවාරි 06 දින වාහනයක් අනවසරයෙන් ධාවනය කර අනතුරකට ලක්වීම නිසා අදාළ නිලධාරියාගෙන් මධ්‍යස්ථානයට අයවිය යුතු පිළිවෙලින් රු.256,589 ක් සහ රු. 165,645 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රේෂණය කරනු ලබන අරමුදල් උපයෝජනය කළ ආකාරය සහ අදාළ ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු කාලීනව දැනුම් නොදෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුල පිරිවැය රු. 142,104,047 ක් වූ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 48 ක් මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර තිබුණු නමුත් ඒවායේ වැඩ අවසන් කිරීමේ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය මෙන්ම ඒවායේ ඵලදායීභාවය විගණනය කිරීමට නොහැකි විය.

(ආ) මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු පිරිවැය රු.5,475,000 ක් වූ බැකෝ ලෝඩරය සම්බන්ධයෙන් භෞතික පරීක්ෂණ වාර්තා සහ අනෙකුත් උපයෝගී වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවීය.

(ඇ) එකම තක්සේරු වටිනාකමක් සහිත මෝටර් වාහන 30ක් සඳහා විවිධ තක්සේරු වටිනාකම් යටතේ රක්ෂණ වාරික ගෙවා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය සඳහා ගෙවා තිබුණු රු.2,284,431 ක් වූ මෝටර් වාහන 38 ක රක්ෂණ වාරික ගණනය කිරීමේ පදනම විගණනයට පැහැදිළි කර නොතිබුණි.

(ඈ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 05 ඡේදය	පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් වාර 04 ක් වත් පැවැත්විය යුතු බව සඳහන් වුවත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භක දින වූ 2005 ඔක්තෝබර් 12 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 11 ක කාලසීමාව තුල පවත්වා තිබුණේ රැස්වීම් වාර 10 පමණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.	
(i) මුදල් රෙගුලාසි 395 (ඇ)	මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන ඊලඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කළ යුතු වුවත් 2016 ජූලි මස සිට 2016 නොවැම්බර් මාසය දක්වා මධ්‍යස්ථානයේ බැංකු සැසඳුම් ප්‍රකාශන ප්‍රමාදයන් සහිතව පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර 2016 දෙසැම්බර් මාසයට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර තිබුණේ 2017 මාර්තු 22 දිනදීය.

(ii) මුදල් රෙගුලාසි 104	සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 11 කදී සිදු වී තිබුණු මෝටර් වාහන අනතුරු 09 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවන් හෝ පූර්ණ වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i)	3.4.3 මාර්ගෝපදේශය	මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii)	4.2.1 (ආ) මාර්ගෝපදේශය	අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් විය යුතු වුවත් මධ්‍යස්ථානය විසින් පිළියෙල කරන ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කර තිබුණේ සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන කටයුතු පමණි.
(iii)	2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28	වටිනාකම රු. 200,000 ක් ඉක්මවන මෝටර් රථ අළුත්වැඩියාවන් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ පෞද්ගලික අනුමැතිය ලබාගත යුතු වුවද එකතු වටිනාකම රු.1,643,434 ක් වූ මෝටර් වාහන අළුත්වැඩියා 04 ක් සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලයෙ රු.6,159,474 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,255,743 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,396,269 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වෙනත් ආදායම් රු.11,634,074 කින් අඩු වුවද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.27,880,486 කින් වැඩි වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී අතිරික්තයක් පැවතියද අනෙකුත් වර්ෂ 04 හි මූල්‍ය ඌනතාවයන් පැවතුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2012 වර්ෂයේදී රු.272,154,844 ක්වූ දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2016 වර්ෂයේදී රු.238,364,189 ක් වී තිබුණි.

3.2 මධ්‍යස්ථානයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

2012 අගෝස්තු 16 දින මධ්‍යස්ථානය සතුව තිබුණු මෝටර් වාහනයක් අනතුරට ලක් වී පුද්ගලයකු මිය යාම හේතුවෙන් අගතියට පත් පාර්ශවය විසින් 2014 අගෝස්තු 07 දින මඩකලපුව දිස්ත්‍රික් අධිකරණයේ මධ්‍යස්ථානයට එරෙහිව නඩුවක් පවරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කරද නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් පරිදි නම් කරන ලද ප්‍රධාන අවදානම් 21 ක් අවම කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් කටයුතු කළයුතුව තිබුණද, 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාල සීමාව තුලදී එම අවදානම් වලින් 04 ක් සඳහා පමණක් මූලිකත්වය දී කටයුතු කර තිබුණි. යථෝක්ත කාලපරිච්ඡේදය වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් ආපදා අවම කිරීම් සඳහා දරන ලද

රු. මිලියන 1,749.42 ක මුළු වියදමින් ගංවතුර අවදානම අවම කිරීම සඳහා සියයට 63 ක්ද, නියහය මගින් වියහැකි ව්‍යසන අවම කිරීම සඳහා සියයට 22 ක්ද, නායයාම් අවදානම අවම කිරීම සඳහා සියයට 08 ක්ද යොදවා තිබුණු අතර, නම් කරන ලද ඉතිරි ආපදා 18 ක් සම්බන්ධ ආපදා අවදානම් අවම කිරීම් සඳහා මුළු වියදමින් සියයට 07 ක් පමණක් යොදවා තිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ පෙර සූදානම් අංශය මගින් දිස්ත්‍රික් , ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් ආපදා කළමනාකරණ සැලසුම් වාර්ෂිකව සකස්කර ඉදිරිපත් කලයුතු වුවත් දිස්ත්‍රික්ක 13 ක් සම්බන්ධයෙන් වූ සැලසුම් වසර 03 කට වඩා පැරණි බව නිරීක්ෂණය විය. තවද ඉදිරිපත් කර තිබුණු සැළසුම් අනුව දිස්ත්‍රික්ක වල ඉහල ආපදා අවදානම් තිබෙන ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගැනීමට නොහැකි විය. දිස්ත්‍රික් සැලැස්මේ ප්‍රධාන අංගයක් වූ දිස්ත්‍රික්කයේ අවදානම තක්සේරු කිරීම සඳහා වන පෙරසූදානම් සැලැස්ම, හදිසි ප්‍රතිචාර දක්වන සැලැස්ම සහ පුනරුත්ථාපන සැලැස්ම යන සැලසුම් තුල එකී අවදානම් තක්සේරු කිරීමේ යාන්ත්‍රණය හඳුනාගත නොහැකිවීම හේතුවෙන්, එම සැලසුම් නිවැරදිව ක්‍රියාත්මක කලහැකි ක්‍රියාවලියක ස්වරූපයෙන් හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.247,000,000 ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ සංවර්ධන බහු උපද්‍රව අවදානම් දැරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේ රු.68,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.10,804,000 ක වියදමක් දරා ව්‍යාපෘතියට අදාල මෘදුකාංග පද්ධතිය හා පරිගණක උපාංග මිලදී ගැනීම පමණක් සිදු කර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හා ප්‍රගති වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මහා පරිමාණ ව්‍යාපෘතියක් වශයෙන් මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර තිබුණු දඹුල්ල ගංවතුර ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- මෙම ව්‍යාපෘතිය යටතේ තම්මැන්නා ඇළ පුළුල් කිරීම හා ඉවුරු බැම් ඉදිකිරීම් සඳහා කර්මාන්ත 07කට අදාළව රු.මිලියන 42 ක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කළ බවට සාක්ෂි ලැබී නොතිබුණු බැවින් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හා ඵලදායිතාවය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 වගන්තිය අනුව කර්මාන්ත 7 සඳහාම මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කළයුතු වුවද එසේ නොකර කොටස් වශයෙන් ඇස්තමේන්තු සකස් කර තිබුණි.

- කර්මාන්ත 7 න් 3 ක් භෞතිකව පරීක්ෂා කිරීමේදී ගේබියන් තාප්ප ඉදිකිරීම් වෙනුවෙන් රු.5,459,000 ක් ගෙවා තිබුණද ඒ සඳහා නියමිත ප්‍රමාණයෙන් යුතු කළුගල් භාවිතා නොකිරීම නිසා ඒවා නිසි ආකාරව බද්ධ වීමක් සිදු වී නොතිබුණි. තවද, බැම්ම පිටුපස බොරළු දමා ජලය යොදා තැලීම වෙනුවෙන් රු.342,498 ක් ගෙවීම් කර තිබුණද බොරළු වෙනුවට පස් යොදා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ අපදා අවම කිරීම සඳහා වූ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- ව්‍යාපෘතියක් සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීමට ප්‍රථම විධිමත් ව්‍යාපෘති යෝජනාවලියක් සකස් කළ යුතු වුවත් එසේ නොමැතිව දිස්ත්‍රික්ක 08 ක ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 31 ක් වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම රු.121,945,689 ක් වූ මුදල් අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රේෂණය කර තිබුණි.

- තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැඩ ඇස්තමේන්තු නිසියාකාරව සකස් කර නොතිබීම හේතුවෙන් සියයට 15 සිට සියයට 66 ක පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රේෂණය කළ මුදලින් ව්‍යාපෘති නිම කර ඉතිරි වූ මුදල් 2016 දෙසැම්බර් 31 දිනට පෙර මධ්‍යස්ථානය වෙත ලබා දියයුතු වුවත් අනුරාධපුර, රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 31 කින් ඉතිරි වූ රු.8,889,449 ක මුදල එම කාර්යාලවලින් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අදාලව පරිපාලන වියදම් ගණනය කිරීමේදී නිශ්චිත පදනමක් යොදා නොගෙන විවිධ පදනම් යටතේ පරිපාලන වියදම් ගණනය කර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වගන්තිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දී තිබුණි. එසේම මෙම පනත ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු අතර නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව මඟින් 2017 ජූනි 22 දින පනතේ සංශෝධන නැවත සලකා බලා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා ආපසු එවා තිබුණි.

(ආ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.1,034,399,368 ක වියදමක් දරා 2010 වර්ෂයේදී මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මඟින් මධ්‍යස්ථානය වෙත ලැබී තිබුණු යතුරු පැදි 18ක වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒවායේ ධාවන තත්ත්වය , භාරකාරත්වය පිළිබඳ වගකියනු ලබන පාර්ශවයන් යනාදී කරුණු සම්බන්ධ පසු පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම වත්කම් අයථා පරිහරණය මෙන්ම වත්කමේ පැවැත්ම පිළිබඳවද ගැටළු ඇතිවිය හැකි බව විගණනයේ අදහසයි.

4.3 වත්කම් පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය කිරීම" වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් මිලදී ගන්නා ලද පිරිවැය රු.5,000,000 ක් වූ වතුර බවුසරය මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පැවරීම වෙනුවෙන් 2014 මාර්තු 14 දින ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. කෙසේ වුවද එම කාර්යාලය වෙත වතුර බවුසරය ලබාදී තිබුණද 2017 ජූනි 23 දින දක්වාම එහි අයිතිය නිත්‍යානුකූලව පැවරීමක් සිදුකර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් කාර්යාලවල පැවති 2008 වර්ෂයේ සිට ඉවත් කළ යුතු බවට භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් නිර්දේශ කරන ලද භාණ්ඩ විෂයයන් 62 ක් ඉවත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය 2017 පෙබරවාරි මාසය දක්වාම මධ්‍යස්ථානය විසින් ලබා දී නොතිබුණි.

4.4 මූල්‍ය කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.18,023,370 ක් බව තහවුරු වුවද 2016 දෙසැම්බර් 31 දාතමින් නිකුත් කරන ලද රු.67,231,890 ක චෙක්පත් 162 ක් සහ රු.79,562,441 ක ලදුපත් 45 ක් 2016 වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම් සහ ලැබීම් ලෙස සලකා 2017 ජනවාරි 01 දින සිට ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට මුදල් පොතේ ශේෂය රු.30,353,922 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ අනුව ගිණුම් වර්ෂය ඉකුත් වීමෙන් පසුවද පරිගණක ගත ගිණුම් පද්ධතිය විවෘතව තබා ගනිමින් ගනුදෙනු සටහන් කිරීමට නිළධාරීන් කටයුතු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රජයේ අයවැය ඇස්තමේන්තුවේ මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා පිළිවෙලින් රු.770,500,000 ක් හා රු.12,500,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද භාණ්ඩාගාරය විසින් නිදහස් කරන ලද මුදල පිළිවෙලින් රු.504,670,000 ක් හා රු.1,500,000 ක් පමණක් වූ අතර එනම්, එය ඇස්තමේන්තුවෙන් සියයට 65 ක් හා සියයට 12 ක් විය. ඒ අනුව වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂිත මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට මධ්‍යස්ථානය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 මාර්තු 13 වන දින පුද්ගලික ආයතනයක් විසින් මධ්‍යස්ථානය වෙත පරිත්‍යාග වශයෙන් ලබාදී තිබූ රු.2,000,000 ක මුදලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.1,000,000 ක් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) සියළුම ආකාරයේ ආපදාවන් අවම කිරීම සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව 2015 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා "සෙන්දායි රාමුව" නමින් වූ සැලැස්මක් සැකසීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට ලබා දී තිබුණු රු.1,300,000 ක ප්‍රදානයෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට විවිධ කටයුතු සඳහා රු.318,583 ක් වියදම් කර තිබුණ ද

සෙන්දායි රාමුවට අනුව සැලසුම් පිළියෙල කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීමට මධ්‍යස්ථානය කටයුතු කර නොතිබුණි.

(ඉ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සඳහා ප්‍රදානයක් ලෙස 2015 ජූලි 07 වන දින ලබාදී තිබුණු රු.1,500,000 ක මුදලින් 2017 මැයි 19 වන දින වන විට රු. 396,000 ක් උපයෝජනය කර තිබුණද අදාල සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

හදිසි අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයේ ප්‍රතිපාදනවලින් 2014 ජූලි හා ඔක්තෝබර් මාසවලදී මිලදීගෙන තිබුණු ආපදා සහන සේවකයින් හඳුනාගැනීමේ කබා තොග වලින් රු.1,483,515 ක් වටිනා ඒකක 2997 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට ගබඩාවේ ඉතිරි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ඒකක 351 ක් පමණක් පරිහරණය කර තිබුණි. මෙසේ කබා ඉතිරිව පැවතියදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ලද මූල්‍ය ප්‍රදානයන් උපයෝගී කරගෙන 2015 ජනවාරි මාසයේදී රු.990,000 ක පිරිවැයකට කබා 2000 ක් මිලදීගෙන තිබුණු අතර එයද 2016 දෙසැම්බර් 31 දින වන තෙක් භාවිතයෙන් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

වටිනාකම රු 17,081,640 ක් වූ බෝට්ටු 70 ක් හා දම්වැල් කියත් 72ක් 2016 නොවැම්බර් 28 දිනට පෙර සැපයීම සඳහා මධ්‍යස්ථානය විසින් තෝරාගත් සැපයුම්කරුවන් එකඟවී තිබුණු නමුත් අදාල ඇණවුම සම්පූර්ණ කර තිබුණේ 2016 දෙසැම්බර් 14 හා දෙසැම්බර් 31 යන දිනවල දීය. ඒ හේතුවෙන්, ප්‍රමාද කාලය තුළ එකතු කළ අගය මත අනුපාත වෙනස්වීම මත එකතුව රු. 616,960 ක මුදලක් වැටි බදු වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ පානීය ජල ලිං ඉදිකිරීම පිළිබඳව සිදුකරන ලද භෞතික පරීක්ෂාවන්ට අනුව පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) 2016 නොවැම්බර් 30 දින අත්සන් කරන ලද ගිවිසුමට අනුව කටුගම්පල ප්‍රදේශයේ පානීය ජල ලිඳක් ඉදිකිරීමේ කටයුතු මාසයක් තුල නිමකල යුතුව තිබුණද 2017 ජනවාරි 26 දින වනවිටත් වැඩ අවසන් කර නොතිබුණි. එහෙත් කොන්ත්‍රාත්තුව ලබාගත් ප්‍රජාමූල සංවිධානය විසින් නියමිත දිනට කාර්යය නිමකර ඇති බවට සාවද්‍ය වාර්තාවක්ද මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ii) පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුල ඇස්තමේන්තු වටිනාකම රු.4,033,835 ක්වූ පානීය ජල ලිං 05 ක් ඉදිකර තිබුණ ද විගණිත දිනය වූ 2017 ජනවාරි 26 දින වන විටත් එම ළිං පානීය ජලය පරිභෝජනයට සුදුසු තත්ත්වයකට පත්කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් පුද්ගලික සමාගමක් සමඟ සුනාමි කුළුණු 77 ක් ප්‍රතිසංස්කරණය හා අළුත්වැඩියාව සඳහා රු.134,746,419 ක වැටි බදු ඇතුලත් වටිනාකමක් සහිත ගිවිසුමකට 2016 දෙසැම්බර් 16 දින එළඹ තිබුණු අතර රු.8,345,898 ක අත්තිකාරම් මුදලක් 2016 දෙසැම්බර් 21 දින ගෙවා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව දින 90 කින් අදාල කාර්යය නිම කලයුතු වුවද 2017 ජුනි 30 දින වනතෙක්ම එම කාර්යය නිම කර නොතිබුණි.

ගිවිසුමට අනුකූලව මාස 06 ක කාලයක් ගත වී තිබියදීත් පූර්ව අනතුරු ඇඟවීම් කුළුණු ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි වීමට හේතු ලෙස අයඟපත් කාළගුණය,නාක්ෂණික උපකරණ ලබාගැනීමේ ප්‍රමාදය ,ශ්‍රී ලංකා යුධ හමුදාවේ සංඥා බලකායේ නිලධාරීන් එක් එක් කුළුණු වෙත ගොස් පරීක්ෂා කිරීමට කාලය ගත වීම හේතු වූ බව අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 21 දින ප්‍රසම්පාදන සැලසුම අනුව, හදිසි අවස්ථා මිලදී ගැනීම් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද රු.මිලියන 54.8 කින් අයිතම වර්ග 19 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.941,794 ක වියදමක් දරා පුවත්පත් දැන්වීම් පළකර තිබුණි. කෙසේ වුවද රු.මිලියන 12.859 ක් වූ අයිතම වර්ග 04 කට අදාල භාණ්ඩ වර්ග 1213 ක ප්‍රසම්පාදන කටයුතු, මධ්‍යස්ථානය විසින් අවලංගු කර තිබුණි. දම්වැල් කප්පි 55 ක් මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 22 දින රු.4,243,250 ක බදු රහිත මිලකට ලංසු ප්‍රදානය කර තිබුණද 2017 මාර්තු 23 දින වන විටත් මිලදී ගැනීම් සිදුකර නොතිබුණි.

(ඇ) අකුරණ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සකස් කිරීමට පෙර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය විසින් 2014 ඔක්තෝබර් මස සිදුකල පරිශ්‍රයේ අධ්‍යයන වාර්තාවේ සඳහන් මූලික කරුණුවලට අවධානය යොමු කර නොතිබුණ බැවින් මහා මාර්ගයේ පටු ස්ථානවල ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හා පටු ස්ථාන පළල් කිරීම සඳහා කිසිදු මුදලක් ප්‍රතිපාදනය කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මඩ සන මීටර් 12700 ක් ඉවත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු වෙත රු.18,122,900 ක් ගෙවා තිබුණ අතර ඉවත් කරන මඩ ධාරිතාවය සහතික කිරීම කාවකාලික පදනම මත වූ වැඩ පරීක්ෂක වරයෙකු විසින් සිදුකර තිබුණි.යථෝක්ත ව්‍යාපෘතියේ මඩ සන මීටර් 486.76 ක් ඉවත් කර තිබුණු අතර ඒ සඳහා නියමිත වැඩ වටිනාකම රු.694,606 ක් වන නමුත් අදාල කොන්ත්‍රාත්කරු වෙත රු.17,428,294 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. ව්‍යාපෘති ගිවිසුම අනුව වැඩ අවසන් කළ යුතු දිනය 2015 නොවැම්බර් 14 දින වුවත් 2016 පෙබරවාරි 29 දින වන විටත් වැඩ අවසන් වී නොතිබුණු අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතියක් ලබාදී නොතිබුණි.ව්‍යාපෘතියේ ප්‍රමාද දිනයක් සඳහා දිනකට රු.4,700 ක් බැගින් වූ දඩ මුදලක් අය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඉ) බදුල්ල දිස්ත්‍රික්කයේ කෙහෙල්ඇල්ල ශ්‍රී ආනන්දාරාමයේ ආරක්ෂාව සඳහා රු.1,569,490 වැය කර ඉදි කළ කොන්ක්‍රීට් බැම්ම පසුපස පස් පිරවුම නිසිපරිදි තලා මට්ටම් කර නොතිබුණු අතර බැම්මට ඉහලින් පිහිටි භූමියෙන් ගලා එන ජලය සෘජුව බැම්ම පිටුපස තැන්පත් වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 344 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 17 ක නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව 114 ක් වී තිබුණි. එම පුරප්පාඩු වලින් තනතුරු 15 ක නිලධාරී පුරප්පාඩු 62 ක් සම්පූර්ණ කිරීම සඳහා පුවත්පත් දැන්වීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා රු.806,269 ක් වැයකර තිබුණද, 2017 ජුනි 30 දින වනවිටත් ඉන් තනතුරු නාම 09 ක පුරප්පාඩු 46 ක් සම්පූර්ණ කිරීමට මධ්‍යස්ථානය අපොහොසත් වී තිබුණි. තවද රියදුරු තනතුරු 04 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු 25 ක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පල නොකර අභ්‍යන්තර කැඳවීම් කර තිබුණ අතර තවදුරටත් රියදුරු තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් බවත් පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම් නොපමාව සිදු කළ යුතු බවත් දක්වා තිබුණු නමුත්,ඊට අනුකූල නොවන පරිදි මාස 06 සිට මාස 35 දක්වා වූ කාල පරාසයක් සඳහා මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 04 ක සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු 01 ක වැඩබැලීම් වෙනුවෙන් මධ්‍යස්ථානයේ නිලධාරීන් 05 දෙනෙකු වෙත රු.658,558 ක වැඩ බැලීමේ දීමනා ලබා දී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම රාජ්‍ය සංස්ථාවකටම හා සම්බන්ධ කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මධ්‍යස්ථානය විසින් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 01 දින ඉදිරිපත් කර තිබුණු නමුත් සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2017 මැයි 09 දින දක්වා ප්‍රමාද කර තිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලසුම් 2016 දෙසැම්බර් 27 දින සංශෝධනය කර තිබුණු බැවින් සැලසුමකින් අපේක්ෂිත පරමාර්ථ ඉටු නොවුනු බව නිරීක්ෂණය විය. සංශෝධිත සැලැස්ම අනුව රු.මිලියන 100.1 ක මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 25.3 ක් පුනරාවර්තන මිලදී ගැනීම් සඳහාද, රු.මිලියන 54.8 ක් හදිසි අවස්ථා ප්‍රසම්පාදන කටයුතු සඳහාද ඉතිරි රු.මිලියන 20 ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම සඳහාද වෙන් කර තිබුණි. කෙසේ වුවද , වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් සියයට 98.93 ක් වූ රු.මිලියන 74 ක මුදල භාණ්ඩාගාරයෙන් නිදහස් කර තිබුණේ 2016 දෙසැම්බර් මාසයේදී වූ බැවින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදනයන් සඳහා ඉහත මුදල් නිසි පරිදි උපයෝජනය කරගැනීමට මධ්‍යස්ථානයට නොහැකි වී තිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ක්‍රියාකාරී සැලැස්මට අනුව ආපදා අවම කිරීම් ව්‍යාපෘති 37 ක් සහ ප්‍රතිපාදන වටිනාකම රු.511,853,709 ක් ලෙස සඳහන් වුවද ප්‍රගති වාර්තා වලට අනුව ව්‍යාපෘති ගණන 157 ක් සහ ප්‍රතිපාදන වටිනාකම රු.713,849,427 ලෙස සඳහන් කර තිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, පැවතින තත්ත්වයන් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී යම් යම් වෙනස්කම්වලට භාජනය කිරීමට සිදුවීම ඒ සඳහා හේතු වී ඇති බව මධ්‍යස්ථානය විසින් දක්වා තිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී හා එහි එක් එක් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමේදී ව්‍යාපෘති පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව සහ ඉන් ලැබෙන ප්‍රතිලාභ අධ්‍යයනය කළ යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් රු.76,685,049 ක් ප්‍රතිපාදන වෙන්කරන ලද ව්‍යාපෘති 21 ක් විවිධ හේතූන් නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	ගබඩා පාලනය	(i)	කාර්යාලය විසින් භාවිතා කරන හා බෙදා හැරීම සඳහා ගබඩාවේ ඇති භාණ්ඩ එකම බඩු වට්ටෝරු පොතක ඇතුළත් කර තිබීමෙන් භාණ්ඩ වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට නොහැකි වීම.

(ii) 2016 ජනවාරි 07 දින තොග පොත විගණනය කර පියවීමෙන් පසුව භාණ්ඩ වර්ග 23 ට අදාලව 2016 වර්ෂයට අදාලව සටහන් ඇතුළත් කර තිබීම.

(iii) භාණ්ඩ වර්ග 05 කින් අයිතම 3,352 ක් ගබඩාවට ලැබුණු දිනය භාණ්ඩ ලැබීම් පත්‍රිකා අනුව 2016 දෙසැම්බර් 31 දින වුවත් එයට වෙනස් දිනයන් යටතේ තොග පොතට ඇතුළත් කර තිබීම.

(iv) භාණ්ඩ වර්ග 05 කින් අයිතම 3313 ක් සැපයුම්කරු විසින් සැපයීමට එකඟ වූ දිනට වඩා දින 14 සිට දින 36 ක් දක්වා ප්‍රමාද වී සපයා තිබීම.

(v) දිස්ත්‍රික් කාර්යාල 03 කට අනුයුක්ත කර ඇති වාහන 03 ක් සම්බන්ධ විස්තර භෞතික පරීක්ෂණ වාර්තාවල ඉදිරිපත් කර නොතිබීම.

(ආ) ගිණුම්කරණය

(i) ගෙවිය යුතු තැන්පතු මුදල් නිරවුල් කිරීමට කටයුතු නොකර දිගින් දිගටම ගිණුම්වල දැක්වීම.

(ii) වියදම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත නොකිරීම.

(ඇ) වත්කම් පවරා ගැනීම

මධ්‍යස්ථානය විසින් භාවිතා කරනු ලබන වාහන 39 කින් වාහන 31 ක අයිතිය මධ්‍යස්ථානය වෙත පවරා නොගැනීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක ඩීඑමජී/ඒ/ඩීඑමසී/01/16/13 හා 2017 නොවැම්බර් මස 14 වන දිනැති ලිපිය හා බැඳේ. ඊට අදාල කරුණු දැක්වීම පහත පරිදි වේ.

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත

එකහවෙමි,

LKAS 16 අනුව වත්කම් ප්‍රයෝජනයට ගත් දින සිට ක්ෂය කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. 2013ට පෙර වර්ෂ වලදී ICET ව්‍යාපෘතිය යටතේ ලැබී තිබූ ඇතැම් වත්කම් ගිණුම්ගත නොවී තිබුණු අතර ,එම වත්කම් 2013 වසරේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වුව ද , එම වත්කම් අදාල ව්‍යාපෘතිය මගින් මධ්‍යස්ථානයට ලැබී තිබූ දිනයන් නිශ්චිතව ලබා ගැනීමට නොහැකි වීම නිසා වත්කමේ ක්ෂය ගණනය කිරීම හා ඵලදායී ආයු කාලය ගණනය කිරීමේ ගැටළුවක් ඇති වූ බැවින්, 2013 වසරේ දී ක්ෂය ගණනය කිරීමේ ක්‍රමය වෙනස්කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

2.2.2. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අයවිය යුතු මුදල් මධ්‍යස්ථානයට අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගවලට මේ වන විටත් අවතීර්ණ වී ඇති බව කාරුණිකව දන්වා සිටින අතර ඉදිරියේදී අදාල අයකර ගැනීම් අවසන් කිරීමට කටයුතු කෙරේ.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසික දිස්ත්‍රික් ප්‍රගති වාර්තාව මගින් ලබාගෙන මාසිකව අන්තර්කාලීන කළමණාකරන කමිටුව වෙතද අමාත්‍යාංශය වෙතද යැවීමට කටයුතු කර ඇත. මේ සඳහා වෙනම ගොනුවක් නඩත්තු වන අතර, ව්‍යාපෘතිවල ප්‍රගතිය ව්‍යාපෘතියේ ගොනුවට යොමුකර නොමැති අතර, එම තොරතුරු ප්‍රගතිය සඳහා වෙන්කොට ඇති ගොනුවේ ගොනුගත කර ඇත. එමෙන්ම වැඩ අවසන් වාර්තා දිස්ත්‍රික් වලින් ලබාදීමේ ප්‍රමාදයක් සිදුවී ඇති බව පිලිගන්නා අතර එම වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) එකඟ වෙමි.

මෙම බැකෝ ලෝඩරය හම්බන්තොට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ අහුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබේ. මෙම රථය 2012.08.15 වන දින ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවට භාර දී ඇති බව ප්‍රාදේශීය සභාව විසින් දැනුම් දී ඇත. මෙම රථය පිළිබඳ සොයා බලා ඉදිරි වර්ෂයේ (2017) භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලදී භෞතික පරීක්ෂණ කටයුතු සිදුකර වාර්තා ලබා දීමට කටයුතු කරනු ඇත.

(ඇ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියළු වාහන සඳහා මධ්‍යස්ථානය ආරම්භයේ සිටම රක්ෂණාවරණ ලබාගෙන ඇත්තේ රජය සතු ආයතනයක් වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතිනි.

මධ්‍යස්ථානය සියළුම වාහන සමූහ රක්ෂණ ක්‍රමය යටතේ (Vehicle Fleet) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් රක්ෂණ කර ඇත. මෙම සමූහ රක්ෂණ වර්ෂයේ දින වකවානු කිහිපයකදී අලුත් කිරීමකට යටත්ව සිදු කරන බැවින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්ම එම සේවාව ලබාගෙන ඇත. මෙම සමූහ රක්ෂණ අවසන් වන සෑම අවස්ථාවකම මිල ගණන් කැඳවා අදාළ ප්‍රසම්පාදනයන් සිදු කිරීම පවතින ධාරිතාවයන් අනුව ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික අපහසුතාවයන් පවති. කෙසේ වුව ද, මධ්‍යස්ථානය විසින් ඉටු කළයුතුව ඇති ප්‍රසම්පාදන ප්‍රමාණය සැලකිල්ලට ගැනීමේ දී ප්‍රසම්පාදනය සඳහා වෙනම අංශයක් වගකිව යුතු නිලධාරියෙකුගේ මෙහෙය වීම යටතේ පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය දැඩිව ඉස්මතු වී ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදහස් කර ඇත.

මෙම රක්ෂණ වාරික ගණනය කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ලිඛිතව කරුණු පැහැදිලි කරගෙන විගණනයට ඉදිරිපත් කිරීමට සටහන් කරගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) එකඟ නොවෙමි,

ප්‍රධාන කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017/09/06 වන දින විගණනයට ඉදිරිපත් කරන ලදි. නමුත් හදිසි මෙහෙයුම් අංශයේ සහ ප්‍රධාන කාර්යාලයේ වාහන කිහිපයක සමීක්ෂණ වාර්තා තවදුරටත් ඉදිරිපත් කිරීමට ඉතිරිව තිබුණි එම සමීක්ෂණ කටයුතු ද අවසන්කර 2017 ඔක්තෝබර් 20 දින රජයේ විගණන අංශයට භාර දෙන ලදී.

2.3 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 05 ඡේදය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර් කාලීන කළමනාකරණ කමිටුව 2012 වර්ෂයේ අගභාගයේදී ස්ථාපිත කිරීමෙන් අනතුරුව, සෑම මසකම අන්තර් කාලීන කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම සිදු කරනු ලැබේ. එහිදී සෑම මසකම මධ්‍යස්ථානයේ ප්‍රගතිය හා ඊට අදාල සියළු කාර්යයන් පිළිබඳව සාකච්ඡා කරනු ලබන අතර අදාල කාර්යයන් කිරීම සඳහා අවශ්‍ය තීන්දු තීරණ ද ගනු ලැබේ. එබැවින් ව්‍යසන කළමනාකරණ ජාතික සභාවේ රැස්වීම් හදිසි ආපදා අවස්ථාවකදී සහ අවශ්‍ය වූ විට පමණක් සිදු කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාවාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 395 (ඇ)

එකහවෙමි.

ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණයේ එක් වැදගත් අභ්‍යන්තර පාලනයක් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශය වැදගත් කාර්යයභාරයක් ඉටුකරන බැවින් සෑම මසකම ගණුදෙනු සටහන් කර අවසන් වූ විගස බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට කටයුතු කෙරේ. නමුත්, මූල්‍ය අංශයේ කාර්ය බහුලත්වය නිසා ඇතැම් මාස වලදී අදාල දිනටම බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර අවසන් කිරීමට අපොහොසත් වී ඇත.

2016 මුල් මස 06ට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණකාධිපති වෙත එම කාලය තුලදීම ඉදිරිපත් කර තිබුණද, අතපසුවීමක් නිසා අවසන් මාස 06ට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමේ දී ප්‍රමාදයක් සිදු වී ඇති අතර ඉදිරියේ දී මෙම ප්‍රමාදයන් අවම කර ගනිමින් සෑම මසකටම අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ ඉදිරි මාසයේ 15 වන දිනට පෙර පිළියෙළ කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

2017 දෙසැම්බර් 07 දින වන විට 2017 වර්ෂයේ ඔක්තෝබර් දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ උපදෙස් පරිදි පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත්කර ඇත.

(ii) මුදල් රෙගුලාසි 104

උක්ත වාහන අනතුරුවලට අදාළ ප්‍රාරම්භක වාර්තාවලින් කොටසක් මේ වන විටත් සම්පූර්ණ කර මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇති අතර ඉතිරි කටයුතුද සම්පූර්ණ කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 3.4.3 මාර්ගෝපදේශය

එකහවෙමි

හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන මෙන්ම දෛනික අවශ්‍යතා සඳහා වන මිලදී ගැනීම්, රේන්බෝ පේජස් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා හෝ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව අවශ්‍ය අවස්ථාවන් හි දී පුවත්පත් නිවේදන මගින් ලංසු කැඳවීම සිදු කෙරේ. මධ්‍යස්ථානයේ මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් වූ අංශයක් නොමැති නමුත් පවතින සම්පත් උපයෝගි කර ගනිමින් සැපයුම්කරුවන් වාර්ෂිකව ලියාපදිංචි කිරීමට ද කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ii) 4.2.1 (ආ) මාර්ගෝපදේශය

එකඟවේ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති රාජකාරිවල ස්වාභාවය අනුව ප්‍රසම්පාදනය කිරීමට සිදු වන භාණ්ඩ හා සේවාවන් වසර 3 ක කාලයකට පෙරාතුව පුරෝකථනය කිරීම අපහසු වී ඇත. හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම සඳහා මිලදී ගැනීමට නියමිත භාණ්ඩ අවස්ථානුකූලව මෙන්ම ඒවා භාවිතා කරනු ලබන ආයතන වල ඉල්ලීම පදනම් කරගෙන වාර්ෂිකව මිලදී ගැනීම සිදු කෙරේ. කෙසේ වුවද ඉදිරි වර්ෂවලදී මෙම මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කිරීමට සටහන් කරගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(iii) 2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28

වාහන අංකය	අළුත්වැඩියා වියදම (රු.)	අනුමැතිය
WPLF 1101	749,900	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ සභාපතිත්වයෙන් 2015.12.02 දින පැවති මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලද මු.රෙ.135 අනුව බලතල පැවරීම සඳහා ඉදිරිපත් කළ සභා පත්‍රිකාව මත ලද අනුමැතිය මත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මේ සඳහා ලබා ඇත.
WPPB 7697	292,617	පුත්තලම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ රාජකාරි සඳහා අනුයුක්ත කර ඇති උක්ත වාහනය අළුත්වැඩියාව සඳහා එම දිස්ත්‍රික් ලේකම්ගේ හා මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශ මත මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබාදී ඇත. කෙසේ වුවද වාහනය අළුත්වැඩියාව සඳහා යොමු කිරීමෙන් අනතුරුව හඳුනාගත් අඩුපාඩුවක් මත මිළ වැඩිවී ඇත. මින් ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇත.
WPNA 7830	208,150	2016 වර්ෂය සඳහා මු.රෙ.135 අනුව බලතල පැවරීමේදී මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරා ඇති රු.250,000.00 වැය සීමාව තුළ අනුමැතිය ලබාදී ඇත.
WPPB 9337	392,767	උක්ත වාහනය පිළිබඳව මෙවැනි ගණුදෙනුවක් සිදුවී නොමැත.

3. මූල්‍ය සමාලෝචනය

3.2 මධ්‍යස්ථානයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

එකහවෙමි.

මෙම නඩුව පිළිබඳ තොරතුරු ඉදිරි මුදල් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමට කටයුතු කෙරේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) පනතෙහි සඳහන් ආපදා 21 ආශ්‍රිතව ක්‍රියාත්මක වීම සඳහා රටතුළ ආයතන ගණනාවක් ස්ථාපිත කොට ඇති අතර ඒ සඳහා අණපනත් රාශියක් ද ස්ථාපිත කොට ඇත. එමෙන්ම ආපදා කළමනාකරණ පනතෙහි අංක 08 මගින් ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම 2(1) අ, ආ, ඇ කාර්යයන් නිර්වචනය කර ඇත්තේ පනත මගින් හඳුනාගෙන ඇති ආපදා සියල්ල ආවරණය වන පරිදි එම ආපදාවන්ගෙන් විය හැකි හානි ආපදා අවධානම් අවම කිරීමට හැකි වන ලෙස ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සැකසීම, සිදුවිය හැකි ආපදා තත්ත්වයන්හිදී හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා හදිසි ප්‍රතිචාර දැක්වීම සැලැස්ම සැකසීම හා ජාතික ආපදා කළමනාකරණ සැලැස්මට අනුකූලව අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන සඳහා එම ආයතන කාර්යයභාරයට අදාලව පවත්නා හෝ සිදුවිය හැකි ආපදා අවධානම් අවම කිරීම සඳහා එම ආයතනවලට අදාල ආපදා කළමනාකරණ සැලැස්මක් සැකසීම අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීම සඳහාය. පනතේ අංක 08 එමෙන්ම පනතෙහි අංක 08 ඇ අනුව පැහැදිලිව දක්වා ඇත්තේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අදාල ආයතන හා ආපදා වලට සූදානම් වීම, ව්‍යාසන අඩුකිරීම, සහන සැලසීම හා පුනරාත්තාපනය කිරීම හා ප්‍රතිසංස්කරණය කටයුතු කිරීම යන කරුණු කල යුතු බවයි.

එසේම පනතෙහි 10 වගන්තිය අනුව
යම් අමාත්‍යාංශයක් ,ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථාව සම්බන්ධයෙන් යම් ව්‍යසනයක් හෝ ආසන්නතම ව්‍යසනයක් මැඩපැවැත්වීම සඳහා ව්‍යසන කළමනාකරණ සැලැස්ම මත පදනම් වූ සහ සහාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මාර්ගෝපදේශවලට අනුකූලවූ ව්‍යසන කළමනාකරණ සලැස්මක් පිලියෙල කිරීම, සෑම අමාත්‍යාංශයකම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකම සහ රාජ්‍ය සංස්ථාවකම කාර්යය වන්නේය.

ඒ අනුව,
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යභාරය වන්නේ අනිකුත් ආයතන සම්බන්ධීකරණය කොට ආපදා අවධානම් අවම කිරීම සඳහා ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන කටයුතු කරලීමට අවශ්‍ය පහසුකම් සැපයීම වේ.

ආපදා 21ක් පනත මගින් හඳුනාගෙන තිබුනද 1974 සිට අද දක්වා ආපදා හානි පිලිබඳව පවතින දත්ත පද්ධතිය අනුව වැඩිම හානි ප්‍රමාණයක් සිදුව ඇත්තේ ගංවතුර ආපදාව හේතු කොටගෙනය. එම දත්ත පද්ධතිය විශ්ලේෂණය කිරීමෙන් මේ බව පැහැදිලි වන අතර, නියඟය, නායයාම්

පිළිවෙලින් පුද්ගලයන්ට , දේපල හා යටිතල පහසුකම් වලට වැඩිපුර හානි සිදුකරන බව වාර්තා වී ඇත. සමස්ථ රටෙහිම වාර්ෂිකව ආපදා මගින් සිදුවන හානි සඳහා වූ තක්සේරුව බිලියන ගණනක් වන බව ආපදා හානි තක්සේරු වලින් හෙලිවී ඇති අතර, එම සියල්ල සඳහා කටයුතු කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ. එහෙත් වාර්ෂිකව සිදුවන හානි වැඩිම ප්‍රමාණයක් ගංවතුර මගින් සිදුවන නිසා ගංවතුර හානි අවම කිරීම සඳහා වැඩි ප්‍රතිශතයක් වෙන් කිරීම පදනම් සහිත වේ.

(ආ) පෙර සුදානම් අංශයේ ප්‍රධාන වගකීම් ලෙස ජාතික ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම, ජාතික හදිසි මෙහෙයුම් සැලසුම් සකස් කිරීම හා දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා ග්‍රාමීය සැලසුම් සකස් කිරීම සඳහන් කල හැකිය. 2005 වසරේ සිට මේ දක්වා අඛණ්ඩව ආපදා කළමනාකරණ සැලසුම් සකස් කරමින් පවතී. මෙම සැලසුම් සකස් කිරීම මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන මත තීරණය කරනු ලබයි. පෙර සූදානම් අංශයට මහාභාණ්ඩාගාරයෙන් ලැබුන ප්‍රතිපාදන 2015 වර්ෂයේ රු. මිලියන 12ක් වන අතර, 2016 වර්ෂයේ එය රු. මිලියන 12.5ක් හා 2017 වර්ෂයේ රු.මිලියන 19.8 ක් විය. මුල් කාලයේ මෙම සැලසුම් ඓතිහාසික තොරතුරු මත පදනම් ව සැලසුම් සකස් කරන ලදි. එහිදි පෙර සූදානම් සැලසුම්, හදිසි මෙහෙයුම් සැලසුම් ඉතා සවිස්තරව පාර්ශවකාර ආයතන වල හා අනුකම්ටු වල වගකීම් ආපදාවට පෙර, ආපදා අවස්ථාවේ හා ආපදාවට පසු යන ආකාරයට සඳහන් කොට ගත යුතු ක්‍රියාමාර්ග ඉතා පැහැදිලිව සඳහන් කොට ඇත. තවද මෙම සැලසුම් ප්‍රතිශෝධනය කිරීම සිදු කරනු ලබනුයේ වසර 5 කට පසුව හෝ ප්‍රධාන ව්‍යවසනයකට පසුවයි. (ආපදා කළමනාකරණ පනතට අනුව) නමුත් යාවත්කාලීන කිරීම් සෑම වසරකම සිදු කරයි.

නමුත් අවදානම් තක්සේරුව මේ වන විටත් සකස් කරමින් පවතින අතර, උදාහරණ වශයෙන්, බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මට්ටමෙන් ආපදා අවදානම් සිතියම් සකස් කිරීම අවසන් කර ඇති අතර ප්‍රධාන ගංගා ද්‍රෝණි 10ක අවදානම් සිතියම් තක්සේරුව සකස් කරමින් පවති.

තවද, 2018-2022 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම මේ වසරේදී අවසන් වන බැවින් ඊට සමගාමීව දිස්ත්‍රික් සැලසුම්, ප්‍රාදේශිය සැලසුම් හා ග්‍රාමීය සැලසුම් ප්‍රතිශෝධනය කිරීමට සැලසුම් කරඇත.

2017 වර්ෂයේ සිට සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය එක්ව ග්‍රාමීය මට්ටමේ සැලසුම් සකස් කරමින් පවති. 2017 වර්ෂයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිළධාරී කොට්ඨාශ 573 ආවරණය කර ඇති අතර රත්නපුර, මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්ක තුල සැලසුම් සකස් කරමින් පවති. 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ග්‍රාමීය සැලසුම් සකස් කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) මේ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකසා ඇති අතර, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම මත ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු කිරීම ප්‍රමාද වූ බව කාරුණිකව දන්වා සිටිමි.

(ඈ)

- එක් එක් වැඩ කොටස් සඳහා වෙන් වෙන්ව ශක්‍යතා අධ්‍යනයක් සිදුනොකරන අතර, සමස්ථ ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කොට ඒ අනුව ව්‍යාපෘතිය අනුමත කොට ඇත.

- මෙම ව්‍යාපෘතිය පිලිබඳව පහත්බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සිදු කරන ලද මූලික අධ්‍යනයෙන් පසු දළ පිරිවැය ඇස්තමේන්තුවක් සකසා ඉදිරිපත් කොට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය

සහිතව භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ඇති අතර, සවිස්තරාත්මක ඇස්තමේන්තු සඳහා මිනුම් කිරීම ආදී ඉංජිනේරුමය කටයුතු සිදු කරන බැවින් සවිස්තරාත්මක ඇස්තමේන්තු කොටස් වශයෙන් සිදු කරනු ලැබේ.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා තාක්ෂණික ආයතනවල සුපරීක්ෂාව යටතේ මෙම ඉදිකිරීම් සිදු කරනු ලබන අතර, කර්මාන්තය සඳහා ගෙවීම් කිරීමේදී දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මුදල් ගෙවීම් කරනු ලබන්නේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයා ඇතුලු තාක්ෂණික ආයතන වල නිර්දේශ කිරීම් මතය. ඒ අනුව අදාල ගෙවීම් සිදු කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මුදල් යොදවා ඇති අතර,විශේෂ තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් විමසා ඇත.

(ඉ)

- ඇස්තමේන්තු සකස් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදු කරනු නොලබයි. ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් යොමු කරන ලද ඇස්තමේන්තු දිස්ත්‍රික් ලේකම් මඟින් නිර්දේශ කොට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරන අතර, මෙම කරුණ පිලිබඳ අවධානය යොමු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් මගින් ප්‍රාදේශිය ලේකම්වරු දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාඔය අතුරු ඇළ මාර්ගය හරහා පාලමක් ඉදිකිරීම ව්‍යාපෘතියේ 2016.12.31 දිනට අවසන් ගෙවීම් සිදු කර ඇති අතර, ව්‍යාපෘතිය සඳහා යොමු කල මුළු මුදලම වියදම් කර ඇති බැවින් මුදල් ඉතිරි වී නොතිබිණි. පණ්ඩුලගම ව්‍යාපෘතිය සඳහා අවස්ථා 02කදී වෙක්පත් මගින් මුදල් ලබා දී ඇති අතර, ව්‍යාපෘතියට අදාල ගෙවීම් කිරීමෙන් අනතුරුව ඉතිරි මුදල වන රු. 2,151,843.40 ක මුදල එම අවස්ථාවේ යොමු කිරීමට අක් මුදල් ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රධාන ගණකාධිකාරිතුමා විසින් එම මුදල 2017 ජනවාරි මස ලැබීමට සලස්වන බව දන්වා සිටින ලදී. පසුව එම මුදලින් මැදගම අළුත් වැව ව්‍යාපෘතියෙහි 2016.12.31 ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වූ රු. 984,579.12 වූ මුදල දෙසැම්බර් මස යොමු කිරීමට අක් මුදල් ප්‍රමාණවත් නොවූ බැවින් 2017.02.17 වන දින මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී විසින් කටයුතු කර ඇත.

පරිපාලන වියදම් ගණනය කිරීම පිලිබඳ එක් එක් ආයතන විවිධ ක්‍රමවේද අනුගමනය කරන බව ඇස්තමේන්තු පරීක්ෂාවේදී හැඟියන අතර, ඒ පිලිබඳ මහාභාණ්ඩාගාරයෙන් නිශ්චිත ක්‍රමවේදයක් පිලිබඳ විමසීම් කර ඇත. එහෙත් මෙතෙක් නිශ්චිත ක්‍රමවේදයක් පිලිබඳ දැනගැනීමට නොලැබී ඇති අතර, ඒ සම්බන්ධව නිශ්චිත ක්‍රමවේදයක් ඇත්නම් මධ්‍යස්ථානය දැනුවත් කරන ලෙස විගණනය මඟින් කාරුණිකව ඉල්ලා සිටිමි. ඒ අනුව මින් ඉදිරියට එම ක්‍රමවේදය අනුව කටයුතු කිරීමටද එකඟතාවය පල කරමි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කර්තව්‍ය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) ගොඩනැගිල්ල අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) මෙම යතුරුපැදි සම්බන්ධව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය දෙපාර්ථමේන්තුව මගින් උපදෙස් ඉල්ලා ඇත. රාජ්‍ය මූල්‍ය දෙපාර්ථමේන්තුවේ උපදෙස් මත ඉදිරි කටයුතු සම්පූර්ණ කිරීමට මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුව මගින් උපදෙස් ලැබී ඇත.

4.3 වත්කම් පාලනය

(අ) මෙම වතුර බවුසරය පවරා දීමට අදාල වැඩකටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

(ආ) එකඟවෙමි,

ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ පොදු 47 ආකෘති පත්‍රයෙහි ඇතුලත් කර මූල්‍ය රෙගුලාසි අනුව භාණ්ඩ පරීක්ෂණ කිරීම සඳහා පත්කරනු ලබන මණ්ඩලයක නිර්දේශය සහ අනුමැතිය මත සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

4.4 මූල්‍ය කළමනාකරණය

(අ) එකඟවෙමි.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුලින් ආයතනය පිළිබඳ සත්‍ය හා සාධාරණ ස්වරූපය පිළිඹිබු වන ආකාරයෙන් එම වර්ෂයට අදාල ගනුදෙනු අත්හැරීමක් හෝ වැරදීමකින් තොරව ගිණුම්ගත කිරීමට අපහට ඇති වගකීම සිහිතබාගෙන දරණ උත්සාහයේ එක් ක්‍රියාමාර්ගයක් ලෙස ගිණුම්කරණ වර්ෂයේ අවසාන දින කිහිපය ගිණුම්කරණ පද්ධතිය විවෘතව තබා ගනිමින් අවශ්‍ය අනෙකුත් ගනුදෙනු සටහන් කරනු ලැබිය. තවද, ආයතනය දිස්ත්‍රික් කාර්යාල 25 ක්ද පවත්වා ගනිමින් දීපව්‍යාප්තව පවතින ආයතනයකි. එහෙයින් වර්ෂ අවසාන ගිණුම් පියවීම සඳහා, එම කාර්යාලයන්හි සුළු මුදල් ශේෂයන් ප්‍රධාන කාර්යාලයට පියවීම, ව්‍යාපෘති සඳහා ලබාදෙන ලද මුදල් වල ඉතිරිය පියවීම අවශ්‍ය වන අතර එම පියවීම් වලින් සමහරක් සෘජුව බැංකු ගත කරන බැවින්, එම ගණුදෙනු හදුනා ගැනීම සඳහා දෙසැම්බර් මස බැංකු ප්‍රකාශනය නිරීක්ෂණය කළයුතුවේ. ඒ අනුව,දෙසැම්බර් මස අවසානයේ නිකුත් කරන බැංකු ප්‍රකාශනය නිරීක්ෂණය තුලින් හදුනා ගන්නා ගණුදෙනු අදාල දිස්ත්‍රික්ක සමඟ තහවුරු කර ගැනීමෙන් පසුව සටහන් කරනු ලැබේ.

එමෙන්ම දිස්ත්‍රික් කාර්යාල වල සේවා සැපයීම් බිල්පත් සඳහා ගෙවීම් (විදුලිය,ජලය,බදු කුලි,දුරකථන) , අතිකාල සහ ගමන් වියදම් දීමනා දෙසැම්බර් මාසයේ හැර අනෙකුත් මාස සඳහා ගෙවීම ද අවසන් දින කිහිපය තුළ සිදුකරනු ලැබේ. මෙම ගෙවීම් කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල වලින් අවශ්‍ය ලිපි ලේඛන හැකි විගස ගෙන්වා ගැනීමට උත්සාහ ගන්නා නමුත් එම කාර්යය අවසන් කිරීමට ගිණුම් වර්ෂය නිම වී දින කිහිපයක් ගතවේ.

එමෙන්ම, මහා භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රතිපාදන උපයෝජනය කාර්යක්ෂමව හා ඉහළ අගයකට ගෙන ඒමටත්, ආයතනයේ ප්‍රගතිය ඉහල නංවා ගැනීමද අපේක්ෂා කරමින් වර්ෂයේ අවසාන දින කිහිපය තුලදී ව්‍යාපෘති සඳහා මුදාහරින ලදී. (බැංකු ප්‍රකාශනය අනුව රුපියල් මිලියන 49ක් මහා භාණ්ඩාගාරයෙන් අප වෙත නිදහස් කර තිබෙන්නේ ද දෙසැම්බර් 30 වන දිනදීය. එමනිසා ඊට අදාල බිල්පත් පියවීම් කටයුතු එම දිනට පසුව සිදු කරන ලදී.)

තවද, ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් සැපයුම්කරුවන්ගේ භාණ්ඩ සැපයීම වර්ෂ අවසානය දක්වා කල්ගත වූ හෙයින්, පියවීමේ කාර්යයන් ඒ අනුව දෙසැම්බර් අග දක්වා ප්‍රමාද වන ලදී. සමහර භාණ්ඩ සත්‍ය වශයෙන්ම ලැබුණේ 2017 ජනවාරි මාසය තුලදී වුවද, වර්ෂයට අදාල ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමේ අරමුණින්, සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම් 2016 වර්ෂයට අදාල ප්‍රතිපාදන යොදා ගෙන සිදු කරන ලදී.

එමෙන්ම,

මූල්‍ය ප්‍රකාශයන් තුලින් ආයතනයේ ස්වරූපය සත්‍ය හා සාධාරණ ආකාරයෙන් පිළිඹිබු කිරීමේ පරමචේතනාවෙන් ප්‍රමාණාත්මක තොරතුරු අත්හැරීමක් හෝ වැරදීමකින් තොරව ඉදිරිපත් කිරීමේ අරමුණින් වර්ෂයේ අවසාන දින කිහිපය ගණුදෙනු පරිගණක ගත කිරීමේ දී පද්ධතිය විවෘතව තබාගන්නා ලදි. එසේ සිදුකළේ පද්ධතියේ පවතින දුර්වලතාවයක් නිසා නොව පද්ධතියේ තොරතුරු වල සම්පූර්ණත්වය සහ නිවැරදිතාවය තහවුරු කිරීම සඳහා සද්භාවයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලයක් ලෙසයි.

කෙසේ වුවද , ඉදිරියේ දී වර්ෂ අවසාන ගණුදෙණු ගිණුම් ගත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලයද දැනුවත් කරමින් , අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගනු ලබන අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි කලට අවසන් කිරීම තුලින් වර්ෂ අවසානයේ දී ඒ සම්බන්ධව ගණුදෙණු සටහන් තැබීමේ දී ඇතිවන ප්‍රමාදයන් අවම කරගනිමින් වර්ෂය අවසාන වන විට සියළුම ගිණුම් කටයුතු සම්පූර්ණ කිරීමට ද කටයුතු කරනු ඇත.

(ආ) එකහනොවෙමි.

මූලධන වියදම සඳහා 2016 වසරේ දී රු.548,402,000/- ක් උපයෝජනය කර තිබේ. ඒ අනුව, මූලධන වියදම් ප්‍රතිපාදන උපයෝජන ප්‍රතිශතය 71% කි. 2016 වසර තුලදී වැඩ නිමකර තිබූ සියලු ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා අවශ්‍ය සියළු මුදල් නිදහස් කරගෙන ගෙවීමකර ඇත. තවද, මෙම කටයුතු සඳහා අදාල වැය විෂයන් වෙනුවෙන් ඉදිරියට ගෙන එන ලද මුදල් ද යොදාගෙන ඇත.

(ඇ) මෙම මුදල් වලට අදාල ව්‍යාපෘතිය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ක්‍රියාත්මකකල අතර, ඊට අදාල සියළු වැඩ කොටස් මේ වන විට අවසන් කර ඇත. අවසන් බිල්පත් මධ්‍යස්ථානය වෙත ලැබුණ වහාම අදාල මුදල් යොදා පියවීම කටයුතු සම්පූර්ණ කරනු ඇත.

(ඈ) 2015 මාර්තු 18 දින ජපානයේ සෙන්දායි නගරයේදී ගෝලීය ආපදා අවධානම් අවම කිරීමේ රාමුව එලිදැක්වූ අතර, එහිදී රටට අදාල වන පරිදි ආපදා අවම කිරීමේ සැලැස්මක් සැකසීමට යෝජනා වී නැත. ගෝලීය රාමුව අනුව ආපදා අවධානම් අවම කිරීමේ ශ්‍රී ලාංකික සැලැස්ම පිලිබඳ කටයුතු කිරීම සඳහා UNDP ආයතනයෙන් 2015 වර්ෂයේ අවසන් කාර්තුවේදී රු. 1,300,000.00 මුදලක් ලබාදී ඇති අතර, එය පොදු ගිණුමෙහි තැන්පත්කොට ඇත. මේ පිලිබඳව මූලික උපදේශන වැඩමුළු පාර්ශවකාර ආයතන හා පවත්වා ඇති අතර, ලේකම් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් දැනුම් දී ඇති පරිදි ශ්‍රී ලංකාවට අදාල ආපදා අවධානම් අවම කිරීමේ වැඩසටහන අමාත්‍යාංශය මගින් සකසන බැවින්, එම ජාතික වැඩ සටහන අනුමත කොට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදීමෙන් පසු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අදාල කටයුතු ක්‍රියාත්මක කිරීමට මෙම මුදල් යොදවනු ඇත.

(ඉ) ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සම්පූර්ණ කිරීමට සඳහා ලබා දී තිබූ රු. 1,500,000 ක මුදලින් රු.396,000ක මුදලක් උපයෝජනය කර එම සැලැස්මේ මාර්ගෝපදේශය සකස්කිරීම ආරම්භ කරනලදි. පළමුව විද්වත් කමිටු රැස්වීම් හා දැනුවත් කිරීම වෙනුවෙන් එම රැස්වීම් සඳහා තෝරාගත් ආයතනවන ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, තාක්ෂණික ආයතන වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ද භාහිර ආයතන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය, පරමාණුක බලශක්ති නියාමන කොමිෂන් සභාව, ආගමන විගමණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, ලංකා විදුලිබල

මණ්ඩලය මෙන්ම ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ පූර්ණ දායකත්වයෙන් මෙම කටයුක්ත ආරම්භ කරන ලදි.

ඉන්පසු ලබා දුන් මාර්ගෝපදේශයට අනුකූලව එම ආයතන විසින් සැලසුම් සකස් කර ඒවායේ ක්‍රියාත්මක වීමේ සමීකෂණ කටයුතු කල යුතුය. ඊට අනුකූලව සෞඛ්‍ය අමාත්‍යාංශය, පරමාණුක බලශක්ති නියාමන කොමිෂන් සභාව, ලංකා විදුලිබල මණ්ඩලය, සැලසුම් සකස්කොට ඇති අතර අනෙක් ආයතන විසින් එම සැලැස්ම සකස් කළ යුතුය. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 – 2030 සෙන්දායි ක්‍රියාකාරී රාමුවට අනුකූලව සකස් කරමින් පවතින අතර ඒඅනුව මෙම මාර්ගෝපදේශය ජාතික ආපදා කළමනාකරණ සැලැස්මෙන් ප්‍රතිශෝධනය කල යුතුය. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 – 2030 එළි දැක්වූ වහාම ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම සම්පූර්ණකර එළි දැක්වීම් කටයුතු කරනු ලැබේ.

4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

මෙම කඩා වලින් විශාල ප්‍රමාණයක් මේ වන විට බෙදා දී ඇති අතර යම් ප්‍රමාණයක් හදිසි අවශ්‍යතාවය මත මධ්‍යස්ථානයේ ගබඩාවේ පවතී. ඉදිරියේදී මිලදී ගන්නා සියළුම භාණ්ඩ අදාල කාලයතුල බෙදා හැරීමට කටයුතු කෙරේ.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

එකඟ විය නොහැක

අදාළ කාළය තුළ VAT බදු අනුපාතය වෙන් කිරීම මධ්‍යස්ථානයේ පාලනයෙන් පරිබාහිර කටයුත්තකි. රජය විසින් VAT බදු වෙන්කිරීම 1/11/2017 සිට බලපැවැත්වෙන පරිදි සිදුකර ඇත. නමුත් අදාළ මිලදී ගැනීම් ඇණවුම් ලිපි නිකුත්කර තිබෙන්නේ දෙසැම්බර් මසදීය. අදාළ බදු වෙනස් වීමෙන් පසුව ඇනවුම් ලිපි නිකුත් කර ඇති නිසා එම බදු අප ආයතනය දැරිය යුතුය. එම බදු මුදල් නැවත මහාභාණ්ඩාගාරයට ලැබේ. එමගින් රජයට අවාසියක් සිදු නොවේ.

4.7 <u>ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය</u>

(අ) (i සහ ii) ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධව කොන්ත්‍රාත් කටයුතු සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හෝ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය මැදිහත් නොවන අතර, එම දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

(ආ) 2016 දෙසැම්බර් 16 වන දින පූර්ව අනතුරු අහවීමේ කුළුණු පුනරුත්ථාපනය කර ප්‍රතිසංස්කරනය කිරීමේ ගිවිසුමට අනුකූලව මාස 03 ක් ඇතුලත සම්පූර්ණ කිරීමට නොහැකි වීමට හේතු වී ඇතත් එම කුළුණු වෙත ගොස් පරීක්ෂා කිරීමට සිදුවීම සහ එවකට පැවති අයහපත් කාළගුණ තත්ත්වයයි. එහෙන්ම වන්ද්‍රිකා තාක්ෂණය සඳහා අවශ්‍ය සන්නිවේදන උපකරණ ඇමරිකන් සිග්නල් සමාගම හරහා ගෙන ඒමේදී යම් කාලයක් පොරොත්තු ලේඛනයේ සිටීමටත්, එවකට භාවිතා කල 201 වන්ද්‍රිකා තාක්ෂණ රිසිවරය මේ වන විට නිෂ්පාදනය නොවන බැවින් ඊට විකල්පයක් ලෙස එම පිරිවිතරයම පවතින වැඩි දියුණු කරන ලද මාදිලිය (401) වන්ද්‍රිකා තාක්ෂණ රිසිවරය ගෙන ඒමට සහ අණුවුම් කිරීමට යම් කාලයක් ගතවීමත් හේතු වුනි. මෙය අන්තර් ජාතික ඇනවුම් කිරීමක් මගින් සිදුකිරීමක් සිදු කරන බැවින් එය මධ්‍යස්ථානයේ පාලනයෙන් තොර ක්‍රියාවලියක් බැවින් ඒ සඳහාද යම් කාලයක් ගත වුනි. 201ජුනි 16 දින වන විට

මෙම කුළුණුවල තාක්ෂණික නොවන අළුත් වැඩියා කටයුතු අවසන් කලද තාක්ෂණික අළුත් වැඩියා කටයුතු වලදී වන්ද්‍රිකා තාක්ෂණ උපකරණ ලබා ගැනීමේ ප්‍රමාදය මීට හේතු විය.

එමෙන්ම මේ වන විට කුළුණු පුනරුත්ථාපන කටයුතු අවසන් කර දී තිබුනද ඒවා නිසි ප්‍රමිතිය එමෙන්ම එහි ක්‍රියාකාරිත්වය මනා ලෙස පරීක්ෂා කිරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංඥා බලකායේ නිළධාරීන් සමග එක් එක් කුළුණු වෙත ගොස් පරීක්ෂා කිරීමට යම් කාලයක් ගත වූ අතර මේ සියළු කාරණා සම්බන්ධව ප්‍රගතිය අන්තර්-කාලීන කළමනාකරණ කමිටුව වෙත වාර්තා කර ඇත. තවද මේ සම්බන්ධව අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් මෙම ක්ෂේත්‍ර කටයුතු වෙනුවෙන් සහභාගි කරවූ අතර සියළුම ප්‍රගතිය සම්බන්ධව නිරන්තර පාර්ශව හමු වීම් පවත්වා තොරතුරු වාර්තා කොට ඇත.

(ඇ) දම්වැල් කප්පි 55 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2017 මාර්තු 23 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබීම යන්නට එකඟ විය නොහැක.

ගං වතුර හදිසි ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ 2016 වැය ශීර්ෂය යටතේ දම්වැල් කප්පි 55 ක් සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව මිල කැඳවීම් සිදු කර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි තෝරා ගන්නා ලද සැපයුම් ආයතනය වෙත 2016.11.07 දිනැතිව ඇණවුම් ලිපි නිකුත් කර ඇත. එම ඇණවුම් ලිපියට ප්‍රතිචාරිව එම ආයතනය විසින් දන්වා ඇත්තේ එම ආයතනය විසින් මිල ගණන් ඉදිරිපත් කර ඇති භාණ්ඩය ආනයනය කිරීමේ ගැටළුවක් පවතින බැවින් එම මිල ඉදිරිපත් කරන ලද වයිනා බ්‍රැන්ඩ් හා වයිනා ඔරජින් වර්ගය වෙනුවට එම මිලටම ජපන් බ්‍රැන්ඩ් හා ජපන් ඔරජින් වර්ගයේ දම්වැල් කප්පි 55 ක් එම මුදලටම සැපයීමට එකඟ විය. මෙම භාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වගකීම් කාලය මාස 06 ක් ලෙස සඳහන් කර ඇත. එහෙත් මධ්‍යස්ථානයේ පිරිවිතර අනුව අපේක්ෂිත වගකීම් කාලය වසර 03 ක් වේ. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් එම ආයතනයෙන් විමසීමේදී වගකීම් කාලය මාස 06 ක් වුවද වසර 03 ක් සඳහා අලුත්වැඩියාවන් සිදුකර දෙන බවත් වගකීම් කාලය ඉක්මවා හා වසර 03 ක් ඇතුලත අමතර කොටස් යෙදීමට සිදු වුවහොත් ඒ සඳහා අයකිරීම සිදුකරන බවත් දන්වා ඇත. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ 2016.12.21 දිනැති කමිටු තීරණ වාර්තාව අනුව යමින් 2016.12.22 දින නැවත ඇණවුම් ලිපියක් එම ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. නමුත් 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනතුරු එම ආයකනය විසින් අදාල භාණ්ඩ සැපයීමට අපොහොසත් වී ඇත. ඒ අනුව එම ප්‍රසම්පාදනයට අදාලව 2016 ගිණුම් වර්ෂය තුල දම්වැල් කප්පි 55 ක ප්‍රමාණය මධ්‍යස්ථානයට මිලදී ගැනීමට නොහැකි විය.

(ඇ) ඉහත ව්‍යාපෘතිය සිදු කරන ලද්දේ පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් කරන ලද ශක්‍යතා අධ්‍යන වාර්තාවට අනුවය. එහිදී මුලින්ම සිදු කරනු ලැබුවේ අවධානම් තත්ත්වයට ලක්වන පිගාඔය සහ ඇල මාර්ග දෙපස මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැන මායිම් සිතියම් ගත කිරීමයි. ඒ අනුව එම සිතියම් මගින් ඇල මාර්ගය තුල හා රක්ෂිත ප්‍රදේශවල ඇති අනවසර ගොඩනැගිලි හා ඉදිකිරීම් පැහැදිලිව සටහන් කර ඇත. මෙහිදී 2015 හා 2016 වසර මුල් භාගයේ කිසිදු ජල ගැලීම් තත්ත්වයක් වාර්තා නොවූ අතර ඊට ප්‍රධාන හේතුව වූයේ ඇල මාර්ග අවහිරතාවයන් වූ රොන් මඩ ප්‍රමාණයන් ඉවත් කිරීමයි. ඇස්තමේන්තුවේ සඳහන් රොන් මඩ ප්‍රමාණය සම්පූර්ණයෙන් ඉවත් වූ බව තහවුරු කරන ලද අතර, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට නොහැකි වීම, වැලි රඳවන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම, හා නව අනවසර ඉදිකිරීම් මඟින් ඇල මාර්ග අවහිර වීම,අපද්‍රව්‍ය පස් ඇල මාර්ගයට එකතු කිරීම ව්‍යාපෘතියේ අපේක්ෂාවන්වලට බාධක තත්ත්වයන් එල්ලවී ඇති බව මෙහිදී සඳහන් කල යුතුය. මේ පිළිබඳව මහනුවර දිස්ත්‍රික් ලේකම් මගින් ව්‍යාපෘති පිලිබඳ වගකිව යුතු සියළු ආයතන ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇති අතර, ගත යුතු ක්‍රියාමාර්ග පිලිබඳ

නිර්දේශ ලබා දුන්නද එම ආයතනවල සහයෝගය නිසි පරිදි නොලැබී ඇති බව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් මධ්‍යස්ථානය වෙත දැනුම් දී ඇත.

මෙම ව්‍යාපෘතියේ රොන් මඩ ඉවත් කිරීමේ කටයුතු සිදු කරන ලද්දේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ පූර්ණ උපදෙස් සහ අධීක්ෂණය යටතේය. දිස්ත්‍රික් ඉංජිනේරු විසින් පස් ඉවත් කරන යන්ත්‍ර හා කැණීම් යන්ත්‍ර පිලිබඳව පූර්ණ පරීක්ෂාවක් සිදු කල බවත්, අවසන් ගෙවීම් සිදු කර ඇත්තේ ඒ පිලිබඳ කරුණු සැලකිල්ලට ගෙන බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් දන්වා ඇත.

අයහපත් කාළගුණික තත්ත්වයත් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විශ්‍රාම යාමත් ව්‍යාපෘති කටයුතු මාස 05ක පමණ කාලයක් ප්‍රමාද වීමට හේතු වූ අතර ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීමට අදාල ලිපි ගොනුව මඟින් ඉදිරිපත් කොට ඇති බව දිස්ත්‍රික් ලේකම් මගින් දන්වා ඇත.

(ඉ) මෙම ව්‍යාපෘතියේ සියලු ඉංජිනේරුමය කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. ව්‍යාපෘතිය සම්බන්ධව ප්‍රමිතිය දිස්ත්‍රික් ලේකම් සහතික කිරීමෙන් පසු අදාල ගෙවීම් කටුයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය මුදල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතින් ලබා ගෙන ඇත.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) එකඟ වේ.

<u>අධ්‍යක්ෂ(මානව සම්පත් හා පරිපාලන) – 01</u>

මෙම තනතුර සඳහා බඳවා ගැනීමට 2016.09.25 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම මගින් අයදුම්පත් කැඳවන ලද අතර එහිදී අයදුම්පත් 24ක් ලැබුණි. එම අයදුම්පත් අතුරින් මෙම මධ්‍යස්ථානය සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන් නොසිටි බැවින් සම්මුඛ පරීක්ෂණය පවත්වා නොමැත. පසුව නැවත වරක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007ට අනුව කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ විශ්‍රාමික නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා 2017.08.05 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කළද ඒ සඳහා අයදුම්පත් ලැබී නොමැත. මෙම තනතුර සඳහා නැවත වතාවක් ප්‍රසිද්ධ දැන්වීම මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

<u>අධ්‍යක්ෂ(මුදල්) -01</u>

අධ්‍යක්ෂ(මුදල්) තනතුර සඳහා 2016.09.25 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම මගින් අයදුම්පත් කැඳවන ලදී.එහිදී අයදුම්පත් 12ක් ලැබී තිබූ අතර එම සියළුම අයුදම්කරුවන් සඳහා 2017.03.22 දින මෙම මධ්‍යස්ථානයේදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද අතර එහිදී සුදුසුකම්ලත් අයදුම්කරුවන් පෙනී සිට නොමැත. මෙම තනතුර සඳහා නැවත වතාවක් ප්‍රසිද්ධ දැන්වීම මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

<u>සහකාර අධ්‍යක්ෂ(අවම කිරීම) - 01</u>

සහකාර අධ්‍යක්ෂ(අවම කිරීම) තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වූ අතර ඉන් සුදුසු අයෙකු බඳවා ගැනීමට නොහැකි වූ බැවින් එම තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කර අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කරන ලද අතර ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් පසු නැවත වතාවක් 2017.10.29 දින ප්‍රසිද්ධ පුවත්පත්

දැන්වීම මගින් අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව මෙම තනතුර සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

සහකාර අධ්‍යක්ෂ(දිස්ත්‍රික්) - 01

මෙම තනතුර සඳහා 2017.08.04 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද අතර එහිදී ඉහළම ලකුණු ලබා ගත් අය 2017.10.02 දින සිට පත් කර ඇත.

පුද්ගලික සහකාර - 01

පුද්ගලික සහකාර තනතුර සඳහා 2016.09.25 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම අයදුම්පත් කැඳවා 2016.11.08 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඇත. එම සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලද අයදුම්කරුවන් 03 දෙනෙකු සඳහා 2017.02.03 දින නැවත දෙවන සම්මුඛ පරීක්ෂණයක්ද පවත්වන ලද අතර එහිදී සුදුසුකම්ලත් අයෙකු තෝරා ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව එම තනතුරේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යස්ථානය ගත් උත්සහාය අසාර්ථක වී ඇති බැවින් ඒ පිළිබඳව නැවත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කිරීමට අපේක්ෂිතය.

කළමනාකරණ සහකාර - 41

කළමනාකරණ සහකාර තනතුරු 41ක් සඳහා පත්වීම් ලිපි මේ වන විට නිකුත් කර ඇත.
රියදුරු තනතුරේ පුරප්පාඩු 04 සහ කාර්යාල සහායක තනතුරේ පුරප්පාඩු 25 සඳහා එම තනතුරුවලට අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් වන ආකාරයට ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

සේවා අවශ්‍යතාවය මත 2017.09.28 දින සිට රියදුරු තනතුරු 02ක් 2016.12.19 දින පැවැති සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත හා අන්තර්කාලීන කළමනාකරණ කමිටුව විසින් දෙන ලද අනුමැතිය පරිදි පොරොත්තු නාමලේඛණයෙන් පත් කර ඇත.

(ආ)

මෙම මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර අභ්‍යන්තර උසස් කිරීම් මඟින් පත් කරනු ලබන තනතුරු වන අතර ඒ සඳහා පිටතින් බඳවා ගැනීම් සිදු කළ නොහැක. බඳවා ගැනීම් පටිපාටිය අනුව ස්ථිර පදනමින් පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති කිසිදු අයෙකු මධ්‍යස්ථානය තුල නොමැති අතර ඒ සඳහා නිලධාරීන් සුදුසුකම් සපුරාලනු ලබන්නේ 2021 වසරේ ජුනි 30 දිනෙන් පසුව බැවින් නිත්‍ය පදනම මත පත් කිරීම කළ නොහැක. එබැවින් මෙම මධ්‍යස්ථානයේ කටයුතු අපහසුතාවයකින් තොරව පවත්වාගෙන යාම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ(පුර්ව දැනුම්දීම්), නියෝජ්‍ය අධ්‍යක්ෂ(හදිසි මෙහෙයුම්), නියෝජ්‍ය අධ්‍යක්ෂ(මානව සම්පත්) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්) යන තනතුරු සඳහා ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.5 වගන්තිය ප්‍රකාරව පත්කර ඇති අතර එම තනතුරුවල රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12.3 වගන්තිය ප්‍රකාරව දීමනාවක් ගෙවනු ලබයි. මෙම දීමනාව රාජකාරී ඉටු කිරීම සඳහා වන බැවින් ඒ අනුව එය වැඩ බැලීමේ දීමනාවෙන් 2/3ක් එනම් මූලික වැටුපෙන් 1/6ක දීමනාවක් වශයෙන් ගෙවීම් කරනු ලබයි. බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම තනතුරට ස්ථිර පදනමින් පත් කිරීමක් සිදු කළ නොහැකි බැවින් සහ ස්ථිර පදනමින් පත් කිරීමට බඳවා ගැනීමේ පටිපාටියේ ඇති කොන්දේසි අනුව නොහැකි වන බැවින් සේවා අවශ්‍යතාවය අනුව තවදුරටත් රාජකාරී ඉටු කිරීමේ පදනමින් එම තනතුරු පවත්වාගෙන යනු ලබයි.